# දෙවැනි කොටස

# ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

**පටුන**


| | |
|---|---|
| ගිණුම් සහ බැංකු කටයුතු | (I) |
| ව්‍යවහාර මුදල් නිකුතුව | (VII) |
| බැංකු සංවර්ධන | (VII) |
| ප්‍රාදේශීය කාර්යාල | (VIII) |
| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු | (X) |
| බැංකු අධීක්ෂණ | (XI) |
| බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය | (XIV) |
| මූල්‍ය වෙළෙඳපොළ දෙපාර්තමේන්තුව | (XVI) |
| සංවර්ධන මුදල් | (XIX) |
| ග්‍රාමීය ණය | (XXIII) |
| බැංකු අධ්‍යයන කේන්ද්‍රය | (XXIX) |
| සේවක අර්ථසාධක අරමුදල | (XXXI) |
| විනිමය පාලන | (XXXII) |
| රාජ්‍ය ණය | (XXXIII) |
| ලේකම් දෙපාර්තමේන්තුව | (XL) |
| ප්‍රවෘත්ති හා ප්‍රකාශන | (XLI) |
| පර්යේෂණ කටයුතු | (XLII) |
| සංඛ්‍යාන හා ක්ෂේත්‍ර සමීක්ෂණ | (XLIII) |
| තොරතුරු තාක්ෂණ | (XLV) |
| පුහුණු වැඩ කටයුතු | (XLVI) |
| කළමණාකාරිත්ව විගණන | (XLVII) |
| පරිශ්‍ර | (XLVII) |
| නව ගොඩනැගිලි | (XLVII) |
| සුභසාධන | (XLVIII) |
| ආරක්ෂක සේවා | (XLVIII) |
| කාර්ය මණ්ඩල පුවත් | (XLIX) |

# ගිණුම් සහ බැංකු කටයුතු

## ගිණුම්

1998 වර්ෂය අවසානය වනවිට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු වත්කම්/බැරකම් ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 188,673 ක් වූ අතර එය පසුගිය වර්ෂයට වඩා සියයට 2.6 ක වැඩි වීමක් ලෙස වාර්තා විය. ඉකුත් වර්ෂ වලදී මෙන්ම ජාත්‍යන්තර සංචිත විශාලතම වත්කම් කාණ්ඩය වූ අතර, මුළු වත්කම්වලට එහි දායකත්වය 1997 වර්ෂය අවසානයේ (රු.ද.ල. 118,965) සියයට 64.7 හා සසඳන විට 1998 වර්ෂයේදී (රු.ද.ල. 127,174) සියයට 67.4 ක් විය. මෙය පසුගිය වර්ෂයට වඩා සියයට 6.9 ක පමණ වැඩි වීමකි. "එයාර් ලංකා" (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 45) සහ "ඔරියන්ට් ලංකා" (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 11.5) පුද්ගලීකරණය තුලින් ලද ලැබීම් සහ ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව සහ රජය විසින් විකුණන ලද විදේශ විනිමය පිළිවෙලින් එ.ජ. ඩොලර් ද.ල. 65 හා එ.ජ. ඩොලර් දශ ලක්ෂ 100 ප්‍රමාණය මෙම වැඩි වීමට ප්‍රධාන හේතූන් විය. ශ්‍රී ලංකා රුපියලෙහි අගය සියයට 9.6 කින් පහත වැටීමද, වත්කම්හි රුපියල් අගය වැඩිවීමට හේතුවිය. දේශීය වත්කම් ද 1997 වර්ෂයේදී රුපියල් දශ ලක්‍ෂ 38,134 සිට 1998 වර්ෂයේදී රුපියල් දශ ලක්‍ෂ 40,465 දක්වා සියයට 6.1 ක වැඩි වීමක් දක්නට ලැබුණු අතර, ඒ සඳහා හේතු වූයේ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් දැරීම් වැඩි වීමත්, රජයට දෙන ලද ණය සහ අත්තිකාරම්හි (ප්‍රධාන වශයෙන් වක්‍රීය ණය පහසුකම්) වැඩි වීමත්ය. මේ අතර ප්‍රධාන වශයෙන් ණය ආපසු ගෙවීම් සහ අක්‍රීය ණය සඳහා වූ ප්‍රතිපාදන හේතුකොටගෙන වාණිජ බැංකු හා අනෙකුත් ණය දෙන ආයතනවලට දෙන ලද මධ්‍යම හා දිගුකාලීන ණය පහසුකම් සියයට 33.7 කින් අඩු විය. එමෙන්ම වාණිජ බැංකුවලට දෙන ලද කෙටිකාලීන අත්තිකාරම් ද 1998[1] වර්ෂයේදී සියයට 34.5 කින් අඩු විය.

බැරකම් අංශයෙහි, සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් රුපියල් දශ ලක්‍ෂ 53,135 සිට රුපියල් දශ ලක්‍ෂ 60,087 දක්වා සියයට 13.1 කින් ඉහළ ගියේය. තැන්පතු, බැරකම් අංශයේ විශාලතම කාණ්ඩය වූ අතර, එය වසර තුල බැංකුවේ මුළු බැරකම් වලින් සියයට 35.1 ක් විය. මෙම කාණ්ඩය තුල රජයේ තැන්පතු සියයට 52.0 කින් පහළ ගිය අතර ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය යටතේ තැන්පතු වගකීම් වෙනුවෙන් වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන තැන්පතු සියයට 7.2 කින් වැඩි විය. ජාත්‍යන්තර සංවිධාන, විදේශ රාජ්‍ය සහ විදේශීය බැංකු ආයතනවල තැන්පතු සියයට 6.4 කින් අඩු විය. බැංකුවේ වත්කම් හා බැරකම්වල ප්‍රධාන අංශ සැසඳීමක් II - 2 සංඛ්‍යා සටහනෙහි දක්වේ.

[1] 1998 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂයේ ලාභාලාභ ගිණුම සමඟ 1998 දෙසැම්බර් 31 දිනට මහ බැංකුවේ ශේෂ පත්‍රය සටහනේ වගු අංක. II - I හි දක්වේ.

1997 වර්ෂයේ රුපියල් දශ ලක්‍ෂ 19,498 හා සසඳන කල 1998 වර්ෂය සඳහා බැංකුවේ මුළු දළ ආදායම රුපියල් දශ ලක්‍ෂ 17,897 ක් වූ අතර, පෙර වර්ෂයේ රුපියල් දශ ලක්‍ෂ 16,848 දළ වියදම හා සසඳන කල 1998 වර්ෂයේ මුළු දළ වියදම රුපියල් දශ ලක්‍ෂ 14,897 ක් විය. බැංකුවේ ආදායමෙන් සියයට 78 ක් පමණ විදේශීය සංචිත ආයෝජනයෙන් ජනනය වූ අතර දේශීය ගණුදෙණු වලින් උපයන ලද පොලී ආදායමෙහි දායකත්වය සියයට 22 ක් විය. වියදම් සංචිත ගිණුම් සඳහා වෙන් කිරීම් හා ක්‍ෂයවීම් සඳහා වෙන් කිරීම් සහ අනෙකුත් අය කිරීම් වෙනුවෙන් හා අක්‍රීය ණය වෙනුවෙන් ප්‍රතිපාදන ද වෙන් කළ පසු ශේෂ වූ ශුද්ධ ලාභය වන රුපියල් දශ ලක්‍ෂ 3,000 මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර රජය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නොපියවා ඇති වගකීම් කොටසක් පියවීමට හෝ රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා වෙන් කරන ලදී.

## ගණකාධිකරණ ප්‍රතිපත්ති

**පොදු :**

ඓතිහාසික පිරිවැය පදනම මත හා පොදුවේ පිළිගැණුනු ගණකාධිකරණ මූලධර්මයන්ට අනුකූලව මේ සමඟ ඇති ශේෂ පත්‍රය හා ලාභාලාභ ගිණුම පිළියෙල කර ඇත.

## විදේශීය ව්‍යවහාර මුදල් පරිවර්තනය

විදේශීය ව්‍යවහාර මුදල් වලින් පවත්වාගෙන යනු ලබන වත්කම් හා බැරකම් ශේෂ පත්‍ර දිනට බලපැවැත්වුනු මධ්‍ය විනිමය අනුපාතිකයට අනුව පරිවර්තනය කර ඇත.

## ආයෝජන

සියලුම ආයෝජන පිරිවැය අනුව ගණනය කර ඇත.

## අත්තිකාරම්

ශේෂ පත්‍රයෙහි පෙන්වා ඇති අත්තිකාරම් මූල්‍ය සමාගම් වලින් අය විය යුතුව ඇති අක්‍රීය ණය වෙනුවෙන් පහත සඳහන් පදනම මත ප්‍රතිපාදන වෙන් කිරීමෙන් එන ශුද්ධ ශේෂය වේ.

| කල් ඉකුත් වූ ණය | නොපියවා ඇති ප්‍රමාණයේ ප්‍රතිශතය |
|---|---|
| (අ) මාස 6-12 | 20 |
| (ආ) මාස 12-18 | 50 |
| (ඇ) මාස 18 ට වැඩි | 100 |

## ස්ථාවර වත්කම්

ස්ථාවර වත්කම් දක්වා ඇත්තේ ඒවායේ පිරිවැය වටිනාකමෙන් ක්‍ෂය වීම් අඩු කිරීමෙනි. පහත දක්වෙන අනුපාතිකයනට අනුකූලව හීන වන ශේෂ ක්‍රමය යටතේ ක්‍ෂය කිරීම් ගිණුම්ගත කර ඇත.

## II - 1 සංඛ්‍යා සටහන
## ශ්‍රී ලංකා මහ බැංකුව
## 1998 දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂ පත්‍රය

රුපියල්

### බැ ර ක ම්

| 1997 දෙසැම්බර් මස 31 දින | | | 1998 දෙසැම්බර් මස 31 දින | |
|---|---|---|---|---|
| | | **ප්‍රාග්ධන ගිණුම** | | |
| 1,50,00,000 | | ප්‍රාග්ධනය | 1,50,00,000 | |
| 98,50,00,000 | 100,00,00,000 | අතිරික්තය | 98,50,00,000 | 100,00,00,000 |
| | | **සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල්** | | |
| 5,107,15,78,291 | | නෝට්ටු | 5,777,09,36,107 | |
| 206,31,45,589 | 5,313,47,23,880 | කාසි | 231,58,83,092 | 6,008,68,19,199 |
| | | **තැන්පතු** | | |
| 647,55,79,334 | | රජය | 310,84,59,238 | |
| 6,37,21,050 | | රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන | 3,11,80,173 | |
| 3,053,70,80,462 | | වෙළෙඳ බැංකු | 3,274,79,01,779 | |
| 3,170,81,12,019 | | ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන | 2,967,83,06,986 | |
| 7,67,052 | | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු. 5,56,25,200/- හැර අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල | 18,36,362 | |
| 78,74,46,444 | 6,957,27,06,361 | අනෙකුත් | 60,18,26,176 | 6,616,95,10,714 |
| | 492,50,00,000 | මධ්‍යම හා දීර්ඝකාලීන ණය අරමුදල | | 492,50,00,000 |
| | 56,01,25,000 | ප්‍රාග්ධන දයක දීමනා ගිණුම් | | 56,01,12,500 |
| | 1,00,00,000 | ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් | | 0 |
| | 5,169,28,99,756 | අනෙකුත් වගකීම් හා ගිණුම් | | 5,593,16,48,947 |
| | 18,389,54,54,997 | | | 18,867,30,91,360 |

### ව ත් ක ම්

| 1997 දෙසැම්බර් මස 31 දින | | | 1998 දෙසැම්බර් මස 31 දින | |
|---|---|---|---|---|
| | | **ජාත්‍යන්තර සංචිතය** | | |
| 5,187,99,14,247 | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂ | 5,938,12,77,514 | |
| 6,706,03,76,347* | | විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් | 6,771,67,13,296* | |
| 2,48,39,227 | 11,896,51,29,821 | විශේෂ ආපසු ගැනීම් හිමිකම් | 7,60,10,468 | 12,717,40,01,278 |
| | | **දේශීය වත්කම්** | | |
| 2,866,01,99,947 | | ණය සහ අත්තිකාරම් රජයට | 3,054,50,99,947 | |
| 165,64,83,253 | | අනෙකුත් අයට-මධ්‍යම හා දීර්ඝකාලීන | 109,82,94,677** | |
| 3,54,29,989 | | කෙටිකාලීන | 2,32,00,000 | |
| 722,18,63,844 | | රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් | 823,83,76,231 | |
| 56,01,25,000 | 3,813,41,02,033 | මූල්‍ය සහ අනෙකුත් ආයතනවලට දයක දීමනා | 56,01,12,500 | 4,046,50,83,355 |
| | 2,679,62,23,143 | අනෙකුත් වත්කම් හා ගිණුම් | | 2,103,40,06,727 |
| | 18,389,54,54,997 | | | 18,867,30,91,360 |

*1964 පෙබරවාරි මස 01 වැනි දින රු. 5,5,27,675/- ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 දින රු. 57,450/- ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතනවලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙලින් රු. 2,9,33,697/- ක් සහ රු. 34,340/- ක් විය.

**පියවිය යුතුව ඇති ණය ප්‍රමාණයෙන් අයකරගත නොහැකි ණය සඳහා රු. 1,923,409,224/- ක ප්‍රතිපාදන අඩුකර ඇත.

## 1998 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභාලාභ ගිණුම

රුපියල්

| 1997 | | 1998 | 1997 | | 1998 |
|---|---|---|---|---|---|
| 1,684,83,61,963 | සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා ඉඩම් සහ ගොඩනැගිලි හා කාර්යාලය උපකරණ සඳහා ක්ෂය කිරීම ඇතුළුව) සහ මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර කරන ලද වෙන් කිරීම් | 1,489,71,53,928 | 1,949,83,61,963 | පොලී ආදිය | 1,789,71,53,928 |
| | <u>**වර්ෂයේ ශුද්ධ ලාභය**</u> | | | | |
| 265,00,00,000 | මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තිය අනුව ඒකාබද්ධ අරමුදලට බැර කිරීම | 300,00,00,000 | | | |
| 1,949,83,61,963 | | 1,789,71,53,928 | 1,949,83,61,963 | | 1,789,71,53,928 |

ඒ.එස්.ජයවර්ධන
අධිපති.

එම්.බී දිසානායක
ප්‍රධාන ගණකාධිකාරී.

### විගණකාධිපති සටහන

ශ්‍රී ලංකා මහ බැංකුවේ 1998 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 42(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

එකී මුදල් නීති පනතේ 42(2) වගන්තිය ප්‍රකාර මුදල් අමාත්‍යවරිය වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කෙරෙනු ඇත.

1999 අප්‍රේල් මස 15 දින.
කොළඹ 7. විගණකාධිපති දෙපාර්තමේන්තුවේදී ය.

එස්.එම්.සබ්රි.
විගණකාධිපති.

### II - 2 සංඛ්‍යා සටහන
### 1997 සහ 1998 මුදල් වර්ෂවල අවසාන දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්කම් හා බැරකම්වල වූ ප්‍රධාන අයිතමයන් සැසඳීම

**බැරකම්**

| අයිතමය | 1997 අවසානයේදී රුපියල් දශලක්ෂ | % | 1998 අවසානයේදී රුපියල් දශලක්ෂ | % |
|---|---|---|---|---|
| ප්‍රාග්ධනය සහ අතිරික්තය | 1,000 | 0.5 | 1.000 | 0.5 |
| සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් | 53,135 | 28.9 | 60,087 | 31.9 |
| තැන්පතු | 69,572 | 37.8 | 66,169 | 35.1 |
| මධ්‍යම හා දිගුකාලීන අරමුදල | 4,925 | 2.7 | 4,925 | 2.6 |
| ප්‍රාග්ධන දායක දීමනා ගිණුම | 560 | 0.3 | 560 | 0.3 |
| ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් | 10 | - | 0 | - |
| අනෙකුත් බැරකම් | 54,693 | 29.8 | 55,932 | 29.6 |
| නිකුත් කරන ලද ඇපකර | 13.050 | 7.1 | 3,502 | 1.8 |
| පාලන ගිණුම් සංචිත | 18,553 | 10.1 | 22,559 | 12.0 |
| විශේෂ හැර ගැනීම් හිමිකම් ලැබීම් | 5,680 | 3.1 | 6,051 | 3.2 |
| ජාත්‍යන්තර සංචිත ප්‍රත්‍යා ගණනය ගිණුම | 723 | 0.4 | 7,262 | 3.8 |
| ලාභාලාභ ගිණුම | 6,171 | 3.3 | 5,102 | 2.7 |
| ආසියානු නිෂ්කාශන සංගම් ගිණුම | 6,543 | 3.6 | 6.247 | 3.3 |
| අනෙකුත් | 3,973 | 2.2 | 5.209 | 2.8 |
| **එකතුව** | **183,895** | **100.0** | **188,673** | **100.0** |

**වත්කම්**

| අයිතමය | 1997 අවසානයේදී රුපියල් දශලක්ෂ | % | 1998 අවසානයේදී රුපියල් දශලක්ෂ | % |
|---|---|---|---|---|
| ජාත්‍යන්තර සංචිතය | 118.965 | 64.7 | 127.174 | 67.4 |
| දේශීය වත්කම් | 38.134 | 20.7 | 40,465 | 21.4 |
| අනෙකුත් වත්කම් | 26,796 | 14.6 | 21,034 | 11.2 |
| නිකුත් කරන ලද ඇපකර වෙනුවෙන් තැන්පත්කරුවන්ගේ වගකීම | 13,050 | 7.1 | 3,502 | 1.9 |
| වෙළඳ බැංකුවල විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ගිණුම | 2,471 | 1.3 | 3,993 | 2.1 |
| ගැලපීම් ගිණුම (ලැබිය යුතු මුදල්) | 2,027 | 1.1 | 2,137 | 1.1 |
| එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂ | 660 | 0.4 | - | - |
| අනෙකුත් | 8,588 | 4.7 | 11,402 | 6.1 |
| **එකතුව** | **183,895** | **100.0** | **188,673** | **100.0** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

| **අයිතමය** | **ප්‍රතිශතය** |
|---|---|
| ගොඩනැගිලි | 2 |
| සවි කිරීම් සහ උපකරණ | 10 |
| කාර්යාලයීය ලී බඩු සහ උපකරණ | 10 |
| මෝටර් රථ | 10 |
| ස්වයංක්‍රීය කුඩා උපකරණ | 20 |
| AS/400 ප්‍රධාන පරිඝණක | 20 |
| පරිඝණක හා පරිඝණක උපකරණ | 25 |
| පුස්තකාල පොත් | 33 1/3 |

වර්ෂය තුලදී මිළදී ගන්නා ලද ස්ථාවර වත්කම් වෙනුවෙන් සම්පූර්ණ වර්ෂයටම ක්ෂය සඳහා ප්‍රතිපාදනය කරනු ලබන අතර, වර්ෂය තුලදී ස්ථාවර වත්කම් විකුණනු ලබන හෝ ඉවත් කරනු ලබන අවස්ථාවන්හි එකී වත්කම් සඳහා එම වර්ෂය වෙනුවෙන් ක්ෂය සඳහා ප්‍රතිපාදනයන් සළසා නැත.

### තොග

ලිපි ද්‍රව්‍ය හා ඉංජිනේරු ගබඩා අයිතම වෙනුවෙන් වර්ෂය තුලදී දරණු ලැබූ සම්පූර්ණ පිරිවැය ලාභාලාභ ගිණුමට හර කර ඇති අතර, වර්ෂය අවසානයේ ඇති තොග සම්බන්ධයෙන් ගැලපීම් සිදු කර නොමැත.

### අයහාර ගණනය

මුදල් පදනමක් මත ගණනය කර ඇති අක්‍රීය ණය වෙනුවෙන් වූ පොළී හැරුණු විට අනෙකුත් පොළී හා ආදායම් උපචිත පදනමක් මත පොත්වල සටහන් කර ඇත.

### ශුද්ධ ලාභය

ලාභාලාභ ගිණුමෙහි පෙන්වා ඇති ශුද්ධ ලාභය සියළුම වියදම් හර කිරීමෙන් හා පහත සඳහන් අයිතම සඳහා ප්‍රතිපාදන සැළසීමෙන් අනතුරුව වේ.

i. අක්‍රීය ණය සඳහා වෙන් කිරීම්.
ii. ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වෙන් කිරීම්.
iii. අනෙකුත් අවශ්‍ය වෙන් කිරීම් සහ මුදල් නීති පණතේ 38 වන වගන්තිය අනුව සංචිත සඳහා වෙන් කිරීම්.

## බැංකු කටයුතු

### විදේශ විනිමය කටයුතු :-
### ජාත්‍යන්තර සංචිත ආයෝජනය

ශ්‍රී ලංකා මහ බැංකුව වාණිජ බැංකු සමග ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලරයට සම්බන්ධ ඉදිරි විනිමය මිලට ගැනීම් සහ එතැන් ගැණුම් හා විකුණුම් මගින් විදේශ විනිමය ගණුදෙනු කටයුතු දිගටම කරගෙන යන ලදී.

1998 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව වාණිජ බැංකු වලින් මිලදී ගත් විදේශ මුදල් ප්‍රමාණයේ මුළු රුපියල් වටිනාකම රුපියල් දශ ලක්ෂ 3,845 ක් වූ අතර වාණිජ බැංකුවලට අලෙවි කරන ලද විදේශ මුදල් වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 13,695 ක් විය (වගුව II-3). 1997 වර්ෂයේ දී එකී මිලදී ගැණුම් හා විකුණුම් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 8,118 ක් හා රුපියල් දශ ලක්ෂ 9,163 ක් විය.

මහ බැංකුව සිය විදේශීය විනිමය සංචිත ජාත්‍යන්තර මුදල් සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ වල ආයෝජනය කිරීම තවදුරටත් කරගෙන යන ලදි. ප්‍රධාන මුදල් වර්ග හයකින් සමන්විත විදේශීය විනිමය සංචිත ප්‍රාග්ධන වෙළෙඳපොළ ස්ථාවර ආදයම් වත්කම්හිද විශේෂ හැර ගැණුම් සහ රන් ඇතුළත් මුදල් වර්ග නවයකින් සමන්විත වූ විදේශීය විනිමය සංචිත කෙටිකාලීන මුදල් වෙළෙඳපොළෙහිද ආයෝජනය කරන ලදී.

1998 අවසාන වනවිට ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි වූ සංචිත ප්‍රමාණය සියයට 53.2 ක් පමණ ද සියයට 42.3 ක් මුදල් වෙළෙඳපොළෙහිද, ශේෂය රන් සහ විශේෂ හැර ගැණුම්හිද විය.

**II - 3 සංඛ්‍යා සටහන**

**වාණිජ බැංකු සමග කළ විදේශීය විනිමය ගණුදෙනු - 1998**

**(දහස් ගණනින්)**

| මාසය | මිලදී ගැනීම් | | විකුණුම් | |
|---|---|---|---|---|
| | එ.ජ.ඩොලර් | ශ්‍රී ලංකා රුපියල් | එ.ජ.ඩොලර් | ශ්‍රී ලංකා රුපියල් |
| ජනවාරි | - | - | 75,380 | 4,635,083 |
| පෙබරවාරි | 75 | 4,625 | 14,225 | 877,256 |
| මාර්තු | 31,000 | 1,930,830 | - | - |
| අප්‍රේල් | 23,000 | 1,448,373 | - | - |
| මැයි | - | - | 49,185 | 3,148,664 |
| ජූනි | - | - | 12,650 | 819,151 |
| ජූලි | - | - | 14,475 | 940,535 |
| අගෝස්තු | - | - | 5,400 | 355,682 |
| සැප්තැම්බර් | - | - | - | - |
| ඔක්තෝබර් | 7,000 | 462,994 | - | - |
| නොවැම්බර් | - | - | 29,590 | 1,982,199 |
| දෙසැම්බර් | - | - | 13,875 | 936,854 |
| **එකතුව** | **61,075** | **3,846,822** | **214,780** | **13,695,424** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

# විවෘත වෙළෙඳපොළ කටයුතු

## ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ :-

ඉකුත් වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 19,442 හා සැසඳීමේදී 1998 වර්ෂය තුල මහ බැංකුවේ ද්විතීයික වෙළෙඳපොළ තුල විකුණු (වට්ටම් කළ) භාණ්ඩාගාර බිල්පත්හි වටිනාකම රුපියල් දශ ලක්ෂ 11,934 ක් විය. එක්දින භාණ්ඩාගාර බිල්පත් ප්‍රති මිළදී ගැනීම් වෙළෙඳපොළෙහි රුපියල් දශ ලක්ෂ 728,757 ක තරම් වූ ඉහළ මට්ටමේ ආයෝජන භාණ්ඩාගාර බිල්පත්හි විකුණුම්වල අඩු වීමට ප්‍රධාන හේතුව විය. වර්ෂය තුළ ඉහළ මට්ටමක පැවති ද්‍රවශීලතාවය හේතුවෙන් භාණ්ඩාගාර බිල්පත් මිළදී ගැනීම් (ප්‍රති-වට්ටම් කිරීම්) ද 1997 රුපියල් දශ ලක්ෂ 17,337 සිට 1998 වසර තුල රුපියල් දශ ලක්ෂ 14,969 දක්වා සැළකිය යුතු මට්ටමකින් අඩු විය.

1998 වර්ෂය තුළ මහ බැංකුවේ ද්විතිය වෙළෙඳපොළේ ඵලද අනුපාතිකවල වෙනස්වීම භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළෙඳපොළේ ඵලද අනුපාතිකවල උපනතිය අනුව යාමක් දිස් විණි. මහ බැංකු ද්විතියික වෙළෙඳපොළ තෙමස් භාණ්ඩාගාර බිල්පත්වල ඵලද අනුපාතික 1998 වර්ෂය මුලදී තිබූ සියයට 9.72 සිට වර්ෂය අග වනවිට සියයට 11.86 දක්වා මඳ වශයෙන් වැඩි විය. එම කාලය තුළදීම හයමාසික සහ එක් අවුරුදු භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ එම අනුපාතික පිළිවෙලින් සියයට 9.70 සහ 9.99 සිට සියයට 12.19 හා 12.39 දක්වා වැඩි විය.

## භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ ද්විතීයික වෙළෙඳපොළ :-

1998 මැයි 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකුව විසින් එහි ද්විතීය කවුළු ගණුදෙණු වන ද්විතීයික වෙළෙඳපොළ මිලදී ගැනීම් විකිනීම් හා ප්‍රතිමිලදී ගැනීම් සඳහා සුදුසුකම් ලත් මූල්‍ය උපකරණයක් ලෙස භාණ්ඩාගාර බැඳුම්කර ඇතුළත් කර ගන්නා ලදී. කෙසේ වුවද සළකා බලන වර්ෂය තුළදී භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් ද්විතීය වෙළෙඳපොළේ එවැනි මිළදී ගැනීම් හෝ විකුණුම් සිදු නොවිණ.

## ප්‍රති මිලදී ගැනීම් වෙළෙඳපොළ :-

1993 ඔක්තෝබර් මස දී මහ බැංකුව විසින් හඳුන්වා දෙනු ලැබූ ප්‍රති මිලදී ගැනීම් ශිවිසුම් යටතේ භාණ්ඩාගාර බිල්පත් අලෙවිය 1998 වර්ෂය තුලද අඛණ්ඩව ක්‍රියාත්මක විය. ප්‍රති මිලදී ගැනීම් අනුපාතිකය මහ බැංකුව විසින් දෛනිකව තීරණය කරනු ලබන අතර, ඒ සඳහා ප්‍රාථමික සහ ද්විතියික වෙළෙඳපොළ පොළී අනුපාතික, ඒක්ෂණ වෙළෙඳපොළ පොළී අනුපාතික සහ ද්‍රවශීලතාවය, පවතින ආර්ථික වාතාවරණයන් සහ මූල්‍ය ප්‍රතිපත්ති කාරකයන් (සිද්ධාන්තයන්) යන සාධක සැළකිල්ලට ගැනේ.

වර්ෂය ආරම්භයේදී සියයට 11 ක්ව පැවති එක් දින ප්‍රති මිලදී ගැනීම් අනුපාතිකය සමපේක්ෂණ විදේශ විනිමය මිලදී ගැනීම ජූනි මස ආරම්භය පමණ වනවිට අධෛර්ය කිරීමේ අරමුණින් ක්‍රමයෙන් සියයට 12.25 දක්වා ඉහළ දමන ලදී. කෙසේ වුවද, වර්ෂය අවසානය වනවිට මෙම අනුපාතිකය සියයට 11.25 දක්වා ක්‍රමයෙන් පහළ දමන ලදී. වසර අවසන් කාලය තුල විනිමය වෙළෙඳපොළේ වූ දැඩි ස්ථායිතාවය, උද්ධමන අනුපාතිකයේ දිගින් දිගටම වූ පහළ යාම සහ ජාත්‍යන්තර පොළී අනුපාතිකවල අඩු වීම ප්‍රති මිලදී ගැනීම් අනුපාතික පහළ මට්ටමක පවත්වා ගැනීමට හේතුවිය.

වාණිජ බැංකුවල ප්‍රති මිළ ආයෝජනයේ සැළකිය යුතු ප්‍රසාරණාත්මක බව පෙන්නුම් කරමින් වර්ෂය තුල ප්‍රති මිළදී ගැනීමේ ශිවිසුම යටතේ අලෙවි කරන ලද මුළු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 1997 රුපියල් දශ ලක්ෂ 449,589 සිට 1998 වසරේ රුපියල් දශ ලක්ෂ 728,757 දක්වා සියයට 62 ක් තරම් වූ ඉහළ වාර්තාගත අගයකින් වැඩි විය. මෙයට විශේෂයෙන් හේතු වූයේ වර්ෂයේ අවසන් කාර්තුව

තුළ වෙළෙඳපොළේ ඉහළ අතිරික්ත රුපියල් ද්‍රවශීලතා හේතුවෙන් වාණිජ බැංකු මිලදී ගැණුම් වැඩිවීමයි. එ.ජ.ඩොලර් දශ ලක්ෂ 165 ක් පමණ වූ මහ බැංකුවේ ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම, වෙළෙඳපොළේ සාපේක්ෂව ජනනය වූ ඉහළ අතිරික්ත ද්‍රවශීලතා මට්ටමට හේතුවිය.

## ප්‍රති විකුණුම් ගිවිසුම් :-

වෙළෙඳපොළ තුළ දැඩි ද්‍රවශීලතා හිඟ තත්ත්වයන් පවතින අවස්ථාවන්හිදී අරමුදල් සැපයීම් තුළින් කෙටිකාලීන පොලී අනුපාතික ඉලක්ක කරගත් මට්ටමක ස්ථායී කර ගැනීම සඳහා විවෘත වෙළෙඳපොළ කටයුතුවල කොටසක් හැටියට ප්‍රති විකුණුම් පහසුකම 1998 නොවැම්බර් මස නැවත ක්‍රියාත්මක කරන ලදී. බැංකුව සමග ඇතිකරගනු ලබන ප්‍රති විකුණුම් ගණුදෙනු සඳහා සුදුසුකම් ලත් මූල්‍ය උපකරණ ලෙස භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සැළකේ.

මෙම පහසුකම යටතේ ඉදිරි නිශ්චිත දිනක නිශ්චිත වූ මිලකට ආපසු විකිනීමේ ගිවිසුමකට යටත්ව, මහ බැංකුව විසින් වාණිජ බැංකු සහ බැංකු නොවන ප්‍රාථමික වෙළෙඳුන්ගෙන් බැංකුව විසින් තීරණය කරන ලද මිළකට භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර මිළදී ගනු ලබයි. මූලාරම්භයේදී ප්‍රති විකුණුම් පහසුකම ලබා ගත හැකි වනුයේ එක් දින අරමුදල්කරණයන් සඳහා පමණක් වන අතර, ප්‍රති විකුණුම් ගණුදෙනු වටිනාකම සඳහා උපරිම සීමාවක් පනවා නැත.

මෙම පහසුකම හඳුන්වා දීමත් සමග හා දනට පවත්නා ප්‍රති මිළදී ගැනීම් පහසුකම නිසා ඒකෂණ මූල්‍ය අනුපාතිකයන්හි වඩාත් ස්ථායිතතාවක් වාර්තා විය.

1998 දෙසැම්බර් මාසය තුළ බැංකුව අවස්ථා දෙකක් තුළ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ප්‍රති විකුණුම් ගණුදෙනුවල යෙදුනු අතර සියයට 15.45 අනුපාතිකයක් යටතේ එක් දින පදනම් මත රුපියල් දශ ලක්ෂ 1065 ක් වෙළඳපොළට නිකුත් කර ඇත.

## මහ බැංකු පොලී අනුපාතිකය :-

මුදල් නීති පනතේ 87 වන වගන්තිය යටතේ වාණිජ බැංකුවලට දෙනු ලබන කෙටිකාලීන අත්තිකාරම් සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 17 ක් වශයෙන් නොවෙනස්ව පැවැතිණි.

## කෙටිකාලීන ණය :-

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය හා අපනයන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ වාණිජ බැංකු හා ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍ර.ග්‍රා.සං.බැං.) වෙත ලබා දුන් ප්‍රතිමූල්‍ය ණය පිළිවෙලින් 1994 අප්‍රේල් සහ මැයි මාසවල සිට නවතා දමන ලදී. එසේ වුවද, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය නවතා දැමීමට පෙර වාණිජ බැංකු විසින් එම ක්‍රමය යටතේ ගොවීන්ට දුන් චක්‍රීය ණය ප්‍රමාණයට පමණක් ප්‍රතිමූල්‍ය දීර්ඝ කිරීමේ පහසුකම් ප්‍රදානය කරන ලදී. මෙම පහසුකම යටතේ 1997 වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 35.4 ක් නොපියවා පැවැති ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය 1998 වර්ෂය අවසානයේ රුපියල් දශ ලක්ෂ 23.2 ක් විය.

## මැදි හා දිගුකාලීන ණය :-

1998 වර්ෂය තුලදී මැදි හා දිගුකාලීන ණය අරමුදල රුපියල් දශ ලක්ෂ 4,925 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. 1998 කාලය තුලදී මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය මුදල් මුද හැරීමක් නොවූ අතර මෙම වසර තුලදී ආපසු ගෙවන ලද ණය මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 181.8 ක්ව පැවතුණි.

## මූල්‍ය සමාගම් සඳහා පහසුකම් :-

1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පණත යටතේ මූල්‍ය සමාගම් සඳහා පහසුකම් සැපැයීමක් 1998 වර්ෂය තුල නොවීය. 1998 වර්ෂය අවසානය වනවිට මෙම ණය පහසුකම් යටතේ බොල් ණය ප්‍රතිපාදනවලට පෙර නොපියවා පැවැති මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,583.9 ක් විය.

## සංචිත අවශ්‍යතා :-

වාණිජ බැංකු විසින් තැන්පතු වගකීම් වෙනුවෙන් පවත්වාගත යුතු ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 1998 වසර තුල නොවෙනස්ව පැවතිණි. රුපියල් තැන්පතු සඳහා අදළ සංචිත අනුපාතය සියයට 12 ක් විය. වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනය කර ඇති විදේශ මුදල් තැන්පතු සඳහා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අදළ නොවූ අතර, විදේශ මුදලින් වූ අනෙකුත් සියළුම තැන්පතු සඳහා එය සියයට 12 ක් විය.

## ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයට අදළ නොවන අපනයනකරුවන් සඳහා වූ විදේශ ව්‍යවහාර මුදල් ණය පහසුකම් :-

ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය යටතට අයත් නොවන නිර්යාතකරුවන්ට විදේශීය ව්‍යවහාර මුදලින් ණය ලබා දීම සඳහා 1997 හඳුන්වා දුන් මෙම යෝජනා ක්‍රමය 1998 වර්ෂය පුරාද ක්‍රියාත්මක විය. මෙම යෝජනා ක්‍රමය යටතේ තම දේශීය බැංකු ඒකක සහ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් විදේශීය ව්‍යවහාර මුදලින් ණය පහසුකම් ප්‍රදානය කිරීමට වාණිජ බැංකුවලට බලතල ලබා දී ඇත. යෝජනා ක්‍රමය ආරම්භයේදී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 100 ක්, විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් ලබා දීමට වාණිජ බැංකුවලට උපදෙස් ලබා දී තිබූ අතර, එය බැංකුවල ප්‍රාග්ධන අරමුදල් පදනම මත බෙද හරින ලදී. 1998 වර්ෂය තුළ මෙම ප්‍රමාණය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 104 දක්වා වැඩි විය.

1997 වර්ෂයේ ප්‍රදානය කළ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 253 හා සංසන්දනාත්මකව බලන කල යෝජනා ක්‍රමය යටතේ දේශීය බැංකු ඒකක හා විදේශීය මුදල් බැංකු ඒකක මගින් 1998 වර්ෂය තුල ප්‍රදානය කරන ලද මුළු ණය ප්‍රමාණය

II - 4 සංඛ්‍යා සටහන

**ආයෝජන ප්‍රවර්ධන කලාපයට අදාළ නොවන නිර්යාතකරුවන්ට ප්‍රදානය කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ණය**

(එ.ජ.ඩොලර් දශලක්ෂ)

| කාලපරිච්ඡේදය | එක් වසරකට අඩු ණයදීම් | | එක් වසරකට වැඩි ණයදීම් | | එකතුව | | මුළු එකතුව | සාමාන්‍ය අනුපාතික | පොළී පරාසය | අයවිය යුතු ණය (වසර අගදී) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේශීය බැංකු ඒකක | විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක | දේශීය බැංකු ඒකක | විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක | දේශීය බැංකු ඒකක | විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක | | අවම % | උපරිම % | |
| 1997 | 241.61 | 8.70 | 2.83 | 0.10 | 244.44 | 8.80 | 253.25 | 6.50 | 10.50 | 70.66 |
| 1998 | 163.18 | 11.43 | 2.70 | 0.03 | 165.88 | 11.46 | 177.34 | 6.20 | 10.50 | 44.10 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

එ.ජ. ඩොලර් දශ ලක්ෂ 177 ක් දක්වා සියයට 30 කින් පහළ ගියේය. දේශීය බැංකු ඒකක මගින් ණය දීම 1997 එ.ජ. ඩොලර් දශ ලක්ෂ 244 සිට 1998 එ.ජ. ඩොලර් දශ ලක්ෂ 166 දක්වා අඩු වූ අතර, විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් දෙන ලද ණය 1997 එ.ජ. ඩොලර් දශ ලක්ෂ 8.8 සිට 1998 ඇ.එ.ජ. ඩොලර් දශ ලක්ෂ 11.5 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. 1998 වර්ෂය අවසානය වනවිට මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කළ අය වීමට තිබූ ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 44 ක් විය. 1998 වර්ෂය තුල ප්‍රදානය කරන ලද ණය සඳහා වූ පරිණත කාලය දළ වශයෙන් වර්ෂයක් වූ අතර, අය කරන ලද පොළී අනුපාතික සියයට 6.2 ත් 10.5 ත් අතර විය. විස්තර II.4 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

## මෙරට හැර යන ඉන්දියානුවන් සඳහා වූ සහනාධාර සහ කරුණා සහගත ගෙවීම් :-

1964 ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුම යටතේ ඉන්දියානු සම්භවයෙන් පැවත එන වතු කම්කරුවන් ආපසු යැවීම සම්බන්ධව රජය වෙනුවෙන් ගෙවන ලද මුළු සහන ගෙවීම් 1997 දී රුපියල් 48,191 හා සසඳන කල 1998 දී රුපියල් 148,231 ක් විය. 1997 දී රුපියල් 2,475 ක් වූ කරුණාසහගත ගෙවීම් ප්‍රමාණයට සාපේක්ෂව බලන කල 1998 දී එය රුපියල් 15,675 ක් විය.

## අපනයනකරුවන් සම්බන්ධයෙන් වූ ආනයන තීරු බදු ප්‍රතිදාන :-

1997 දී ගෙවූ රුපියල් දශ ලක්ෂ 1,028 හා සසඳ බලන කල රජය වෙනුවෙන් අපනයනකරුවන්ට ගෙවන ලද තීරු බදු ප්‍රතිදාන සඳහා 1998 දී මහ බැංකුවට වාණිජ බැංකු වෙනුවෙන් ප්‍රතිපූර්ණය කරන ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 768 ක් විය.

## ආසියානු නිෂ්කාශන සංගමය :-

කලින් වසරේ වූ රුපියල් දශ ලක්ෂ 37,236 හා සසඳන කල 1998 වසරේ ආසියානු නිෂ්කාශණ සංගමය හරහා කරන ලද මුළු ගණුදෙනුවල රුපියල් වටිනාකම රුපියල් දශ ලක්ෂ 44,240 ක් විය. 1997 රුපියල් දශ ලක්ෂ 26,879 හා සසඳන කල 1998 වසර තුල විදේශීය මුදලින් නිරවුල් කල වටිනාකම රුපියල් දශ ලක්ෂ 34,257 ක් විය. සලකා බලන වසර තුල ආසියානු නිෂ්කාශන සංගමය මගින් සලසා තිබූ හුවමාරු (SWAP) පහසුකම් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ දයකත්වය රුපියල් දශ ලක්ෂ 494 ක් විය.

## අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල :-

1971 අංක 6 දරන අනිවාර්ය ඉතිරි කිරීමේ පනත හා 1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීමේ නීතිය යටතේ එකතු කරන ලද මුදල් භාරකාරත්වය දැරීම හා රජය වෙනුවෙන් අරමුදල් පාලනය කිරීම මහ බැංකුව විසින් දිගටම කරගෙන යන ලදී. බැංකුවේ පවත්වාගෙන යනු ලබන අරමුදලේ 1998 දෙසැම්බර් 31 දිනට පැවතුනු ශේෂය රුපියල් දශ ලක්ෂ 55.6 ක් විය.

## රාජ්‍ය ගිණුම් :-

රජයේ බැංකුව වශයෙන් මහ බැංකුව රාජ්‍ය දෙපා-ර්තමේන්තු, රාජ්‍ය නියෝජ්‍යත්ව ආයතන හා සමහර ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාල ගිණුම් දිගටම පවත්වාගෙන යන ලදී. 1997 තුල ගිණුම් සංඛ්‍යා වූ 159 හා සසඳනවිට 1998 වසර අග වනවිට පවත්වාගෙන යන ලද ගිණුම් සංඛ්‍යාව 165 ක් විය. 1998 වසර තුල රාජ්‍ය දෙපාර්තමේන්තු සහ නියෝජිත ආයතනවල ගිණුම් 7 ක් වසා දමනු ලැබූ අතර රජයේ නව ගිණුමක් විවෘත කරන ලදී.

## විදේශීය මූල්‍ය :-

සමාලෝචන වර්ෂය තුලදී මහ බැංකුව විසින් රජය වෙනුවෙන් විවිධ විදේශ ණය සහ ප්‍රදාන යටතේ මුද හරින ලද ණය මුදල් ලබා ගැනීම, විදේශීය ණය ආපසු ගෙවීම් හා පොළී ගෙවීම් තවදුරටත් කරගෙන යන ලදී.

## ව්‍යවහාර මුදල් නිකුතුව

ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පූර්ණ බලධාරියා වශයෙන් ශ්‍රී ලංකාව තුළ ගණුදෙනු කිරීම සඳහා වලංගු මුදල් නිකුත් කිරීමේ කාර්ය භාරය 1998 වර්ෂය තුළදී තවදුරටත් ඉටු කරන ලදී. 1997 වර්ෂය අවසානයට රුපියල් දශ ලක්ෂ 53,134.7 ක් වශයෙන් සංසරණයේ පැවති ව්‍යවහාර මුදල් ප්‍රමාණය සමඟ සසඳන විට 1998 වර්ෂය අවසානයට මෙම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 60,086.8 ක් විය.

ශ්‍රී ලංකාවේ 50 වෙනි නිදහස් සමරුව නිමිත්තෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රථමවරට සමරු නෝට්ටුවක් නිකුත් කරන ලදී. රු. 200/- ක වටිනාකමකින් යුතු මෙම මුදල් නෝට්ටුව පොලිමර් කඩදාසියේ මුද්‍රිත අතර ශ්‍රී ලංකාවේ ඉතිහාසය හා සමාජ ආර්ථික සංවර්ධනය පිළිබිඹු වන චිත්‍ර පෙළකින් යුක්ත වේ. කාසි හා නෝට්ටු එකතු කරන්නන් සඳහා මෙම නෝට්ටුව ආකර්ශණීය අසුරණයක් සහිතව ද නිකුත් කරන ලද අතර, සමරු භාණ්ඩයක් ලෙස පොලිමර් නෝට්ටුව විනිවිද පෙනෙන ඝනකාභයකට ඇතුළුකොට නිකුත් කෙරිනි. නිදහස් සමරුව නිමිත්තෙන් රු. 5,000/- රන් කාසියක්, රු. 1,000/- රිදී කාසියක් සහ සාමාන්‍ය සංසරණය සඳහා රු. 10/- ද්වි ලෝහ කාසියක් ද යනුවෙන් සමරු කාසි තුනක් නිකුත් කරන ලදී.

මුහුණත වටිනාකමට වඩා වැඩි මිලකට මහ බැංකුවට සමරු කාසි හා නෝට්ටු නිකුත් කිරීම කළහැකි වන පරිදි මුදල් නීති පනතේ 52 වන හා 55 වන පරිච්ඡේද 1998 අංක 6 දරණ මුදල් නීති (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන්නට යෙදිනි.

1997 දෙසැම්බර් මස සිට කොළඹ 01 මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යනු ලැබූ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අංශ 1998 වර්ෂය තුළදී ද එම ස්ථානයෙහි පවත්වාගෙන යන ලදී. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ මුදල් හුවමාරු කවුළු අංශය සිය කටයුතු කොළඹ 01 බ්‍රිස්ටල් වීදියේ පිහිටි යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථානයේ තවදුරටත් පවත්වාගෙන යන ලදී.

## බැංකු සංවර්ධන

බැංකු ක්‍රමයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, වාණිජ හා විශේෂිත බැංකු පිහිටුවීමට සහ වාණිජ බැංකු හා විශේෂිත බැංකු ශාඛා පිහිටුවීමට අදාළව බැංකු පණතේ විධිවිධාන ක්‍රියාවට නැංවීම සහ මූල්‍ය උපකරණ හඳුන්වා දීම සඳහා වන යෝජනා ඇගයීම බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ට ඇතුළත් වේ. තවද, මෙම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු සම්බන්ධීකරණය සහ ඒවායේ ක්‍රියාකාරිත්වය සුපරීක්ෂණය ද සිදු කරනු ලබයි. එමෙන්ම, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල (ප්‍රා.ග්‍රා.සං.බැංකු) ක්‍රියාකාරිත්වය සුපරීක්ෂණය කිරීම හා එම බැංකුවලට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයෙහි ද මෙම දෙපාර්තමේන්තුව නිරත වෙයි. ප්‍රාදේශීය සංවර්ධන බැංකු පිහිටුවීම සම්බන්ධ කටයුතු ද මෙම දෙපාර්තමේන්තුව ඉටු කරනු ලබයි.

1997 අංක 6 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධානවලට අනුකූලව ප්‍රාදේශීය මට්ටමින් විශේෂිත බැංකු පිහිටුවීම 1998 වර්ෂයේදී සිදු වූ කැපී පෙනෙන කාර්යයක් විය. රුහුණු සංවර්ධන බැංකුව, කඳුරට සංවර්ධන බැංකුව, රජරට සංවර්ධන බැංකුව, සබරගමුව සංවර්ධන බැංකුව, වයඹ සංවර්ධන බැංකුව හා ඌව සංවර්ධන බැංකුව යන ප්‍රාදේශීය සංවර්ධන බැංකු (ප්‍රා.සං.බැංකු) 6 මෙම වර්ෂය තුළදී සංස්ථාපනය කරනු ලැබිණි. මේවායින් රුහුණු, කඳුරට හා රජරට සංවර්ධන බැංකු සිය ව්‍යාපාර කටයුතු වර්ෂය තුළදී ආරම්භ කරන ලද අතර, 1999 වසර ආරම්භයේ දී සබරගමුව, වයඹ හා ඌව සංවර්ධන බැංකු සිය කටයුතු ඇරඹීමට නියමිත ය. 1998 වර්ෂයේදී ඩී.එෆ්.සී.සී. බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සහ ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව වෙත බැංකු පනතේ අංක 76 අ (3) වගන්තියෙහි නියමය පරිදි (විශේෂිත බැංකු වශයෙන්) බලපත්‍ර නිකුත් කරන ලදී.

1998 වර්ෂය අවසානයට වාණිජ බැංකු, විශේෂිත බැංකු සහ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සම්බන්ධ ඇතැම් තොරතුරු 11 - 5 සංඛ්‍යා සටහනේ දක්වෙයි. දේශීය හා විදේශීය වාණිජ බැංකු සංඛ්‍යාව පසුගිය වසරේ පැවති ප්‍රමාණයේම නොවෙනස්ව පැවතිණි. රුහුණු, කඳුරට හා රජරට සංවර්ධන බැංකු ආරම්භ කිරීමත් සමඟ 1998 දී විශේෂිත බැංකු සංඛ්‍යාව 6 සිට 9 දක්වා ඉහළ ගියේය. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං. බැ.) 8 ක ව්‍යාපාර කටයුතු අළුතින් ව්‍යාපාර ඇරඹූ ප්‍රාදේශීය සංවර්ධන බැංකු තුනට පවරන ලද හෙයින් මෙම වසරේදී මුළු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සංඛ්‍යාව 17 සිට 9 දක්වා අඩු විය. මෙම වෙනස්වීම් හේතුකොටගෙන වර්ෂය තුළ දී මුළු බැංකු ආයතන සංඛ්‍යාව පසුගිය වසරට වඩා 5 කින් අඩු වෙමින් 44 ක් බවට පත් විය.

### බැංකු ශාඛා ව්‍යාප්තිය

1998 දී නව වාණිජ බැංකු ශාඛා 39 ක් විවෘත කිරීම සඳහා අනුමැතිය දෙනු ලැබුණි. මෙම වසර තුළ විවෘත කරන ලද මුළු දේශීය හා විදේශීය වාණිජ බැංකු ශාඛා සංඛ්‍යාව 32 ක් වූ අතර, ඉන් 30 ක් දේශීය වාණිජ බැංකු ශාඛාවන් ද, 2 ක් විදේශීය බැංකු ශාඛාවන් ද විය. එයට අමතරව, වාණිජ බැංකු විසින් ව්‍යාප්ති කාර්යාල 3 ක් සහ උකස් මධ්‍යස්ථාන 18 ක් වර්ෂය තුළදී අළුතින් විවෘත කරන ලද අතර, එක් ව්‍යාප්ති කාර්යාලයක් වසා දමන ලදී. නව ශාඛා 19 ක් විවෘත කිරීමට විශේෂිත බැංකුවලට අනුමැතිය ලබා දුන් අතර, එයින් 13 ක් මෙම වසර තුළ දී ආරම්භ කෙරිණි. 1998 වර්ෂය අවසානයේ දී ව්‍යාප්ති කාර්යාල හා උකස් මධ්‍යස්ථානද ඇතුළු වාණිජ බැංකු ශාඛා, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා හා විශේෂිත බැංකු ශාඛාවල මුළු ගණන 1,526 දක්වා 65 කින් වර්ධනය විය.

II - 5 සංඛ්‍යා සටහන
**බැංකු ආයතන සංයුතිය සහ බැංකු ශාඛා ව්‍යාප්තිය**

| වර්ගීකරණය | 1993 | 1994 | 1995 | 1996 | 1997 | 1998 (අ) |
|---|---|---|---|---|---|---|
| **1. ආයතන සංඛ්‍යාව** | 44 | 44 | 47 | 48 | 49 | 44 |
| 1.1 වාණිජ බැංකු | 23 | 23 | 26 | 27 | 26 | 26 |
| 1.1.1 දේශීය වාණිජ බැංකු | 6 | 6 | 8 | 8 | 8 | 8 |
| 1.1.2 විදේශීය බැංකු | 17 | 17 | 18 | 19 | 18 | 18 |
| 1.2 ප්‍රා.ග්‍රා.සං.බැංකු (ආ) | 17 | 17 | 17 | 17 | 17 | 9 |
| 1.3 විශේෂිත බැංකු (ඇ) | 4 | 4 | 4 | 4 | 6 | 9 |
| 1.3.1 ඉතිරිකිරීමේ බැංකු | 1 | 1 | 1 | 1 | 1 | 1 |
| 1.3.2 සංවර්ධන බැංකු | 3 | 3 | 3 | 3 | 5 | 5 |
| 1.3.3 ප්‍රාදේශීය සංවර්ධන බැංකු (ඈ) | - | - | - | - | - | 3 |
| **2. බැංකු ශාඛා සංඛ්‍යාව (ඉ)** | 1108 | 1156 | 1209 | 1339 | 1461 | 1526 |
| 2.1 වාණිජ බැංකු ශාඛා | 854 | 890 | 936 | 1058 | 1169 | 1221 |
| 2.1.1 දේශීය බැංකු ශාඛා | 820 | 853 | 897 | 1019 | 1127 | 1177 |
| (I) ප්‍රධාන ශාඛා | 734 | 761 | 795 | 826 | 857 | 889 |
| (II) කෘ.සේ.ම.ශාඛා | 29 | 28 | 19 | 17 | 14 | 12 |
| (III) කච්චේරි ශාඛා | 24 | 23 | 23 | 23 | 23 | 23 |
| (IV) ව්‍යාප්ති කාර්යාල/ගෙවීම් කාර්යාල | 27 | 32 | 41 | 47 | 56 | 58 |
| (V) උකස් හා ඉතුරුම් සේවා මධ්‍යස්ථාන | 4 | 7 | 15 | 101 | 172 | 190 |
| (VI) විදේශීය ශාඛා (උ) | 2 | 2 | 4 | 4 | 4 | 4 |
| (VII) විදේශීය ව්‍යාප්ති කාර්යාල | - | - | - | 1 | 1 | 1 |
| 2.1.2 විදේශීය බැංකු ශාඛා | 34 | 37 | 39 | 39 | 42 | 44 |
| (I) ප්‍රධාන ශාඛා | 33 | 36 | 37 | 37 | 38 | 40 |
| (II) ව්‍යාප්ති කාර්යාල | 1 | 1 | 2 | 2 | 4 | 4 |
| 2.2 ප්‍රා.ග්‍රා.සං.බැංකු ශාඛා | 163 | 169 | 171 | 175 | 176 | 96 |
| 2.3 විශේෂිත බැංකු ශාඛා සංඛ්‍යාව | 91 | 97 | 102 | 106 | 116 | 209 |
| 2.3.1 ඉතිරි කිරීමේ බැංකු ශාඛා | 85 | 90 | 95 | 97 | 99 | 100 |
| 2.3.2 සංවර්ධන බැංකු ශාඛා | 6 | 7 | 7 | 9 | 17 | 29 |
| 2.3.3 ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා | - | - | - | - | - | 80 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) 1985 අංක 15 දරණ ප්‍රා.ග්‍රා.සං.බැංකු පනත යටතේ පිහිටුවන ලද ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු

(ඇ) සංශෝධිත බැංකු පනතේ විධිවිධාන යටතේ විශේෂිත බැංකු ලෙස බලපත්‍රයක් අවශ්‍ය බැංකු

(ඈ) 1997 අංක 6 දරණ ප්‍රා.සං.බැංකු පනත යටතේ පිහිටුවන ලද ප්‍රාදේශීය සංවර්ධන බැංකු

(ඉ) සමූපකාර ග්‍රාමීය බැංකු ඇතුලත් නැත.

(උ) ලංකා බැංකුවේ විදේශීය ශාඛා 4(ලන්ඩන්, මාලේ, මදුරාසිය සහ කරච්චි ශාඛා)

ප්‍රමාණවත් ඉඩකඩ නොමැතිකම, තාක්ෂණික වැඩි දියුණු කිරීම් සඳහා වන අවශ්‍යතාවන් සහ සිය ගණුදෙනු කරුවන් සඳහා වැඩි පහසුකම් සැලසීමේ අපේක්ෂාව හේතුකොටගෙන වාණිජ බැංකු සහ විශේෂිත බැංකු ශාඛා පිහිටි ස්ථානයන් වෙනස් කිරීමේ අවශ්‍යතාවන් ඇති විය. වර්ෂය තුල දී වාණිජ බැංකු ශාඛා 69 ක සහ එක් විශේෂිත බැංකු ශාඛාවක පිහිටි ස්ථාන වෙනස් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

# ප්‍රාදේශීය කාර්යාල

## මාතර, අනුරාධපුර, මාතලේ

1998 වර්ෂයේ දී මාතර, අනුරාධපුර හා මාතලේ ප්‍රාදේශීය කාර්යාල විසින් ඒවාට පවරා ඇති සම්ප්‍රදායික මහ බැංකු කාර්යයන්ට අමතරව ඒවායේ සංවර්ධන වැඩ කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කරනු ලැබුණි. ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රධාන කාර්යයන් වූයේ ව්‍යවහාර මුදල් කටයුතු (මාතර හා අනුරාධපුර), චෙක්පත් නිෂ්කාශන කටයුතු, සමාජ ආර්ථික දත්ත රැස් කිරීම, ප්‍රතිලාභීන් පුහුණු කිරීමේ වැඩ සටහන් පැවැත්වීම, සමීක්ෂණ හා පර්යේෂණ කටයුතුවල යෙදීම, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල කටයුතු අධීක්ෂණය, අධ්‍යාපනික සම්මන්ත්‍රණ පැවැත්වීම, මහ බැංකු ප්‍රකාශන අලෙවිය සහ ඒ ඒ ප්‍රදේශයන්හි සංවර්ධන කටයුතුවල නියුතු රජයේ දෙපාර්තමේන්තු, ආයතන හා සංවිධාන සමඟ සම්බන්ධීකරණය වීම වැනි කටයුතු වේ. ප්‍රාදේශීය කාර්යාල විසින් මෙම වසර තුලදී ඉටු කල වැදගත් කටයුත්තක් වූයේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පිහිටුවීම හා ඒවායේ කටයුතු ආරම්භ කිරීමට සහාය වෙමින් මෙම කාර්යාල ඉටු කරන ලද කාර්ය භාරයයි. පිළිවෙලින් 1998 ජූලි, ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී ව්‍යාපාර කටයුතු ආරම්භ කල රුහුණු, කඳුරට හා රජරට සංවර්ධන බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලයන්හි මහ බැංකුව නියෝජනය කිරීමට ප්‍රාදේශීය කළමණාකරුවන් පත් කරන ලදී.

## මාතර

කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය, බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය, සුරතුර දිරිය ණය යෝජනා ක්‍රමය, සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය, කිරිදිඹය සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය සහ අරුණළු ණය යෝජනා ක්‍රමය ක්‍රියාවට නැංවීමට අදළ කටයුතු මෙහෙයවීම සඳහා මාතර ප්‍රාදේශීය කාර්යාලය තවදුරටත් දයක විය. ව්‍යාපෘති අරමුදල් සම්පූර්ණයෙන් උපයෝගී කර ගැනීමෙන් පසුව පසුගිය වර්ෂය අවසානයේ දී නිමාවට පත් වූ කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රදනය කර තිබූ ණය මුදල් අය කර ගැනීම සඳහා ප්‍රාදේශීය කාර්යාලයේ සහාය ලබා දෙන ලදී. මෙම අරමුණින් දිස්ත්‍රික් දෙකක ව්‍යාපෘති නිලධාරීන් හා වාණිජ බැංකු නිලධාරීන් සඳහා ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුවේද සහාය ඇතිව වැඩ මුළු පවත්වන ලදී. දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය යටතේ විශාල ප්‍රමාණයේ ණය මුදල් නිර්දේශ කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු ප්‍රාදේශීය කාර්යාලය විසින් සිදු කරන ලද අතර, ඒ අනුව රුපියල් දශ ලක්ෂ 68 ක වටිනාකමක් සහිත ණය අයදුම්පත් 208 ක් නිර්දේශ කොට ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් රුහුණ සංවර්ධන බැංකුවෙහි නිලධාරීන් දැනුවත් කරනු පිණිස වැඩ මුළු පහක් පවත්වන ලදී. අධ්‍යාපනික, පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සම්-බන්ධයෙන් ප්‍රදේශයෙහි පිහිටි රජයේ දෙපාර්තමේන්තු වාණිජ බැංකු හා අනෙකුත් ආයතන සමඟ ප්‍රාදේශීය කාර්යාලය සහයෝගීව කටයුතු කරන ලදී. ගාල්ල දිස්ත්‍රික්කයේ පාසැල් සිසුන් 700 ක් පමණ දෙනා සඳහා ප්‍රාදේශීය කාර්යාලය විසින් අධ්‍යාපනික සම්මන්ත්‍රණ මෙහෙයවීය. තවද, මහ බැංකුවේ දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩ සටහන ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාලය දයක විය. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා අධීක්ෂණ කටයුතුද ප්‍රාදේශීය කාර්යාලය විසින් සිදු කරන ලදී. රුහුණු සංවර්ධන බැංකුව පිහිටුවීම සඳහා මෙන්ම එහි ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රාදේශීය කාර්යාලය විසින් සහාය ලබා දෙන ලදී. ප්‍රාදේශීය කාර්යාලයේ ව්‍යවහාර මුදල් අංශය විසින් මහජනතාව සඳහා මුදල් හුවමාරු පහසුකම් මෙන්ම ප්‍රදේශය තුල පිහිටි වාණිජ බැංකු සඳහා මුදල් තැන්පත් කිරීමේ හා නිකුත් කිරීමේ පහසුකම් තවදුරටත් ලබා දෙන ලදී. මෙම වර්ෂය තුළදී මාතර ප්‍රාදේශීය නිෂ්කාශන මධ්‍යස්ථානය විසින් රුපියල් දශ ලක්ෂ 3,903 ක් වටිනා චෙක්පත් 222,468 ක් නිෂ්කාශනය කර ඇත.

## අනුරාධපුර

1998 වර්ෂයේදී අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය විසින් පුහුණු වැඩ සටහන් 24 ක් පවත්වන ලදී. සංවර්ධන කටයුතුවල නියුතු රජයේ දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල සහාය හා/හෝ සහයෝගීතාව ඇතිව මෙම වැඩසටහන් මෙහෙයවන ලදී. ස්වයං රැකියා, ව්‍යවසායකත්ව සංවර්ධනය, අලෙවිකරණය, සත්ව පාලනය, කෘෂිකර්මය හා කළමණාකාරිත්ව සංවර්ධනය වැනි ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් මෙම පුහුණු කිරීම් පවත්වනු ලැබුණි. තවද, රැකියා විරහිත උපාධිධාරීන් සඳහා එක් වැඩමුළුවක්ද පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහන් සඳහා මුළු සහභාගී වූවන් ගණන 1,023 ක් විය. එයට අමතරව, අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල හා මැදිරිගිරිය යන ප්‍රදේශවල අ.පො.ස. උසස් පෙළ සිසුන් සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණ පහක් සංවිධානය කරන ලද අතර, සිසුන් 1,500 දෙනෙකු ඒවාට සහභාගී වී තිබිණි. උතුරු මැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය හා උතුරු මැද පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යන විශේෂ ව්‍යාපෘතීන්හි කටයුතු මෙහෙයවීමට ප්‍රාදේශීය කාර්යාලය තවදුරටත් සහාය විය. උතුරු මැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අඩු ආදයම්ලාභී පවුල් වෙත ප්‍රදනය කරන ලද ණය මුදල් පිළිබඳ අධීක්ෂණයක් ප්‍රාදේශීය කාර්යාලය විසින් සිදු කරනු ලැබිණි. ගම් නගා සිටුවීමේ හා ස්වයං රැකියා ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ වගා ළිං (වතුර පොම්පය සහිතව) සඳහා ණය පහසුකම් ලැබූ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි පවුල් 200 ක් ඇතුළත් වන ලෙස ඔවුන් ලබා ඇති දියුණුව ඇගයීමේ සමීක්ෂණයක් ප්‍රාදේශීය කාර්යාලය විසින් පවත්වනු ලැබූ අතර ඒ සඳහා රජරට විශ්ව විද්‍යාල සිසුන්ගේ සහාය ලබා ගන්නා ලදී. ප්‍රාදේශීය කාර්යාලයේ මඟ පෙන්වීම ඇතිව එම විශ්ව විද්‍යාල සිසුන් විසින්ම අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි "සුරතුර" ණය ලාභීන්ගේ ප්‍රගතිය අධ්‍යයනය කිරීමට තවත් සමීක්ෂණයක් පවත්වනු ලැබුණි. අනුරාධපුර නගරය තොග වෙළඳ මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ඇති අවස්ථා සොයා බැලීමේ අදහසින් ගොවීන් මුහුණ දෙන අලෙවිකරණ ගැටළු අවබෝධ කර ගැනීම සඳහා විශේෂ සමීක්ෂණයක්ද ප්‍රාදේශීය කාර්යාලය විසින් පවත්වන ලදී. දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩ සටහන සඳහා අවශ්‍ය මිල ගණන් රැස් කිරීම සහ මහ බැංකු ප්‍රකාශන අලෙවි කිරීමේ කටයුතුද ප්‍රාදේශීය කාර්යාලය විසින් තවදුරටත් පවත්වාගෙන යන ලද කාර්යයන් විය. එමෙන්ම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා අධීක්ෂණ කටයුතු ද තවදුරටත් ක්‍රියාත්මක කෙරිණි. වාණිජ බැංකු සඳහා මුදල් තැන්පත් කිරීමේ හා නිකුත් කිරීමේ පහසුකම් මෙන්ම මහජනතාව සඳහා මුදල් හුවමාරු පහසුකම් ප්‍රාදේශීය කාර්යාලය විසින් සලසනු ලැබුණි. අනුරාධපුර ප්‍රාදේශීය නිෂ්කාශන මධ්‍ය-ස්ථානය විසින් රුපියල් දශ ලක්ෂ 2,332 ක වටිනාකමක් සහිත චෙක්පත් 229,931 ක් 1998 වර්ෂයේදී නිෂ්කාශනය කර ඇත.

## මාතලේ

මාතලේ ප්‍රාදේශීය කාර්යාලය විසින් පුහුණු වැඩ සටහන්, වැඩමුළු ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ 17 ක් මෙම වර්ෂය තුළදී පවත්වන ලද අතර, ඒවාට 10,495 දෙනෙකු සහභාගී වී ඇත. මූල්‍ය කල්බදු ක්‍රමය පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහනක් මහනුවර, මාතලේ, කෑගල්ල හා නුවරඑළිය ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කළමණාකරුවන් සඳහා

පවත්වනු ලැබිණි. කොටස් වෙළඳපොළෙහි ආයෝජනය කිරීම සම්බන්ධයෙන් පවත්වන ලද තවත් පුහුණු වැඩසටහනකට ආයෝජකයින් සහ ව්‍යාපාරිකයින් 100 කට වැඩි සංඛ්‍යාවක් සහභාගී වූහ. අධ්‍යාපන දෙපාර්තමේන්තුව, විශ්ව විද්‍යාල හා පාසල් වෙතින් ලද විවිධ ඉල්ලීම්වල ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාදේශීය කාර්යාලය විසින් මහ බැංකු ප්‍රකාශන අලෙවි කිරීමේ ජංගම ඒකකයක් පිහිටුවන ලද අතර, පාසැල් 21 කට මෙම ජංගම ස්වාවෙන් පහසුකම් සැලසිණි. තවද, මහ බැංකු ප්‍රකාශන මෙන්ම මුදල් නෝට්ටු හා කාසි ප්‍රදර්ශනය කිරීමේ වැඩ සටහන් දෙකක් ප්‍රාදේශීය කාර්යාලය විසින් සංවිධානය කරන ලදී. කුඩා පරිමාණ ව්‍යාපෘතීන් හඳුනා ගැනීමේ වැඩ කටයුතුවල ප්‍රාදේශීය කාර්යාලය තවදුරටත් නිරත වූ අතර, ශක්‍යතාවන් සහිත එවැනි ව්‍යාපෘතිවලට වාණිජ බැංකු වෙතින් මූල්‍ය පහසුකම් ලබා ගැනීමට පිළියෙල කරන ලදී. මධ්‍යම පලාත තුල විසිතුරු පැළැටි හා පැළ තවාන් පවත්වාගෙන යන්නන්ගේ සංවිධානයක් ඇති කිරීමට ප්‍රාදේශීය කාර්යාලය කටයුතු කල අතර, එම සංවිධානයට ප්‍රදර්ශන හා අලෙවි වැඩ සටහන් 4 ක් පැවැත්වීමට සහාය දෙන ලදී. තවද, මාතලේ ප්‍රදේශයෙහි බැංකු කරුවන්ගේ සංවිධානයක් බිහි කිරීමට ප්‍රාදේශීය කාර්යාලය මූලිකව කටයුතු කර ඇත. ගොවිපල යන්ත්‍ර සූත්‍ර සහ ත්‍රීරෝද රථ භාවිතය පිළිබඳව සමීක්ෂණයක්ද ප්‍රාදේශීය කාර්යාලය විසින් මෙහෙයවනු ලැබුණි. තවද කෘෂි නිෂ්පාදන අලෙවිකරණය පිළිබඳ අධ්‍යයනයක් කරන ලද අතර, දඹුල්ල වෙළඳපොළ දියුණු කිරීම පිළිබඳව රජයේ බලධාරීන් සමඟ ප්‍රාදේශීය කාර්යාලය විසින් සාකච්ඡා කර ඇත. මහනුවර, මාතලේ, කෑගල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි සමාජ ආර්ථික දත්ත රැස් කිරීමේ හා යාවත්කාලීන කිරීමේ කටයුතු ප්‍රාදේශීය කාර්යාලය විසින් සිදු කල අතර, රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන, විශ්ව විද්‍යාල, පර්යේෂණ කටයුතුවල නියැලි සිසුන් හා වෙනත් අය විසින් එම දත්ත ප්‍රයෝජනයට ගෙන ඇත. දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩසටහන සඳහා මිල ගණන් රැස් කිරීමේ කටයුතුවල ප්‍රාදේශීය කාර්යාලය තවදුරටත් නිරත විය. තවද, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා අධීක්ෂණ කටයුතු තවදුරටත් ප්‍රාදේශීය කාර්යාලය විසින් සිදු කරන ලද අතර, කඳුරට සංවර්ධන බැංකුව පිහිටුවීමටද සහාය විය. මාතලේ හා මහනුවර චෙක්පත් නිෂ්කාශන මධ්‍යස්ථාන දෙක මගින් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 2,506 ක් වටිනා චෙක්පත් 135,645 ක්ද, රුපියල් දශ ලක්ෂ 23,845 ක් වටිනා චෙක්පත් 763,814 ක්ද නිෂ්කාශනය කරන ලදී. 1998 වර්ෂයේදී සම්පත් බැංකුවේ මහනුවර ශාඛාව සහ හැටන් නැෂනල් බැංකුවේ කටුගස්තොට ශාඛාව මහනුවර නිෂ්කාශන මධ්‍යස්ථානයට ඇතුළත් කෙරිණි.

## ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං.බැංකු) විසින් පසුගිය 13 වසරක කාලය තුල සිදු කරන ලද සංවර්ධන ක්‍රියාවලියේ වෙනසක් 1998 වර්ෂයේ දී සලකුණු කෙරිණි. අදළ ප්‍රදේශය තුල ක්‍රියාත්මක ප්‍රා.ග්‍රා.සං. බැංකුවල ව්‍යාපාර කටයුතු පවරා ගනිමින් නිශ්චිත ප්‍රදේශවල ප්‍රාදේශීය සංවර්ධන බැංකු (ප්‍රා.සං. බැංකු) පිහිටුවීම අරමුණු කොට ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත 1997 වර්ෂයේ දී නීතිගත කරන ලදී.

මේ අනුව 1998 වර්ෂය තුලදී ප්‍රාදේශීය සංවර්ධන බැංකු 6 ක් ස්ථාපනය කරන ලදී. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 17 හි ව්‍යාපාර කටයුතු ප්‍රාදේශීය සංවර්ධන බැංකුවලට පැවරෙන අන්දම හා එක් එක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි කොටස් ප්‍රාග්ධනය පිළිබඳ විස්තර පහත සඳහන් සටහනෙහි දක්වේ.

**II - 6 වන සංඛ්‍යා සටහන**

| ප්‍රා.ග්‍රා.සං.බැංකු | ප්‍රා.සං.බැංකු | මුළු කොටස් ප්‍රාග්ධනය රු.දශ ලක්ෂ |
|---|---|---|
| මහනුවර<br>මාතලේ<br>නුවරඑළිය | කඳුරට | 150 |
| අනුරාධපුර<br>පොළොන්නරුව | රජරට | 100 |
| කුරුණෑගල<br>පුත්තලම<br>ගම්පහ | වයඹ | 150 |
| කෑගල්ල<br>රත්නපුර<br>කළුතර | සබරගමුව | 150 |
| ගාල්ල<br>හම්බන්තොට<br>මාතර | රුහුණ | 150 |
| බදුල්ල<br>මොණරාගල<br>අම්පාර | ඌව | 100 |

සෑම ප්‍රාදේශීය සංවර්ධන බැංකුවකම ආරම්භක ප්‍රාග්ධනය රු. 10/- කොටස් වලින් සමන්විත රුපියල් දශ ලක්ෂ 500 කි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවක ආරම්භක ප්‍රාග්ධනයට ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ සේවක අර්ථ සාධක අරමුදල යන ආයතන මුලින් දායක වී ඇත. අදළ ප්‍රදේශය තුල පිහිටි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල ශුද්ධ වත්කම් වටිනාකම සැලකිල්ලට ගෙන එක් එක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවක ආරම්භක නිකුතු ප්‍රාග්ධනය තීරණය කොට ඇත. ඉහත සටහන අනුව එක් එක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවක නිකුතු ප්‍රාග්ධනය රුපියල් දශ ලක්ෂ 100 ක් හෝ රුපියල් දශ ලක්ෂ 150 ක් වශයෙන් නිශ්චය කර තිබේ.

ස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සංවර්ධන බැංකු 6 අතරින් රුහුණු සංවර්ධන බැංකුව, කඳුරට සංවර්ධන බැංකුව සහ රජරට සංවර්ධන බැංකුව 1998 වර්ෂය තුලදී ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලදී. මෙම බැංකුවල ප්‍රධාන කාර්යාල පිළිවෙලින් මාතර, මහනුවර හා අනුරාධපුර යන නගරවල ස්ථාන ගත කොට ඇත. සබරගමුව, වයඹ සහ ඌව යන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවල ව්‍යාපාර කටයුතු 1999 වර්ෂය මුලදී ආරම්භ කිරීමට නියමිත ය.

මෙම වසර තුල ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලද සංවර්ධන බැංකු වෙත මෙන්ම වයඹ හා සබරගමුව සංවර්ධන බැංකු වෙත විශේෂිත බැංකු වශයෙන් බලපත්‍ර නිකුත් කරන ලදී. ඒ අනුව ප්‍රාදේශීය සංවර්ධන බැංකු, මහ බැංකුවේ අධීක්ෂණය හා විධිවිධාන යටතට පත් කර තිබේ.

සිය බල ප්‍රදේශය තුලින් මෙන්ම ඉන් පිටතින් ද තැන්පතු රැස් කිරීම සහ ජනගහණයේ දිළිඳුම කොටස් නංවාලීමේ අවශ්‍යතාවය සැළකිල්ලට ගනිමින් බල ප්‍රදේශය තුල ඵලදායී සංවර්ධන ව්‍යාපෘති සඳහා ණය මුදල් ලබා දීමේ කටයුතු ප්‍රාදේශීය සංවර්ධන බැංකු ආරම්භ කොට ඇත. සංවර්ධනය අරමුණු කර ගත් ව්‍යවසායයන් මූල්‍යකරණයට අමතරව මෙම බැංකු විසින් පළාත් සභා, ප්‍රාදේශීය සභා සහ වෙනත් පළාත් පාලන ආයතන විසින් කරගෙන යනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවලද ක්‍රියාශීලී වැඩ කොටසක් ඉටු කරනු ඇත.

ප්‍රාදේශීය සංවර්ධන බැංකු පණත මගින් ලබා දී ඇති බලතලවලට යටත්ව බැංකු පණතේ iv වැනි උපලේඛනයේ නිශ්චිත කොට ඇති කාර්යයන් ප්‍රාදේශීය සංවර්ධන බැංකු විසින් ක්‍රියාත්මක කරනු ඇත. තවද, ප්‍රාදේශීය සංවර්ධන බැංකු පණත යටතේ බලතල ලැබී ඇති එවැනි වෙනත් ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාමටද එම බැංකුවලට අවසර ලැබී ඇත.

1997 වර්ෂය අවසානයට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල පැවති මුළු තැන්පතු ප්‍රමාණය හා සසඳන විට 17% ක වර්ධනයක් පෙන්වමින් ප්‍රා.ග්‍රා.සං.බැංකු හා ප්‍රා.සං.බැංකු 1998 අවසානයේදී සංචලනය කර තිබූ මුළු තැන්පතු සංඛ්‍යාව රුපියල් දශ ලක්ෂ 3,057 ක් විය. මෙම බැංකුවල මුළු තැන්පතු ගිණුම් ප්‍රමාණය දශ ලක්ෂය ඉක්මවා තිබේ. 1998 වර්ෂය තුලදී ප්‍රා.ග්‍රා.සං.බැංකු සහ ප්‍රා.සං.බැංකු විසින් 360,000 ඉක්මවූ ණය කරුවන් සංඛ්‍යාවකට ප්‍රදානය කර තිබූ ණය හා අත්තිකාරම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,185 ක් වශයෙන් ඇස්තමේන්තු කොට ඇත. පසුගිය වර්ෂය හා සැසඳීමේදී වසර තුල ප්‍රදනය කරන ලද මුළු ණය හා අත්තිකාරම් ප්‍රමාණයේ 16% ක පහළ යාමක් වාර්තා විය. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු බොහොමයක් වර්ෂය තුලදී ප්‍රතිව්‍යුහගත කිරීම හා දැඩි මුල්‍ය විනයක් යටතේ ක්‍රියාත්මක වීම මෙන්ම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කීපයක පැවති දුර්වල මුල්‍ය තත්ත්වය යන කරුණු මෙම තත්ත්වයට හේතු වී තිබේ.

## බැංකු අධීක්ෂණ

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු සම්බන්ධයෙන් මහ බැංකුව විසින් සිදු කෙරෙන මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු පිළිබඳ වගකීම දරනුයේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවයි. එම වගකීම ක්‍රියාත්මක කරනු ලබනුයේ කාලීන වශයෙන් එකී ස්ථානයන් තුලදීම පරීක්ෂණය කිරීම (එතැන් පරීක්ෂාව) හා ඉන් බාහිරව විධිමත් විමසුමකට ලක් කිරීම (දුරස්ථ පරීක්ෂාව) තුළිනි. මෙවැනි අධීක්ෂණයක මූලික පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකා බැංකු ක්‍රමයෙහි සුරක්ෂිත හා යහපත් භාවය සහතික කිරීම හා එමගින් තැන්පත් කරුවන්ගේ අයිතීන් ආරක්ෂා කර දීමය.

### අධීක්ෂණ පරාසය

මේ දක්වා එතැන් පරීක්ෂාවක ස්වභාවය හා එහි පරාසය, මූලික වශයෙන් බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සමස්ත තක්සේරුවකට එළඹීම සඳහා බැංකුවේ වත්කම්වල ගුණාත්මක භාවය පිළිබඳව අගැයීමක් කිරීමට සීමා විය. මෙයට ප්‍රාග්ධනයේ ප්‍රමාණවත් බව, ඉපැයීම්, ද්‍රවශීලතාවය, කළමනාකරණ ශක්තිය, අභ්‍යන්තරික පාලන ක්‍රම, බැංකුවේ රීති හා ක්‍රියා පිළිවෙත් වැනි මූලිකාංග ඇතුළත් විය. බැංකු විසින් කොතෙක්දුරට ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්, අදාල නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන්නේද යන්නද මනා පරීක්ෂාවකට ලක් කරන ලදී.

ඵලදායී ලෙස බැංකු අධීක්ෂණය කිරීම සම්බන්ධව 1977 සැප්තැම්බර් මසදී "බාල්" කමිටුව විසින් නිකුත් කරන ලද මූලික සිද්ධාන්ත ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාවය පිළිබඳව සමස්ත ලෝකයේම අවධානය දන් යොමු වී ඇත. නූතන මූල්‍ය වෙළෙඳපොළවලට එකී සිද්ධාන්ත යොද ගැනීමේ වැදගත්කම පෙරදිග ආසියාව තුල හටගත් සිදු වීම් වලින් විදහා දක්වේ. ඒ අනුව, බැංකු අධීක්ෂණය පිළිබඳව ජාත්‍යන්තරව පිළිගත් ක්‍රියා පිළිවෙතට අනුකූලව අවදනම පදනම් කර ගත් අධීක්ෂණ ක්‍රියාවලියක් කරා යොමු වී ඇත. අවදනම පදනම් කර ගත් අධීක්ෂණය ප්‍රාග්ධන අවදනම, ද්‍රවශීල අවදනම, ණය අවදනම, ක්‍රියාකාරිත්වය තුලින් ඇති වන අවදනම වැනි බැංකු කටයුතුවලට සම්බන්ධ අවදනම් කෙරෙහි අවධානය යොමු කෙරේ. අවදනම් හඳුනා ගැනීම කෙරෙහි මෙසේ අවධානය යොමු කිරීමෙන් අවදනම් අඩු කර ගැනීම සඳහා පිළියම් යෙදීමට හැකි වනු ඇත. ස්වීඩන් රජයේ ආධාර මත, දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ හැකියාවන් දියුණු කිරීම සඳහා දනට ක්‍රියාත්මකව ඇති ව්‍යාපෘතිය යටතේ අවදනම මත පදනම් වූ අධීක්ෂණ ක්‍රියාවලිය තවදුරටත් දියුණු කිරීමට කටයුතු කරනු ලැබේ.

අවදනම මත පදනම් වූ අධීක්ෂණයට අමතරව, යහපත් අභ්‍යන්තර පාලන විධි, ඵලදායී අභ්‍යන්තර විගණන පාලනය පිළිබඳ පිළිවෙත් හා හෙළි කිරීමේ අවශ්‍යතාවයන් වැඩි කිරීම සම්බන්ධයෙන්ද දන් වැඩි අවධානයක් යොමු කෙරේ.

## බලපත් ලාභී වාණිජ බැංකු හා විශේෂිත බැංකු අධීක්ෂණය

විමසුමට ලක්වන වසර තුලදී දෙපාර්තමේන්තුව විසින් බලපත්ලාභී වාණිජ බැංකු 6 ක්, විශේෂිත බැංකු 3 ක් හා ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 3 ක් වශයෙන් එතැන් පරීක්ෂාවන් 12 ක් ආරම්භ කළ අතර, ඉන් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 3 හි පරීක්ෂණ කටයුතු නිම කරන ලදී. මීට අමතරව, පසුගිය වසරේදී ආරම්භ කළ බලපත්ලාභී වාණිජ බැංකු 6 ක එතැන් පරීක්ෂාවන්ද අවසන් කෙරුණි. වසර තුලදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවක හා බලපත්ලාභී විශේෂිත බැංකු දෙකක හදිසි පරීක්ෂාවන්ද සිදු කරන ලදී. මීට අමතරව, බැංකු විසින් නිසි අවධානයකින් කටයුතු කරන්නේද යන්න, විනිමය පාලන රෙගුලාසි කඩ කිරීම හා අදූරදර්ශී ලෙස ණය දීම වැනි කරුණු සම්බන්ධවද විශේෂ විමර්ශනයන් කරන ලදී.

දුරස්ථ පරීක්ෂා කිරීමේ ක්‍රමය යටතේ බලපත්ලාභී වාණිජ බැංකු හා ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල මූල්‍ය තත්ත්වය නොකඩවා අධීක්ෂණය කරන ලද අතර, දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාවන් පදනම් කර ගනිමින් බලපත්ලාභී විශේෂිත බැංකු අධීක්ෂණය කිරීමටද කටයුතු කරන ලදී. මෙම බැංකු විසින් වත්කම් හා වගකීම් සහ ද්‍රවශීල වත්කම් පිළිබඳ මාසික ප්‍රකාශන හා ප්‍රාග්ධන අවශ්‍යතාවයන්, ආදායම් හා වියදම් සහ අක්‍රිය ණය පිළිබඳ ත්‍රෛමාසික ප්‍රකාශන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළයුතු අතර, විගණනය කරන ලද අවසාන ගිණුම් වාර්ෂිකව ඉදිරිපත් කෙරේ. සමානුරූපී බැංකු කණ්ඩායම් හා බැංකු ක්ෂේත්‍රයට අදාලව එකිනෙක බැංකුවෙහි වත්කම්වල ගුණාත්මක භාවය, ලාභදායිත්වය සහ මූල්‍ය ශක්තිය අවබෝධ කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ එම වාර්තාවල ඇතුළත් තොරතුරු විමසුමට ලක් කරනු ලැබේ. බැංකුවකට අහිතකර ලෙස බලපෑ හැකි දුර්වලතා ලක්ෂණ හෝ ඒවායේ සැළකිය යුතු වෙනස්වීම් හඳුනා ගැනීමටද මෙම වාර්තා නිරීක්ෂණය කිරීම ප්‍රයෝජනවත් වන අතර, ඒවා පදනම් කර ගනිමින් ඊට අවශ්‍ය ක්ෂණික පිළියම් යෙදීමටද පුළුවන. සියලුම බලපත්ලාභී වාණිජ බැංකු 26 හිම වාර්තා කිරීමේ විද්‍යුත් පද්ධති සවි කිරීම සහ ආයතන තුලින්ම වාර්තා ලබා ගැනීමේ ක්‍රමයක් සකස් කිරීමත් සමඟ එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන ආයතනයේ (USAID) කාර්මික ආධාර වැඩසටහනක් යටතේ ක්‍රියාත්මක කරන ලද පරිගණක තැටි මඟින් වාර්තා කිරීම මඟින් දුරස්ථ පරීක්ෂා කිරීමේ ක්‍රමය වැඩි දියුණු කර ඇත. මෙම වාර්තා කිරීමේ ක්‍රමය බලපත්ලාභී විශේෂිත බැංකු හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවලටද ව්‍යාප්ත කිරීමට යෝජනා කර ඇත.

වාණිජ බැංකුවල විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි (FCBU) වත්කම් හා වගකීම්, ආදායම් හා වියදම් සහ වත්කම් හා වගකීම්වල කල්පිරීමේ රටාව පිළිබඳ දෙපාර්ත-මේන්තුවට ඉදිරිපත් කරන කාලීන වාර්තා පදනම් කර ගනිමින් එම ඒකකවල කටයුතු අධීක්ෂණය කිරීමෙහිද දෙපාර්තමේන්තුව නිරත විය.

1997 අංක 6 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධානයන් යටතේ පිහිටුවන ලද රුහුණු සංවර්ධන බැංකුව, කඳුරට සංවර්ධන බැංකුව හා රජරට සංවර්ධන බැංකුව යන සංවර්ධන බැංකු තුන පිහිටුවීමත් සමඟ, 1995 අංක 33 දරණ බැංකු සංශෝධන පනතේ ix (අ) කොටස යටතේ මහ බැංකුවේ මෙහෙයුම් අධිකාරිය යටතට පත් වූ බලපත්ලාභී විශේෂිත බැංකු සංඛ්‍යාව වැඩි විය. එම බැංකු පිහිටුවීමත් සමඟ මාතර, ගාල්ල හා හම්බන්තොට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල කටයුතු රුහුණු සංවර්ධන බැංකුව යටතටද, නුවරඑළිය, මහනුවර හා මාතලේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල කටයුතු කඳුරට සංවර්ධන බැංකුව යටතටද, අනුරාධපුර හා පොළොන්නරුව ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල කටයුතු රජරට සංවර්ධන බැංකුව යටතටද පත් විය. අදාල වර්ෂය තුලදී බලපත්‍රලාභී විශේෂිත බැංකුවල කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය සඳහා පහත සඳහන් වාර්තා කිරීමේ ආකෘති පත්‍ර එම බැංකුවලට නිකුත් කරන ලදී.

- (i) වත්කම් හා වගකීම් පිළිබඳ මාසික ප්‍රකාශනය
- (ii) ද්‍රවශීල වත්කම් පිළිබඳ මාසික ප්‍රකාශනය
- (iii) අක්‍රිය ණය පිළිබඳ ත්‍රෛමාසික ප්‍රකාශනය
- (iv) බැංකුවේ කොටස් අයිතිය පිළිබඳ ත්‍රෛමාසික ප්‍රකාශනය
- (v) අධ්‍යක්ෂවරයෙකුට හෝ සමීප ඥාතියකුට අනුමත කරන ලද ණය පහසුකම් පිළිබඳ ත්‍රෛමාසික ප්‍රකාශනය
- (vi) අධ්‍යක්ෂවරයෙකුට සැලකිය යුතු වැදගත් කමක් ඇති පාර්ශවයන්ට අනුමත කරන ලද ණය පහසුකම් පිළිබඳ ත්‍රෛමාසික ප්‍රකාශනය
- (vii) කොටස් වල ආයෝජනය පිළිබඳ ත්‍රෛමාසික ප්‍රකාශනය
- (viii) ආදායම්/වියදම් සහ ලාභ බෙද හැරීම පිළිබඳ ත්‍රෛමාසික ප්‍රකාශනය
- (ix) අනුමත කළ පුළුල් ණය පහසුකම් පිළිබඳ ත්‍රෛමාසික ප්‍රකාශනය

ඉහත සඳහන් මාසික හා ත්‍රෛමාසික ප්‍රකාශනයන් බලපත්‍රලාභී වාණිජ බැංකුවලටද නිකුත් කරන ලද අතර, පහත සඳහන් ප්‍රකාශනද ඊට ඇතුළත් කිරීමෙන් එම වාර්තාවන් මඟින් ආවරණය කෙරෙන ප්‍රමාණය තවදුරටත් පුළුල් කරන ලදී.

- (i) මිලදී ගත්/ඇප වශයෙන් ලබා ගත් පසුදතම චෙක්පත් හා ආපසු නිකුත් කරන ලද චෙක්පත් පිළිබඳ මාසික ප්‍රකාශනය,
- (ii) වර්ගීකරණය කරන ලද අත්තිකාරම් පිළිබඳ ත්‍රෛමාසික ප්‍රකාශනය.

## මෙහෙයුම් අවශ්‍යතාවයන්

විමසුමට ලක්වන වර්ෂය තුල 1995 අංක 33 දරණ බැංකු (සංශෝධන) පනතින් සංශෝධිත 1988 අංක 30

දරණ බැංකු පනතේ විධිවිධානයන් යටතේ මෙහෙයුම් අවශ්‍යතාවයන් සපුරාලීම පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩ අධීක්ෂණයන් සිදු කරන ලදී. අවදානම අනුව බර තබන ලද වත්කම්වලට අනුව තිබිය යුතු අවම ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය, අවම ද්‍රවශීල වත්කම් අනුපාතය, එක් පුද්ගලයකුට දිය හැකි උපරිම ණය සීමාව, අක්‍රිය ණය සඳහා බොල් හා අඩමාන ණය සඳහා ප්‍රමාණවත් පරිදි වෙන් කිරීම්, අධ්‍යක්ෂවරුන්ට/ඔවුන්ගේ සමීප ඥතීන්ට සහ ඔවුන්ට සැලකිය යුතු වැදගත් කමක් ඇති පාර්ශවයන්ට දිය හැකි උපරිම ණය පහසුකම් හා ව්‍යවස්ථාපිත කාලපරිච්ඡේදයක් ඇතුළත වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම යන කරුණු මත නිකුත් කරන ලද විධානයන් ක්‍රියාත්මක කිරීම ඊට ඇතුළත් විය. 1998 වසර තුලදී බැංකු රෙගුලාසි හා අධීක්ෂණ පිළිවෙත් පිළිබඳ කමිටුවේ "බාල් ප්‍රාග්ධන ගිවිසුම" පදනම් කර ගනිමින් මහ බැංකුව විසින් නියම කරන ලද ප්‍රාග්ධන අවශ්‍යතා ප්‍රමිතීන්ට අනුකූල වීමට බලපත්‍රලාභී වාණිජ බැංකු තුනක් අසමත් විය. මින් බැංකු දෙකක් අවශ්‍ය අවම ප්‍රාග්ධන අනුපාතය වූ සියයට 8 ප්‍රමාණය ළඟා කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලද අතර, අනෙක් බැංකුව නියමිත අවම මට්ටම පවත්වා ගැනීමට අසමත් විය. එම බැංකුව විසින් එහි අවශ්‍ය ප්‍රාග්ධන අනුපාතය යලිත් පවත්වා ගැනීම සම්බන්ධව ඉදිරිපත් කරන ලද යෝජනා සලකා බලනු ලැබේ. සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ විශේෂිත බැංකු විසින් බැංකු පනතට අනුව නියමිත සියයට 20 අවම ද්‍රවශීල වත්කම් මට්ටම පවත්වා ගත් අතර, එය මුළු වගකීම් වලින් සියයට 20 (අවමය) හා සියයට 42 අතර පැවතුණි. කෙසේ වුවද, අවම ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීමට අපොහොසත් වූ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කිහිපයක් බැංකු පනතේ විධිවිධානයන්ට අනුව දඩ මුදලක් ගෙවීමට යටත් විය.

උකස් කටයුතු සඳහා බැංකුවලට අවසර දෙමින් බැංකු පනතට කරන ලද සංශෝධනයන්ට අනතුරුව රාජ්‍ය බැංකු දෙක සහ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ඇතුළු බලපත්‍රලාභී වාණිජ බැංකුවල උකස් කටයුතු පාලනය කෙරෙන නීති හා රෙගුලාසි දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.

## හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්

නිසි ලෙස පිළියෙල කළ ගිණුම් හා විනිවිද පෙනෙන මූල්‍ය තොරතුරු ශක්තිමත් බැංකු ක්‍රමයක් හා මූල්‍ය ක්‍රමයක් සඳහා ප්‍රබල ආධාරකයක් බව "බාල්" කමිටුව විසින් නිකුත් කරන ලද ඵලදායී බැංකු අධීක්ෂණයක මූලික සිද්ධාන්ත පිළි ගනියි. ශක්තිමත් බැංකු ක්‍රමයක් ඇති කිරීමේ උපක්‍රමයක් වශයෙන්, තොරතුරු පදනම් කර තීරණ ගැනීමේ වෙළෙඳපොල හැකියාව දියුණු කෙරෙන හෙළිදරව් කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීමට දෙපාර්තමේන්තුව විසින් පියවර ගන්නා ලදී. ඒ අනුව බැංකු පනතේ V වන කොටසේ අංක 38(1) වගන්තිය යටතේ, ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් අංක 23 ඇතුළත් කරමින් නියමිත සංශෝධිත ආකෘතියක් හඳුන්වා දෙන ලදී. මෙම ආකෘතියට අනුව පහත සඳහන් තොරතුරු හෙළි කිරීමට බැංකුවලට සිදු වේ.

(i) ශේෂ පත්‍ර දිනයේ සිට ගිවිස ගත් කල් පිරීමේ දිනය තෙක් ඉතිරිව ඇති කාලය පදනම් කර ගනිමින්, අදාල කල් පිරීමේ කාණ්ඩවලට අනුව කෙරෙන වත්කම් හා වගකීම්වල විග්‍රහයක් ;

(ii) ගණුදෙනුකරුවන් හෝ ව්‍යාපාරික කාණ්ඩ අනුව වත්කම්, වගකීම්, ශේෂ පත්‍රයෙන් පරිබාහිර අයිතමයන් සහ වෙනත් අවදානම්වල සැලකිය යුතු නැඹුරුවීම් ;

(iii) සැලකිය යුතු ශුද්ධ විදේශ ව්‍යවහාර මුදල් නිරාවරණයන්හී ප්‍රමාණය ;

(iv) අය කරගත නොහැකි ණය මුදල්, අත්තිකාරම් හා මූල්‍යමය කල්බදු වියදමක් හෝ කපා හැරීමක් ලෙස තීරණය කිරීමට පදනම් කෙරෙන ගණකාධිකරණ ප්‍රතිපත්ති ; අදල කාලපරිච්ඡේදය තුලදී ණය මුදල්, අත්තිකාරම් හා මූල්‍යමය කල්බදු මගින් සිදු වන අලාභ වෙනුවෙන් කෙරෙන වෙන් කිරීම්වල වෙනස්වීම් පිළිබඳ විස්තර සහ එවැනි අලාභයන් සඳහා කෙරෙන වෙන් කිරීම්වල එකතුව ;

(v) බැංකුවේ අවදානම් තත්ත්වය, එහි ලාභදායිත්වය හා එයට සහාය වීමට ඇති ප්‍රාග්ධනය පිළිබඳ විස්තර ;

(vi) සුරැකුම් සහිත වගකීම්වල සමස්ත එකතුව සහ ඇප වශයෙන් බැඳීමට යටත් වූ වත්කම්වල ස්වභාවය හා ඒවායේ අගය ;

(vii) භාරකාරත්ව කටයුතු ;

(viii) සියලුම ඥති පාර්ශවයන්ට හා මොනයම් ආකාරයකින් හෝ සම්බන්ධතාවයක් ඇති සියළුම පාර්ශවයන්ට දී ඇති බැංකු පහසුකම් ;

මීට අමතරව, දෙපාර්තමේන්තුව විසින් බැංකු පනතේ 38 "අ" වගන්තියට අනුව විගණකවරුන්ගේ මණ්ඩලයක් පිහිටුවන ලදී. අනුමත කරන ලද නිර්නායකයන්ට අනුව, ජාත්‍යන්තර විගණක සමාගම්වලට අනුබද්ධිත සමාගම් කිහිපයක් ඇතුළු විගණක සමාගම් 10 ක් මෙම මණ්ඩලය සඳහා තෝරා ගන්නා ලදී. බැංකු විසින් සිය විගණකයන් තෝරාගත යුත්තේ මෙම මණ්ඩලයෙනි. තවද, බැංකු පනතේ 39 වගන්තියට අනුව ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් අංක 23 හා 30 යටතේ කෙරෙන විගණනයන්ට හා එවැනි විගණනයන්ට අදල වෙනත් ප්‍රමිතීන්ට අමතරව කෙරෙන විගණන කටයුතුවලට අදල නොයෙකුත් ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා බාහිර විගණකවරුන්ට මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

බලපත්‍රලාභී වාණිජ බැංකුවල අර්ධ වාර්ෂික ගිණුම් හා විගණිත වාර්ෂික ගිණුම් දිනපතා පුවත්පත්වල පළ කළයුතු වීමෙන් හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් තවදුරටත් ශක්තිමත් කරන ලදී.

## වසර 2000 දී පරිගණක සම්බන්ධ ගැටලුව

ශත වර්ෂ දිනය වෙනස් වීම සඳහා වූ ප්‍රශ්නය පිළිබඳ දැනුවත් කිරීමට, බැංකු ක්ෂේත්‍රය තුලින් ඊට සුදුසු පියවර ගැනීමට හා එම ප්‍රශ්නයට අදාලව බැංකු අංශය විසින් කටයුතු කෙරෙන ආකාරය අධීක්ෂණය කිරීමට කාර්ය බලකායක් 1998 දී පිහිටුවන ලදී. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් හා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මේ සඳහා මුදා හරින ලද නිලධාරීන් ඒකාබද්ධව කටයුතු කරනු ඇත. විමසුමට ලක්වන වර්ෂය තුලදී වසර දෙදහේ ප්‍රශ්නයට අදාලව කටයුතු සූදනම් කිරීම සඳහා බැංකුවලට ඇති හැකියාවන් තක්සේරු කිරීමෙහි ලා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාශීලීව නිරත විය.

## 1998 දී නිකුත් කළ නියෝග

1998 වසර තුලදී දෙපාර්තමේන්තුව විසින් 1995 අංක 33 දරණ බැංකු පනතින් සංශෝධිත 1998 අංක 30 දරණ බැංකු පනතේ 46(1)(ඇ) වගන්තිය යටතේ, බලපත්ලාභී වාණිජ බැංකුවල කොටස් ප්‍රාග්ධන අයිතිය සම්බන්ධ නව නියෝගයක් නිකුත් කරන ලදී. මෙම නියෝගය මහින්, බැංකු පනතේ අංක 46 (1)(ඇ) (i) දරණ වගන්තියට අනුව කිසියම් සමාගමක්, සංස්ථාපිත ආයතනයක් හෝ පුද්ගලයෙකු නමින් බලපත්‍රලාභී වාණිජ බැංකුවක නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙහි තිබිය හැකි සියයට 15 උපරිම සීමාව එසේම පවතින අතර, අංක 46(1)(ඇ)(ii)(අ) වගන්තියට අනුව සමාගමක් හා එහි පාලිත සමාගමක් හෝ සමාගම් කිහිපයක්, පාලන සමාගමක් හෝ එහි පාලන සමාගමක පාලිත සමාගමක් සතුව බලපත්‍රලාභී වාණිජ බැංකුවක නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙහි තිබිය හැකි මුළු උපරිමය සියයට 20 ක් ලෙස සංශෝධනය කරන ලදී.

එසේම බැංකු පනතේ 46(1)(ඇ)(ii)(ආ) වගන්තියට අනුව පුද්ගලයෙකුට හා ඔහුගේ/ඇයගේ ළඟම ඥාතියෙකුට හෝ ඥාතීන් කිහිප දෙනෙකුට හෝ, එවැනි පුද්ගලයෙකුට හෝ ඔහුගේ/ඇගේ ඥාතීන්ට සැළකිය යුතු අයිතියක් ඇති සමාගමකට බලපත්‍රලාභී වාණිජ බැංකුවක නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙහි දැරිය හැකි අයිතියේ මුළු උපරිමයද සියයට 20 ක් වශයෙන් සංශෝධනය කෙරුණි.

මීට අමතරව, බැංකුවක් වශයෙන් ස්ථාපනය කරන ලද සමාගමක් පිහිටුවීමෙහිලා ප්‍රධාන වශයෙන් වගකිව යුතු බවට මුදල් මණ්ඩලය විසින් තීරණය කෙරෙන, විශ්වාසනීයත්වය හා මූල්‍ය තත්ත්වය අතින් ව්‍යාපාරික ප්‍රජාව අතර සැකයට භාජනය නොවන ප්‍රවර්ථකයකුට සමාගමක්, සංස්ථාපිත ආයතනයක් හෝ පුද්ගලයෙකු වශයෙන් බැංකුවේ නිකුත් කළ ප්‍රාග්ධනයෙන් සියයට 25 ක් නොඉක්මවන මුළු උපරිම කොටස් අයිතියක් තබා ගැනීමට මෙම නියෝගය මගින් අවසර දෙන ලදී.

එසේම, 1995 අංක 33 දරණ බැංකු පනතේ සංශෝධිත 1988 අංක 30 දරණ බැංකු පනතේ 76(ජේ)(i) වගන්තිය යටතේ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පත් සම්බන්ධයෙන් සියළුම බලපත්ලාභී විශේෂිත බැංකුවලටද නව මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. මෙමගින්, එක් මසක් තුලදී සිව් වරකට වැඩියෙන් මුදල් ආපසු ගන්නා ඉතිරි කිරීමේ ගිණුම්වලට සහ කල් පිරීමට පෙර මුදල් ආපසු ගන්නා සත් දින ඒක්ෂණ තැන්පතුවලට පොලී ගෙවීම සීමා කෙරේ. අලුතින් පනවන ලද මෙම සීමාවන් බලපත්ලාභී වාණිජ බැංකුවලට පනවන ලද සීමාවන් හා සැසඳේ.

විමසුමට ලක් වන වසර තුලදී දෙපාර්තමේන්තුව බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් එක් ගණුදෙනුකරුවෙකුට දිය හැකි උපරිම ණය සීමාවට අදාලව, මෙහෙයුම් නියෝග කෙටුම්පත් කිරීමෙහි නිරත විය.

## තැන්පතු රක්ෂණ ක්‍රමය

1987 දී ආරම්භ කරන ලද තැන්පතු රක්ෂණ ක්‍රමය සම්බන්ධ පරිපාලන කටයුතු දෙපාර්තමේන්තුව විසින් නොකඩවා සිදුකරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වූ ආයතන සංඛ්‍යාව 7 කි. ඉන් 3 ක් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුද, ඉතිරි 4 විවිධ සේවා සමුපකාර සමිතිද විය. තැන්පතු රක්ෂණ වාරිකය සෑම රු. 100 කට ශත 3.75 ක් වූ අතර, එමගින් 1998 වසරේදී එකතු කළ මුළු වාරික මුදල රුපියල් දශ ලක්ෂ 1.64 කි. 1998 දෙසැම්බර් මස 31 වෙනි දිනට මුළු තැන්පතු රක්ෂණ අරමුදල රුපියල් දශ ලක්ෂ 79.58 ක් වූ අතර, එහි මහ බැංකුව විසින් වෙන් කරන ලද අරමුදල සඳහා රුපියල් දශ ලක්ෂ 50 ක් ද අඩංගු විය.

## බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව ලියාපදිංචි මූල්‍ය ආයතනවල ප්‍රාග්ධනයේ ප්‍රමාණවත් බව, ඥාණාන්විත පරිපාලනය සහ මූල්‍ය ස්ථාවරත්වය ඇති බවට සහතික කිරීමේ අරමුණින් තවදුරටත් අධීක්ෂණ ක්‍රියාවලියෙහි නිරත විය. ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන වශයෙන් මූල්‍ය සමාගම්වල ස්ථානගත පරීක්ෂණ හා එම සමාගම් විසින් සපයනු ලබන දත්ත විශ්ලේෂණය ඇසුරෙන් නිරන්තර අවධානයෙන් සිටීම නොකඩවා කරගෙන යන ලදී.

### මූල්‍ය සමාගම් ක්‍රියාකාරීත්වයේ සමාලෝචනය

1997.03.31 දිනට හා 1998.03.31 දිනට ලියාපදිංචි මූල්‍ය සමාගම් 25 හි ඒකාබද්ධ ශේෂ පත්‍රය II-7 සංඛ්‍යා සටහනෙහි දක්වේ. ලියාපදිංචි මූල්‍ය සමාගම්වල මුළු වත්කම් පසුගිය වසරට වඩා රුපියල් බිලියන 3.7 ක් හෙවත් සියයට 19.7 කින් වැඩිවිය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ ද්‍රවශීල වත්කම්වල රුපියල් මිලියන 684.7 හෙවත් සියයට 32.7 ක වර්ධනයවීම හා අත්තිකාරම් රුපියල් බිලියන 1.5 ක් හෙවත් සියයට 11.6 වර්ධනයයි. ප්‍රධාන වත්කම්වල සංයුතියේ එතරම් වෙනසක් සිදු නොවූ අතර, පසුගිය වසරේ මෙන්ම මේ වසරේද මුළු අත්තිකාරම් වැඩි ප්‍රමාණයක් කල්බදු වලින් නියෝජනය විය. වත්කම් වර්ධනයට දායක වූයේ තැන්පතු රුපියල් බිලියන 3.6 ක් හෙවත් සියයට 33.2 කින් හා ප්‍රාග්ධන අරමුදල් රුපියල්

II - 7 වැනි සටහන

## ක්‍රියාත්මක වන මූල්‍ය සමාගම්වල ඒකාබද්ධ ශේෂ පත්‍රය

| | 1997.03.31 දිනට | | 1998.03.31 දිනට | | වෙනස |
|---|---|---|---|---|---|
| | රු. .000 | ප්‍රතිශතය | රු. .000 | ප්‍රතිශතය | % |
| **වගකීම්** | | | | | |
| **1. ප්‍රාග්ධන අරමුදල්** | | | | | |
| නිකුත් කළ ප්‍රාග්ධනය | 495,094 | | 620,882 | | |
| කොටස් අධි මිල | 205,373 | | 190,546 | | |
| ප්‍රාග්ධන සංචිතය | 527,275 | | 843,104 | | |
| පොදු සංචිතය | 768,470 | | 1,094,003 | | |
| සංචිත අරමුදල | 378,945 | | 474,114 | | |
| වෙනත් සංචිත | 219,700 | | 58,145 | | |
| ලාභාලාභ ගිණුමේ ශේෂය | 63,746 | | 96,099 | | |
| **දළ ප්‍රාග්ධන අරමුදල** | **2,658,603** | | **3,376,893** | | |
| අඩු කළා: විලම්බිත ගෙවුම් | 10,428 | | 8,664 | | |
| **ශුද්ධ ප්‍රාග්ධන අරමුදල** | **2,648,175** | **13.76** | **3,368,229** | **14.63** | **27.19** |
| **2. බොල් හා අඩමාන ණය වෙන්කිරීම** | **1,280,979** | **6.66** | **937,940** | **4.07** | **-26.78** |
| **3. මහජන තැන්පතු** | **11,088,338** | **57.62** | **14,773,980** | **64.15** | **33.24** |
| **4. ණය** | | | | | |
| බැංකු අයිරා | 314,760 | | 389,766 | | |
| වෙනත් | 888,446 | | 386,249 | | |
| **මුළු ණය** | **1,203,206** | **6.25** | **776,015** | **3.37** | **-35.50** |
| **වෙනත් වගකීම්** | **3,022,086** | **15.71** | **3,173,670** | **13.78** | **5.02** |
| **මුළු එකතුව** | **19,242,784** | **100.00** | **23,029,834** | **100.00** | **19.68** |
| **වත්කම්** | | | | | |
| **1. ද්‍රවශීල වත්කම්** | | | | | |
| අතැති මුදල් හා බැංකු ශේෂය | 305,035 | | 331,431 | | |
| ස්ථාවර තැන්පතු | 488,403 | | 613,589 | | |
| කෙටිකාලීන ආයෝජන | 14,816 | | 32,350 | | |
| භාණ්ඩාගාර බිල්පත් | 1,284,528 | | 1,800,127 | | |
| **මුළු ද්‍රවශීල වත්කම්** | **2,092,782** | **10.88** | **2,777,497** | **12.06** | **32.72** |
| **2. ආයෝජන** | | | | | |
| ආශ්‍රිත සමාගම් හා පාලිත | 309,241 | | 382,560 | | |
| අනුබද්ධ සමාගම්වල කොටස් | 167,999 | | 256,653 | | |
| වෙනත් සමාගම්වල කොටස් | 600,183 | | 705,663 | | |
| වෙළෙඳ ආයෝජන | 52,183 | | 224,915 | | |
| **මුළු ආයෝජන** | **1,129,606** | **5.87** | **1,569,791** | **6.82** | **38.97** |
| **3. අත්තිකාරම්** | | | | | |
| ණය | 822,634 | | 872,845 | | |
| කුලී සින්නක්කර ණය | 2,374,695 | | 3,421,408 | | |
| කල්බදු ණය | 7,326,206 | | 7,783,084 | | |
| නිශ්චල දේපළ ණය | 932,161 | | 1,110,212 | | |
| වෙනත් අත්තිකාරම් | 1,510,810 | | 1,282,104 | | |
| **මුළු අත්තිකාරම්** | **12,966,506** | **67.38** | **14,469,653** | **62.83** | **11.59** |
| **4. ස්ථාවර වත්කම්** | | | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 935,058 | | 1,565,737 | | |
| ගෘහ භාණ්ඩ සවිකිරීම හා කාර්යාලීය උපකරණ | 235,568 | | 200,217 | | |
| මෝටර් රථ | 96,446 | | 177,048 | | |
| යන්ත්‍රසූත්‍ර | 8,413 | | 5,567 | | |
| බදු සින්නක්කර | 55,870 | | 47,025 | | |
| වෙනත් | 24,271 | | 21,802 | | |
| **මුළු ස්ථාවර වත්කම්** | **1,355,626** | **7.04** | **2,017,396** | **8.76** | **48.82** |
| **5. වෙනත් වත්කම්** | **1,698,264** | **8.83** | **2,195,497** | **9.53** | **29.28** |
| **6. මුළු එකතුව** | **19,242,784** | **100.00** | **23,029,834** | **100.00** | **19.68** |
| **වාර්තා කළ සමාගම් ගණන** | 25 | | 25 | | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

මිලියන 720.0 ක් හෙවත් සියයට 27.2 කින් වැඩිවීමයි. මූල්‍ය සමාගම්වල අයකරගත නොහැකි ණය කපා හැරීම නිසා බොල් හා අඩමාන ණය වෙන් කිරීම රුපියල් මිලියන 343.0 කින් හෙවත් සියයට 26.8 කින් අඩුවිය.

## ලියාපදිංචි මූල්‍ය සමාගම් පාලනය හා අධීක්ෂණය

විමර්ශනයට ලක්වූ කාලය තුළදී 1988 අංක 78 දරණ මුදල් සමාගම් පනත යටතේ පනවා ඇති නියෝග හා රෙගුලාසිවලට අනුකූලව ලියාපදිංචි මූල්‍ය සමාගම් 25 කටයුතු කරන බව සහතික වනු වස්, එම සමාගම් විසින් අඛණ්ඩව සපයනු ලබන කාලීන වාර්තා ඇසුරෙන් නිරන්තර අවධානයෙන් සිටීම මගින් අධීක්ෂණය කරන ලදී. ඉහත කාර්යය සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් සතිපතා ද්‍රවශීල වත්කම් ප්‍රකාශන, දෙන ලද වටිනාකමෙන් වැඩි අත්තිකාරම් පිළිබඳ මාසික වාර්තා, මාසික වත්කම් හා බැරකම් ප්‍රකාශන, ආපසු නොගෙවන ණය මුදල් පිළිබඳ ත්‍රෛමාසික වාර්තා සහ විගණනය කරන ලද වාර්ෂික ශේෂපත්‍ර නොකඩවා ලබා ගන්නා ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන තුලින් මණ්ඩලය විසින් නිකුත් කරන ලද නියෝග සහ රෙගුලාසි වල අනුකූලතාවය අධීක්ෂණය කිරීමට හැකිවීය. මේ සඳහා අවම ප්‍රාග්ධනය, ද්‍රවශීල මට්ටම, තනි පුද්ගලයෙකුට දියහැකි ණය ප්‍රමාණය, බොල් හා අඩමාන ණය වෙන්කිරීමේ ප්‍රමාණවත් බව යනාදී කරුණු ඇතුළත් විය. මෙම කාලය තුල ලියාපදිංචි මූල්‍ය සමාගම්වල ලාභදායිත්වය හා වර්ධනය, සමීපව නිරීක්ෂණය කිරීම මගින් අයහපත් වර්ධනයක් ඇත්දැයි හඳුනා ගැනීමට හා ඒවා වළක්වාලීමට කටයුතු යොදන ලදී.

වසර තුලදී දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය සමාගම් තුනක ස්ථානීය පරීක්ෂණ සිදුකරන ලදී. තවද, මෙම කාලය තුලදී දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය සමාගම්වල ගිණුම් පොත් හා වෙනත් වාර්තා පරීක්ෂා කිරීම මගින් සහ සමාගමෙහි නිලධාරීන් සමග සාකච්ඡා කිරීම තුලින් ලබාගත් තොරතුරු මත ප්‍රාග්ධනයෙහි ප්‍රමාණවත් බව, වත්කම්වල ගුණාත්මක බව, ඉපැයීම් ප්‍රමාණවල ගුණාත්මක බව, ද්‍රවශීලතාව සහ කළමනාකාරිත්වයේ හැකියාව ඇගයීමකට භාජනය කරන ලදී. එමෙන්ම අභ්‍යන්තර පාලන ක්‍රමවල සාර්ථකත්වය සහ සත්‍ය හා කාලීන කළමනාකරණ තොරතුරු සැපයීමේ හැකියාවද අගයන ලදී.

සවිස්තරතාත්මකව කරනු ලබන ස්ථානීය පරීක්ෂණවලට අතිරේක වශයෙන් මෙකී සමාගම්වල තීරණාත්මක අංශ පරීක්ෂාවට ලක් කරමින් හදිසි පරීක්ෂණ ද සිදුකරන ලදී. විමර්ශනයට භාජනය කළ යුතු අංශ කාලීනව එවනු ලබන තොරතුරු තුලින් කෙරෙන පරීක්ෂාවන් තුලින් හෙළි කරනු ලබන තොරතුරු මත රඳා පවතී. වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමට පෙරද මූල්‍ය සමාගම් හදිසි පරීක්ෂණවලට භාජනය කරන ලදී.

## දුෂ්කරතාවයට පත් මූල්‍ය සමාගම්

මූල්‍ය සමාගම් පනත යටතේ මුදල් මණ්ඩලය වෙත පවරාගනු ලැබූ මූල්‍ය සමාගම් 5 ක පරිපාලනය හා කළමනාකරණ කටයුතු තවදුරටත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී., දුෂ්කරතාවයට පත් මූල්‍ය සමාගම්වල තැන්පතුකරුවන් සඳහා සහන සැලසීමේ ක්‍රමය යටතේ එවැනි සමාගම් දෙකක තැන්පතුකරුවන් සඳහා සහන සපයන ලදී. ඒ සඳහා එම සමාගම්වල වත්කම් විකිණීමෙන් හා අත්තිකාරම් ආපසු අයකර ගැනීමෙන් ලැබූ මුදල් යොදා ගන්නා ලදී.

දුෂ්කරතාවයට පත් තවත් මූල්‍ය සමාගමක ප්‍රධාන කාර්යාලය විකිණීමෙන් ලැබූ මුදල් යොදවා ඇති කරනු ලැබූ භාරකාර අරමුදලින් එහි තැන්පතු වලින් කොටසක් ආපසු ගෙවීමද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. මෙම භාරකාර අරමුදල මගින් 1998.12.31 දින වනවිට තැන්පතුකරුවන් 1,963 දෙනෙකුට රුපියල් දශලක්ෂ 72.04 ක් ගෙවන ලදී. දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන විධිවිධාන කඩ කරන ලද සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට විරුද්ධව නඩු පැවරීම් සාර්ථක වූ අතර එමගින් 1998.12.31 දිනට එකතු කර ගන්නා ලද දඩ මුදල රුපියල් දශලක්ෂ 2.4 ක් විය.

## ප්‍රතිපත්ති හඳුන්වාදීම

මූල්‍ය සමාගම්වලට දැනට නිකුත් කර ඇති විධාන සහ අළුතින් පැනවීමට යෝජිත විධාන සංශෝධනය කිරීම සඳහා මූල්‍ය සමාගම්වලට දැනුම්දීම හා අදහස් දැනගැනීම පිණිස, මූල්‍ය ආයතන සංගමය, සමග දෙපාර්තමේන්තුව විසින් සාකච්ඡා පැවැත්වූ අතර, ඒ තුල වත්කම් අවදානම මත බර තැබූ අවම ප්‍රාග්ධන අනුපාත හඳුන්වා දීම, වඩාත් දැඩි ලෙස ආදයම් හඳුනාගැනීම නිර්වචනය කිරීමේ ප්‍රමිතීන් ඇතිකිරීම, බොල් හා අඩමාන ණය වෙන්කිරීම වෙනුවෙන් වඩාත් දැඩි උපදෙස් නිකුත් කිරීම, මූල්‍ය සමාගම් විසින් කර ගෙන යා හැකි විවිධ කාර්යයන් සීමා කිරීමද අඩංගු විය.

## මූල්‍ය වෙළෙඳපොළ දෙපාර්තමේන්තුව

ණය වෙළෙඳපොළ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ සංවර්ධනය සඳහා හිතකාමී ප්‍රතිපත්තිමය පරිසරයක් ගොඩනැංවීම, මූල්‍ය වෙළෙඳපොළ දෙපාර්තමේන්තුවේ පුළුල් පරමාර්ථය වේ. මූල්‍ය වෙළෙඳපොළේ කාර්‍යක්ෂම හා මනා ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍යවන්නා වූ යෝග්‍ය සානුබල හා ආයතනික ආධාර හඳුනා ගැනීමත්, ක්‍රියාකාරිත්ව හා නියාමක පද්ධතීන් වර්ධනය කිරීමත් මීට ඇතුළත් වේ.

දෙපාර්තමේන්තුවේ තවත් කාර්යයක් වන්නේ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින මූල්‍ය වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීමත්, මූල්‍ය වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ වැඩසටහන් කමිටුව වෙනුවෙන් එහි ප්‍රගතිය අධීක්ෂණය කිරීමත්ය. ජාත්‍යන්තර ආධාර ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රටේ මූල්‍ය අංශයට අදාළව ක්‍රියාත්මක කරනු ලබන තාක්ෂණික ආධාර ව්‍යාපෘතිවලට අදාළ කටයුතු, ඒවා මූල්‍යයනය කරනු ලබන ජාත්‍යන්තර ආධාර ආයතන සමග

සම්බන්ධීකරණය කිරීම දෙපාර්තමේන්තුවේ තවත් එක් කාර්යයක් වේ.

විමර්ශනයට භාජනය වන කාලය තුළ, දෙපාර්තමේන්තුව කාර්යයන් රැසක් හා සම්බන්ධව කටයුතු සම්බන්ධීකරණය කිරීමේ කාර්යයෙහි නියුතු විය.

## ණය වර්ගීකරණ ආයතනය

ණය වෙළෙඳපොළ සංවර්ධනය කිරීමේ උපාය මාර්ගයේ කොටසක් වශයෙන් ණය වර්ගීකරණ ආයතනයක් පිහිටුවාලීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදී. ඒ සඳහා අභිප්‍රාය පළ කිරීමේ ලිපියකට ප්‍රධාන පෙළේ ඇමෙරිකානු ණය වර්ගීකරණ ආයතනයක් වන ඩෆ් ඇන්ඩ් පෙල්ප්ස් ක්‍රෙඩිට් රේටින් සමාගම (ඩීසීආර්) සමඟ 1998 ජූලි මස අත්සන් තබන ලදී. ඩීසීආර් ආයතනය ප්‍රධාන කොටස්කරු හා තාක්ෂණික හවුල්කරු වන මෙම නව ණය වර්ගීකරණ ආයතනය, සමාගම් පනත යටතේ සීමිත සමාගමක් ලෙස පිහිටුවනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව, රේටින් ඒජන්සි මැලේසියා බර්හාඩ්, ජාත්‍යන්තර මූල්‍ය සමායතනය සහ දේශීය මූල්‍ය ආයතන (බැංකු, අර්ථසාධක අරමුදල්, රක්ෂණ හා මූල්‍ය සමාගම්) කිහිපයක් මෙහි අනිත් කොටස්කරුවෝ වෙති. 1999 වසරේ මුල් කාලය තුළ ඩෆ් සහ පෙල්ප්ස් ලංකා ණය වර්ගීකරණ ආයතනය (ඩීසීආර් ලංකා) සංස්ථාගත කිරීමට නියමිතය. සමාගම තම ව්‍යාපාරික කටයුතු 1999 දෙවන භාගය තුළ ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. ආරම්භයේදී ඩීසීආර් ලංකා ආයතනය ස්ථාවර ආදායම් සුරැකුම්පත් නිකුතු සහ අනෙකුත් සම්බන්ධිත සේවාවන් සඳහා වර්ගීකරණයන් ලබාදෙනු ඇත.

## ණය වෙළෙඳපොළ සංවර්ධනය සඳහා වූ බදු සහනබල

ශ්‍රී ලංකා මහ බැංකුව, භාණ්ඩාගාර හා සමාගම් ණය සුරැකුම්පත් ගණුදෙනුවලදී බලපානු ලබන බදු හා මුද්දර ගාස්තු පිළිබඳව යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන ලද අතර, එම යෝජනා 1997 හා 1998 වර්ෂවලදී ක්‍රියාත්මක කරන ලදී. භාණ්ඩාගාර බැඳුම්කර මත අයකරනු ලැබූ ප්‍රාග්ධන හා රඳවා ගැනීමේ බද්ද ඉවත් කිරීම, ලැයිස්තුගත ණයකර පැවරීමේදී අයකරනු ලැබූ මුද්දර බද්දෙන් නිදහස් කිරීම, වාණිජ පත්‍ර මත අයකරනු ලැබූ මුද්දර ගාස්තු සහ භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත අය කරනු ලැබූ මුද්දර ගාස්තු අඩුකිරීමද මෙයට ඇතුළත් විය. 1998 දී ශ්‍රී ලංකා මහ බැංකුව ලැයිස්තුගත ණයකර නිකුතු, වාණිජපත්‍ර ගණුදෙනු සහ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවලට අදාළ ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් යනාදිය මත අයකරනු ලැබූ මුද්දර ගාස්තු ඉවත් කළ යුතුය යන්න අනුමත කරන ලදී. 1999 වසර සඳහා වූ අයවැය මගින් පහත සඳහන් වෙනස්කම් කරන ලදී.

1. ණයකර හා පොරොන්දු නෝට්ටු වැනි ලැයිස්තුගත ණය උපකරණ නිකුත් කිරීමේදී අයකරනු ලැබූ, රු.1000/-ක් හෝ එහි කොටසක් සඳහා වූ රු.10/-ක මුද්දර ගාස්තුව ඉවත් කිරීම.
2. භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත අයකරනු ලැබූ රු.10/- ක් වූ මුද්දර බද්ද ඉවත් කිරීම.
3. ලැයිස්තුගත ණයකර හා ණය සුරැකුම්පත් වලින් ලැබෙන පොලිය මත අයකරනු ලැබූ සියයට 10 ක් වූ රඳවා ගැනීමේ බද්ද ඉවත් කිරීම.
4. කොටස් බලපත්‍ර හා අනෙකුත් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මත අයකරනු ලැබූ ප්‍රාග්ධන බද්ද ඉවත් කිරීම.

## ශ්‍රී ලංකා රජය හා රාජ්‍ය වාණිජ බැංකු අතර ඇතිකර ගන්නා ලද ගිවිසුම්

ශ්‍රී ලංකා රජය සහ ලංකා බැංකුවත්, මහජන බැංකුවත් අතර ගිවිසුම් 1998 ජූලි 16 වැනි දින අත්සන් කරන්නට යෙදිණි. මෙම ගිවිසුම්වල අරමුණු වන්නේ බැංකුවල කාර්යයන් වාණිජ පදනමක් මත ගෙන යාමත් හා ඒවා තවදුරටත් ශක්තිමත් කර ගැනීමත්, ඵලදායීතාවය ඉහළ නැංවීමත්, පිරිවැය අඩුකිරීමත්, සේවක මට්ටම් හා ශාඛා පද්ධතිය විධිමත් කිරීමත්, වත්කම් සංරක්ෂණය කිරීමත්, ණය ආපසු අයකර ගැනීම ඉහළ නැංවීමත් සහ අවදානම් මනා ලෙස කළමනාකරණය කිරීමත් යනාදී ක්‍රියාමාර්ග තුළින් බැංකුවල ලාභදායිකත්වය, කාර්යක්ෂමතාවය හා මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කිරීමයි. ගිවිසුම්වල ප්‍රධාන ලක්ෂණ පහත දක්වෙන පරිදි වේ.

i. බැංකු කළමනාකාරිත්වයට පරිපාලනමය ස්වාධීනත්වය ලබාදීම.
ii. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හා සාමාන්‍යාධිකාරි තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් නියම කිරීම.
iii. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් ද සමන්විත වන අභ්‍යන්තර විගණන කමිටුවක් පත්කිරීම.
iv. ලාභය, පරිපාලන පිරිවැය, ණය ආපසු අයකර ගැනීම සහ අක්‍රීය ණය යනාදිය සඳහා ප්‍රමාණාත්මක ඉලක්ක නියම කිරීම.
v. සේවක මට්ටම විධිමත්ව පවත්වා ගැනීම.
vi. පාඩු ලබන ශාඛාවල කටයුතු විධිමත් කිරීම.
vii. ණය ගෙවීම් පැහැර හැරි පුද්ගලයන් හට ණය පහසුකම් ලබාදීම සීමාකිරීම.
viii. රජය වෙනුවෙන් බැංකු විසින් ඉටුකරනු ලබන වාණිජමය නොවන සේවාවන් සඳහා ගෙවීම් කිරීම.

ix. රජයේ ඉල්ලීම මත ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් සඳහා අදාළ විය යුතු කොන්දේසි, නියමයන් හා ක්‍රියාපිළිවෙත් නියම කිරීම.

x. ශ්‍රී ලංකා රජය විසින් බැංකුවලට ලබා දෙන ඇපකර පිළිබඳ ප්‍රකාශනයක් මුදල් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු වීම.

කළමනාකාරිත්වයට පරිපාලනමය ස්වාධීනත්වය ලබාදීම හා වාර්ෂික ප්‍රමාණාත්මක කාර්ය සාධන ඉලක්කයන් නියම කිරීම තුළින් බැංකුවල අභ්‍යන්තර පරිපාලනයත්, මූල්‍ය තත්ත්වයත් වර්ධනය කිරීම මෙම ගිවිසුම් වලින් අපේක්ෂා කෙරේ. ලාභදායිත්වය පිළිබඳ නිර්නායකයන් වූ ප්‍රාග්ධනය මත ඉපයීම හා වත්කම් මත ඉපයීම්ද, කාර්යක්ෂමතාවය මනිනු ලබන සාමාන්‍ය වත්කම් මත සේවක පිරිවැය හා පොදු කාර්ය පිරිවැයද, මූල්‍ය ස්ථාවරත්වයට අදාළ අක්‍රීය ණය මට්ටම් හා ණය ආපසු අයකර ගැනීමද මෙම ඉලක්කවලට ඇතුලත් වේ. ශාඛා පද්ධතිය විධිමත් කිරීමෙන් හා සේවක මට්ටම් සීමා කිරීමෙන්, පරිපාලන පිරිවැය හා මූල්‍ය අතරමැදි පිරිවැය පහත හෙළීමද ගිවිසුම්වල නව ඉලක්කයකි. අදල ඉලක්කයන් හා අනෙකුත් අවශ්‍යතාවයන් ඉටුකරගත් ආකාරය දක්වමින් බැංකු විසින් කාර්තුමය පදනමක් මත රජයට හා මහ බැංකුවට වාර්තා සැපයිය යුතුවේ. මහ බැංකුව රජය වෙනුවෙන් ගිවිසුම් සඳහා වන අනුකූලතාවයන් අධීක්ෂණය කෙරේ.

ශාඛා පද්ධතියේ ලාභදායිත්වය හා සාර්ථකත්වය මැන බැලීමේ අරමුණින්, රජයේ වාණිජ බැංකු සඳහා සම්මත ශාඛා ශ්‍රේණිකරණ ක්‍රමයක් හඳුන්වාදීමට අදළ පියවර ද ගනු ලැබීය. ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව හා වරලත් ගිණුම්කරණ ආයතනයකින් සැදුම්ලත් ක්‍රියාකාරී කමිටුවක් විසින් ශාඛා සඳහා ඒකීය හුවමාරු මිල කිරීමේ හා පිරිවැය විභජනය කිරීමේ ක්‍රමයක් නිර්දේශ කරන ලදී. බැංකු විසින් 1999 වසරේදී මෙම නව ශාඛා ශ්‍රේණිකරණ ක්‍රමය ක්‍රියාත්මක කරනු ඇත.

ලංකා බැංකුවේ හා මහජන බැංකුවේ ණය හා ආයෝජන විගණනය කිරීම සඳහා අදළ කටයුතුද සංවිධානය කරනු ලැබීය. මෙම විගණනයේ මූලික පරමාර්ථය වන්නේ බැංකුවේ ණය හා ආයෝජනවල ගුණාත්මකභාවයත්, ඒ සඳහා තිබිය යුතු ප්‍රතිපාදන මට්ටමත් නිශ්චය කිරීමයි. පුද්ගලික විගණන ආයතනයක් විසින් විගණන සම්මුතීන්ට අනුකූලවන පරිදි මෙම වත්කම් විගණනය කරනු ඇත. මෙම වත්කම් විගණනය 1999 මාර්තු මස ආරම්භවීමට නියමිත අතර එය තුන් මසකින් නිම කිරීමට අපේක්ෂා කෙරේ.

## නීති හා අණපනත් සම්පාදනය

වර්ෂය තුලදී පනත් කිහිපයක් කෙටුම්පත් කරනු ලැබූ අතර ඒවා 1999 වසරේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

**(අ) මුදල් නීති පනතට කරන ලද සංශෝධනයන්**: මිල ස්ථාවරත්වය ප්‍රධාන අරමුණ වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු සංශෝධනය කරනු ලැබේ. අනෙකුත් යෝජිත සංශෝධන, මුදල් සැපයුම පිළිබඳ නිර්වචනය පුළුල් කිරීම හා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පවත්වා ගැනීම හා සම්බන්ධ වේ.

**(ආ) බැංකු පනතට කරන ලද සංශෝධනයන්** :- බලපත්‍රලාභී වාණිජ හා විශේෂිත බැංකු අධීක්ෂණය හා පාලනය ශක්තිමත් කිරීම යෝජිත සංශෝධන වලින් අපේක්ෂා කෙරේ.

**(ඇ) මූල්‍ය කල්බදු කෙටුම්පත** :- නව පනත මගින් කල්බදු කර්මාන්තය සඳහා පාලනමය හා අධීක්ෂණ රාමුවක් ලබාදෙනු ඇත. කල්බදු කර්මාන්තයේ යෙදී සිටින සමාගම් වලට බලපත්‍ර ලබාදීම හා ඒවා අධීක්ෂණය කිරීම මහ බැංකුව විසින් කරනු ඇත. එමෙන්ම මෙම පනත මගින් මූල්‍ය කල්බදු ගණුදෙණු නිර්වචනය කිරීමත්, කල්බදු හිමි, කල්බදු ලාභී හා කල්බදු භාණ්ඩ සපයන්නා යන අයගේ අයිතිවාසිකම් හා වගකීම් නිශ්චය කිරීම ද කරනු ඇත.

**(ඇ) ජාතික ඉතිරි කි රීමේ බැංකු පනතට කරන ලද සංශෝධනයන්** :- අක්‍රීය ගිණුම් ප්‍රාග්ධනිත කිරීම තුලින් බැංකුව සඳහා ප්‍රාග්ධන පදනමක් ලබාදීමත්, ඒ සඳහා ඇති බාධා ඉවත් කිරීමත් යෝජිත සංශෝධන මගින් අපේක්ෂා කෙරේ. විශේෂිත ඉතිරිකිරීමේ බැංකුවක් වශයෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුවට නියුක්ත විය හැකි කාර්ය පරාසය තීරණය කිරීමද මෙම සංශෝධන මගින් කෙරෙනු ඇත.

**(ඉ) රක්ෂණ පාලන කෙටුම්පත** :- රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීමේ අරමුණු ඇතිව, රක්ෂණ සමාගම් හා බ්‍රෝකර්වරුන් ලියාපදිංචි කිරීමේ බලතල සහිත ව්‍යවස්ථාපිත රක්ෂණ මණ්ඩලයක් පිහිටුවීම සඳහා මෙම පනත් කෙටුම්පත මගින් අවශ්‍ය ප්‍රතිපාදන සැලසේ. මෙම නව පනත පැනවීමත් සමඟ දනට තිබෙන 1962 අංක 25 දරණ රක්ෂණ පාලන පනත අහෝසි වනු ඇත.

### තාක්ෂණික ආධාර ව්‍යාපෘතීන් :-

**(අ) වණික් හෙවත් ආයෝජන බැංකු පාලනය හා අධීක්ෂණය සඳහා නීතිමය රාමුව.**

වණික් (ආයෝජන) බැංකු අරමුදල් මත පදනම් වූ හා ගාස්තු මත පදනම් වූ විවිධාකාරයේ සේවාවන් සපයනු ලබන නමුත් මෙම බැංකු කිසිම පාලන අධිකාරියක් විසින් ලියාපදිංචි කරනු නොලැබේ. කොටස් ගණුදෙණු හා සම්බන්ධ සමහර කටයුතු සුරැකුම් හා විනිමය කොමිසමේ පාලනයට යටත් වන අතර, අනෙකුත් කටයුතු කිසිම අධීක්ෂණයකට භාජනය නොවේ. වණික් බැංකු පාලනය හා අධීක්ෂණය සඳහා නීතිමය රාමුවක් හඳුන්වා දීමේ පරමාර්ථයෙන්, වණික් බැංකුවල කාර්ය භාරයන්, ආර්ථිකය කෙරේ ඒවායේ බලපෑමත් අධ්‍යයනය කිරීමට අවශ්‍ය මූලික පියවර මහ බැංකුව විසින් ගනු ලැබීය. ලෝක බැංකු ජපන් ආධාර මගින් මූල්‍යනය කරනු ලබන මෙම අධ්‍යයනය 1999 වසරේ මුල් කාලය තුල ආරම්භවීමට නියමිතය.

**(ආ) ලේඛන රහිත සුරැකුම් වෙළඳම් ක්‍රමය හා තත්කාලීන දළ නිෂ්කාශන ක්‍රමය**

භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සඳහා ලේඛන රහිත වෙළඳම් ක්‍රමයක් හා තත්කාලීන දළ නිෂ්කාශන ක්‍රමයක් හඳුන්වාදීමට මහ බැංකුව තීරණය කර ඇත. ක්‍රියා පිළිවෙත් හා පද්ධති සැලසුම්වලට අදළ මූලික කටයුතු වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී. නව ක්‍රමය සඳහා අවශ්‍ය වන පරිගණක මෘදුකාංග හා දෘඩාංගවලට අදළ තාක්ෂණික විස්තර පිළියෙල කිරීමේ කාර්ය සඳහා ලෝක බැංකු ආධාර යටතේ පත් කරනු ලැබූ උපදේශක කණ්ඩායමක් මහ බැංකුවට සහාය ලබා දුනි.

**(ඇ) ප්‍රාථමික වෙළඳුන් සඳහා වන ආරක්ෂණ පද්ධතිය.**

මහ බැංකුව ප්‍රාථමික වෙළඳුන් සඳහා අධීක්ෂණ රාමුවක් පිහිටුවීමට යෝජනා කරයි. ඊට අදළ නීතිමය කටයුතු දැනටමත් සම්පාදනය වෙමින් පවතී.

**(ඈ) සේවක අර්ථසාධක අරමුදලේ ව්‍යුහාත්මක කළමනාකරණ ධාරිතාව වර්ධනය කි රීම.**

සේවක අර්ථසාධක අරමුදල සඳහා ආයෝජන නීතිරීති මාලාවක් සම්පාදනය කිරීමත්, එහි සේවක මණ්ඩලයට ආයෝජන කළමනාකරණ ශිල්පීය ක්‍රම පිළිබඳ පුහුණුවක් ලබාදීමත් මෙම ව්‍යාපෘතියට අඩංගු වේ. 1998 දෙසැම්බර් මාසයේදී උපදේශක ආයතනයක් තෝරා ගනු ලැබූ අතර, 1999 ජනවාරි මාසයේදී එහි කටයුතු ආරම්භ වීමට නියමිතය. පුද්ගලික මූල්‍ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලෝක බැංකුව විසින් මේ සඳහා අරමුදල් ලබා දේ.

**(ඉ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ආයතනික සංවර්ධනය -**

ස්ථානීය හා ස්ථානීය නොවන අධීක්ෂණ යන්ත්‍රණයන් වැඩි දියුණු කිරීම සඳහාත්, නීතිමය රාමුව, නිපුණතා සංවර්ධනය හා කාර්ය මණ්ඩල පුහුණුව යනාදී කටයුතු ශක්තිමත් කිරීම සඳහාත් අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ. ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ආයතනයේ ආධාර යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. උපදේශකයින් තෝරා ගනු ලැබූ අතර, ව්‍යාපෘතිය 1998 දෙසැම්බර් මාසයේදී ආරම්භ විය.

**(ඊ) ස්ථානීය නොවන බැංකු පරීක්ෂණ ක්‍රමය පරිගණක ගත කිරීම.**

ස්ථානීය නොවන බැංකු පරීක්ෂණ කටයුතුවලට අදළ මෘදුකාංග සංවර්ධන කිරීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරමින් සිටී. බැංකුවල මූල්‍ය දත්ත ඩිස්කට් ආධාරයෙන් ලබා ගැනීම සඳහා අවශ්‍ය ආදර්ශ ආකෘති පිළියෙල කිරීම මෙම ව්‍යාපෘතියට ඇතුලත් වේ. පූර්ව අනතුරු සංඥා දීමේ යාන්ත්‍රණයක් ද මෙම ක්‍රමය තුල අන්තර්ගත වෙනු ඇත. 1998 දී මෙම ක්‍රමය සැලසුම්කර පරීක්ෂණයට භාජනය කරන ලද අතර, 1999 ජනවාරි මාසයේදී එය ක්‍රියාවට නැංවීමට බලාපොරොත්තු වේ.

## සංවර්ධන මුදල්

1998 වර්ෂය තුලදී සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු තවදුරටත් පුළුල් විය. විශේෂයෙන් 1997 වර්ෂයේ දෙවැනි භාගයේදී ක්‍රියාත්මක වූ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ව්‍යාපෘතිය (සුමදි) නම් වූ නව ණය සහතික ක්‍රමයෙහි වැඩ කටයුතු 1998 වර්ෂය තුලදී වේගවත් ලෙස පුළුල් විය. අඩු ආදයම් පවුල් සඳහා වූ නිවාස ණය ක්‍රමය යටතේ අනුමත වූ ණය මුදා හැරීම් වර්ෂය තුලදී බොහෝ දුරටම නිමාවට පත් විය. නාගරික සහ අර්ධ නාගරික අංශයෙහි ජනතාවගේ නිවාස සංවර්ධන වැඩ කටයුතු සඳහා අරමුදල් සපයා දීමේ අරමුණ ඇතිව නව නිවාස ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම් වස් 1998 අවසාන කාර්තුවේදී ආසියානු සංවර්ධන බැංකුව සමඟ පැවැත්වූ සාකච්ඡාවන් සාර්ථක ලෙස නිම විය. වර්ෂය තුලදී වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියෙහි වැඩ කටයුතුද තවදුරටත් සීඝ්‍ර ලෙස පුළුල් විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය සහතික සපයා ඇති ව්‍යාපෘතීන් පරීක්ෂා කිරීමද වර්ෂය තුලදී දෙපාර්තමේන්තුව මඟින් අඛණ්ඩව සිදු කරන ලදී.

### වර්තමාන ණය යෝජනා ක්‍රම

### වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (වැ.ප්‍ර.ව්‍යා)

මෙම ව්‍යාපෘතිය යටතේ අනුමත වූ මුළු ණය මුදල 1997 වර්ෂය අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 672.7 ක් විය. 1998 වර්ෂයේදී මෙය තුන් ගුණයකින් පමණ වැඩි වී රුපියල් දශ ලක්ෂ 2,563.7 ක් වූ අතර, ණය මුදල් මුදා හැරීම් සියයට 91 කින් පමණ වැඩි වී රුපියල් දශ ලක්ෂ 990.6 ක් විය. 1998 වර්ෂයේදී නැවත වගාව සහ වැවිලි බෝග වැඩි දියුණු කිරීම සඳහා රුපියල් දශ ලක්ෂ 1,072.1 ක් වටිනා ණය ඉල්ලුම්පත් 26 ක් අනුමත කළ අතර එම අරමුණ සඳහා මුදාහල මුදලේ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 550.2 ක් විය. තේ ඇඹුරුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා රුපියල් දශ ලක්ෂ 1,005.3 ක් වටිනා ණය ඉල්ලුම්පත් 27 ක් 1998 වර්ෂය තුලදී අනුමත කළ අතර, මුදාහල මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 259.1 ක් විය.

වාහන මිලදී ගැනීම සඳහා 1998 වර්ෂය තුලදී රුපියල් දශ ලක්ෂ 486.3 ක් වටිනා ණය ඉල්ලුම්පත් 21 ක් අනුමත කළ අතර, ඒ සඳහා රුපියල් දශ ලක්ෂ 181.3 ක් මුදා හැර ඇත. වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ ණය අනුමත කිරීම් සහ මුදා හැරීම් පිළිබඳ විස්තර **II-8** සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II - 8 සංඛ්‍යා සටහන**
**වැව්ලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය - අරමුණු අනුව ණය අනුමත කිරීම් සහ මුදහැරීම්**

(රුපියල් දශලක්ෂ)

| අරමුණ | 1997 | | 1998 | | 1996 - 1998 | |
|---|---|---|---|---|---|---|
| | අනුමත කිරීම් | මුදහැරීම් | අනුමත කිරීම් | මුදහැරීම් | අනුමත කිරීම් | මුදහැරීම් |
| වැවිලි බෝග සංවර්ධනය | 217.0 | 188.7 | 1,072.1 | 550.2 | 1,452.4 | 796.6 |
| සැකසුම් වැඩිදියුණු කිරීම් සහ පරිසර දූෂණය පාලනය | 313.5 | 196.9 | 1,005.3 | 259.1 | 1,470.4 | 456.0 |
| සේවා වාහන සහ උපකරණ | 1422 | 132.6 | 486.3 | 181.3 | 739.6 | 315.0 |
| **එකතුව** | **672.7** | **518.2** | **2,563.7** | **990.6** | **3,662.4** | **1,567.6** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1998 වර්ෂයේදී ඩී.එෆ්.සී.සී. බැංකුව වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට රුපියල් දශ ලක්ෂ 418.8 ක් මුදහල අතර, ජාතික සංවර්ධන බැංකුව (ජා.සං.බැ.) රුපියල් දශ ලක්ෂ 406.6 ක් මුදහැර ඇත. ලංකා බැංකුව, (ලං.බැ.) රුපියල් දශ ලක්ෂ 85.4 ක් ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට මුද හැර ඇති අතර, සීමාසහිත ලංකා වාණිජ බැංකුව (සී.ස.ලං.වා.බැ.) රුපියල් දශ ලක්ෂ 79.8 ක් මුදහැර ඇත. සීමාසහිත සම්පත් බැංකුව 1998 වර්ෂයේ අවසාන කාර්තුව තුලදී ප්‍රාදේශීය වැවිලි සමාගමකට රුපියල් දශ ලක්ෂ 98.4 ක් වටිනා ණය ඉල්ලුම්පත් අනුමත කළ නමුත් මෙතෙක් කිසිදු අරමුදල් නිකුත් කිරීමක් කර නොමැත. වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ණය ක්‍රමයෙහි ප්‍රගතිය සම්බන්ධ දත්ත සහභාගිත්ව මූල්‍ය ආයතන අනුව II-9 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

වැවිලි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ ණය සහතික ක්‍රමයෙහි වගකීම් 1997 වර්ෂයේදී වූ රුපියල් දශ ලක්ෂ 297.3 සිට 1998 වර්ෂය අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 605.3 ක් දක්වා වර්ධනය විය. 1996 වර්ෂයේ සිට 1998 වර්ෂය දක්වා වූ අවුරුදු තුන තුල ණය සහතික ක්‍රමයෙහි වගකීම රුපියල් දශ ලක්ෂ 943.1 ක් විය. මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික ක්‍රමයෙහි ප්‍රගතිය II-9 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරිදීමේ ව්‍යාපෘතිය (සුමදි)

ජාතික සංවර්ධන බැංකුව මගින් ප්‍රතිමූල්‍ය පහසුකම් සපයන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ව්‍යාපෘතිය (සුමදි) 1997 වර්ෂයේ මැයි මාසයේ ආරම්භ කරන ලදී. එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 55 ක වටිනාකමකින් යුතු රුපියල් ණය වලින් සමන්විත මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලබා දී ඇත්තේ විදේශීය වාණිජ ප්‍රභවයන් සහ ආසියානු සංවර්ධන බැංකුව මගිනි. මෙම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ව්‍යාපෘතිය යටතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට ණය අනුමත

**II-9 සංඛ්‍යා සටහන**
**වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය - ණය අනුමත කිරීම්, මුදහැරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික වගකීම**

(රුපියල් දශලක්ෂ)

| සහභාගිත්ව මූල්‍ය ආයතන | 1997 | | | | 1998 | | | | 1996 - 1998 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත කිරීම් | මුද හැරීම් | ණය සහතික වගකීම | රැස්කර ගන්නා ලද වාර මුදල් | අනුමත කිරීම් | මුද හැරීම් | ණය සහතික වගකීම | රැස්කර ගන්නා ලද වාර මුදල් | අනුමත කිරීම් | මුද හැරීම් | ණය සහතික වගකීම | රැස්කර ගන්නා ලද වාර මුදල් |
| ජාතික සංවර්ධන බැංකුව | 120.6 | 299.0 | 168.8 | 3.4 | 1,147.2 | 406.6 | 251.3 | 7.0 | 1,693.8 | 763.4 | 460.6 | 10.4 |
| ඩී.එෆ්.සී.බැංකුව | 269.4 | 94.2 | 56.4 | 0.3 | 993.6 | 418.8 | 256.5 | 3.4 | 1,263.0 | 513.0 | 312.9 | 3.7 |
| ලංකා බැංකුව | 120.6 | 75.5 | 40.8 | 0.9 | 286.0 | 85.4 | 47.3 | 1.6 | 406.6 | 160.9 | 88.1 | 2.5 |
| සීමාසහිත ලංකා වාණිජ බැංකුව | 162.1 | 50.5 | 31.3 | 0.4 | 38.5 | 79.8 | 50.2 | 1.3 | 200.6 | 130.3 | 81.5 | 1.7 |
| සීමාසහිත සම්පත් බැංකුව | - | - | - | - | 98.4 | - | - | - | 98.4 | - | - | - |
| **එකතුව** | **672.7** | **519.2** | **297.3** | **5.0** | **2,563.7** | **990.6** | **605.3** | **13.3** | **3,662.4** | **1,567.6** | **943.1** | **18.3** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

කිරීම් සහ මුදා හැරීම් 1998 වර්ෂයේදී කඩිනම් වැඩි වුණි. 1997 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුව මගින් රුපියල් දශ ලක්ෂ 4.9 ක වටිනාකමකින් යුක්ත ණය සහතික 8 ක් පමණක් නිකුත් කරන ලද අතර, 1998 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 857.9 ක වටිනාකමකින් යුක්ත ණය සහතික 695 ක් නිකුත් කරන ලදී. මෙම වර්ෂය තුළදී ණය සහතික 3 ක් අවලංගු විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සහතික වගකීම 1997 වර්ෂයේදී වූ රුපියල් දශ ලක්ෂ 3.9 ක් වූ අතර, 1998 වර්ෂයේදී එය රුපියල් දශ ලක්ෂ 498.8 දක්වා ඉහළ නැගිනි. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු II-10 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

II-10 සංඛ්‍යා සටහනෙන් දක්වෙන පරිදි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරි දීමේ ණය ක්‍රමය යටතේ සියයට 41 ක් පමණ ණය සපයන ලදදේ මගී සහ භාණ්ඩ ප්‍රවාහනය සහ වාහන අළුත්වැඩියාවන් වැනි කටයුතු ඇතුළත් සේවා කර්මාන්තවලටය. ඒ හැර ආහාර සැකසීමේ කර්මාන්තයට සියයට 22 ක පමණ ණය ප්‍රදානය කරන ලදී.

## අඩු ආදයම් නිවාස වැඩසටහන - IV අදියර

රජය වෙනුවෙන් ප්‍රධාන ණය දෙන ආයතනය වශයෙන් ක්‍රියා කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව එක්සත් ජනපද රජයේ අඩු ආදයම් පවුල් සඳහා වන නිවාස ණය සහතික වැඩසටහනෙහි iv අදියර යටතේ ලබාගත් අරමුදල් 1998 වර්ෂය තුළදී අනුමත කර තිබූ ණය ඉල්ලුම්පත් වෙනුවෙන් එම අරමුදල් බෙද හැරීම බොහෝදුරට අවසාන විය.

**II-10 සංඛ්‍යා සටහන**

**සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දිරිදීමේ ව්‍යාපෘතිය (සුමදි) කර්මාන්ත අනුව ණය වර්ගීකරණය 1998.12.31 දින දක්වා**

රුපියල් දශලක්ෂ

| කර්මාන්ත | ප්‍රදානය කළ ණය | | ප්‍රදානය කළ ණය ප්‍රමාණය | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | වටිනාකම | % |
| ආහාරපාන වර්ග සහ දුම්කොළ | 112 | 15.9 | 186.4 | 21.6 |
| රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන | 63 | 9.0 | 87.0 | 10.1 |
| දැව සහ දැව නිෂ්පාදන | 23 | 3.3 | 17.6 | 2.1 |
| කඩදසි සහ කඩදසි නිෂ්පාදන | 13 | 1.8 | 25.4 | 3.0 |
| රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 16 | 2.3 | 23.3 | 2.7 |
| මූලික ලෝහ නිෂ්පාදන | 8 | 1.1 | 12.4 | 1.4 |
| ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 47 | 6.7 | 51.9 | 6.0 |
| සකස් කළ ලෝහ නිෂ්පාදන, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 28 | 4.0 | 21.9 | 2.5 |
| කෘෂි නිෂ්පාදන | 70 | 10.0 | 79.7 | 9.2 |
| අනෙකුත් | 323 | 45.9 | 357.2 | 41.4 |
| එකතුව | 703 | 100 | 862.8 | 100 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

* මගී සහ වාණිජ ප්‍රවාහනය, සේවා ස්ථාන, අවන්හල්, ෆයිබර් ග්ලාස්, ඉලෙක්ට්‍රොනික් සහ අනෙකුත් සේවාවන්.

1992 වර්ෂයේ සිට 1997 වර්ෂය දක්වා අනුමත වූ මුළු ණය ඉල්ලුම්පත්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,050.7 ක් වූ අතර, 1997 වර්ෂය අවසාන වනවිට ණය මුදා හැරීම් රුපියල් දශ ලක්ෂ 832.2 ක් විය. 1998 වර්ෂය තුළදී ණය අනුමත කිරීම් රුපියල් දශ ලක්ෂ 312.2 ක් වූ අතර 1998 වර්ෂය හා ඊට පෙර වසර වලදී අනුමත වූ ණය සඳහා මුදාහරින ලද මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 529.3 ක් විය. අඩු ආදයම් පවුල් සඳහා වන නිවාස ණය පිළිබඳ වැඩිදුර තොරතුරු II-11 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II-11 සංඛ්‍යා සටහන**

**අඩු ආදායම් පවුල් සඳහා වන නිවාස වැඩසටහන-IV වැනි අදියර ණය අනුමත කිරීම් සහ මුදහැරීම්**

රුපියල් දශලක්ෂ

| උප ප්‍රධාන ණය දෙන ආයතන | අනුමත කිරීම් | | | මුදා හැරීම් | | |
|---|---|---|---|---|---|---|
| | 1997 | 1998 | 1992-1998 | 1997 | 1998 | 1992-1998 |
| ලංකා බැංකුව | - | - | 313.8 | 1.3 | - | 313.8 |
| සීමාසහිත ලංකා වාණිජ බැංකුව | - | - | 1.4 | 0.3 | - | 1.4 |
| සීමාසහිත හැටන් නැෂනල් බැංකුව | - | - | 4.7 | - | - | 4.7 |
| නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව යටතේ ලබාගත් අරමුදල්. | 138.5 | 246.7 | 595.9 | 68.6 | 442.1 | 595.9 |
| මහජන බැංකුව | - | 1.0 | 251.9 | 71.6 | 1.0 | 251.9 |
| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු | - | 1.0 | 74.0 | 26.0 | 14.1 | 73.0 |
| සීමාසහිත සෙලාන් බැංකුව | - | - | 4.2 | 1.7 | - | 4.2 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 7.9 | 63.5 | 117.0 | 25.4 | 72.1 | 116.6 |
| **එකතුව** | **146.4** | **312.2** | **1,362.9** | **194.9** | **529.3** | **1,361.5** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

11.12 සංඛ්‍යා සටහනට අනුව 1998 වර්ෂය තුළදී අනුමත වූ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 68 ක් ඉඩම් හිමි කර ගැනීම් සඳහා ප්‍රයෝජනයට ගෙන ඇති අතර, සියයට 30.5 ක් නව නිවාස ගොඩ නැංවීම සඳහා යොදගෙන ඇත.

**II-12 සංඛ්‍යා සටහන**

**අඩු ආදයම් පවුල් සඳහා වන නිවාස වැඩසටහන IV වැනි අදියර ණය අනුමත කිරීම් අරමුණු සහ කල්පිරීම අනුව**

(රුපියල් දශලක්ෂ)

| භාණ්ඩය එකතුව | 1997 | | | 1998 | | |
|---|---|---|---|---|---|---|
| | නාගරික | ග්‍රාමීය | එකතුව | නාගරික | ග්‍රාමීය | එකතුව |
| අරමුණු | | | | | | |
| නව නිවසක් ගොඩ නැගීම | 0.2 | - | 0.2 | 2.6 | 92.7 | 95.3 |
| වැඩිදියුණු කිරීම් සහ අළුත්වැඩියා කිරීම් | - | - | - | - | 5.7 | 5.7 |
| ඉඩමක් හිමිකර ගැනීම | 6.8 | 139.4 | 146.2 | 10.3 | 200.9 | 211.2 |
| යටිතල පහසුකම් සංවර්ධනය | - | - | - | - | - | - |
| **එකතුව** | **7.0** | **139.4** | **146.4** | **12.9** | **299.3** | **312.2** |
| කල්පිරීම | | | | | | |
| අවු.5 සහ ඊට අඩු | - | 0.6 | 0.6 | 0.4 | 5.1 | 5.5 |
| අවු,.6 සිට අවු.10 දක්වා | 0.5 | 4.0 | 4.5 | 1.0 | 18.7 | 19.7 |
| අවු.11 සිට අවු.15 දක්වා | 6.5 | 134.8 | 141.3 | 11.5 | 275.3 | 286.8 |
| අවු.16 සිට අවු.20 දක්වා | - | - | - | - | 0.2 | 0.2 |
| **එකතුව** | **7.0** | **139.4** | **146.4** | **12.9** | **299.3** | **312.2** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## නාගරික සහ අර්ධ නාගරික නිවාස සඳහා වූ නව ණය යෝජනා ක්‍රමය

නාගරික සහ අර්ධ නාගරික අඩු ආදායම් ලාභී පවුල් ඉලක්ක කොටගෙන නව ණය ක්‍රමයක් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සහභාගිත්වය 1998 නොවැම්බර් මාසයේදී මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රමය නාගරික සංවර්ධනය සහ අඩු ආදායම් නිවාස අංශ ව්‍යාපෘතියෙහි එක් කොටසක් වන අතර, ඒ යටතේ ආසියානු සංවර්ධන බැංකුව එහි ණය අංක 1632 ශ්‍රී (එස්.එෆ්) යටතේ ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 20 ක වටිනාකමකින් යුක්ත ණය මුදලක්, මාසික ආදායම රු. 8,500/- නොඉක්මවන පවුල්වල නිවාස කටයුතු වෙනුවෙන් ණය ලබා දීම සඳහා වෙන්කර ඇත. එක් පුද්ගලයෙකුට ලබා දෙන උපරිම ණය මුදල රු. 100,000/- ක් වන අතර, යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම් සහ අළුත්වැඩියාවන්, ඉඩමක් හිමි කර ගැනීම, දැනට පවතින නිවාසවලට නව එකතු කිරීම් සහ නව නිවාස ගොඩ නැගීම් යන අරමුණු සඳහා මෙමගින් ණය ලබා ගත හැකිය.

## ණය සහතික අරමුදල් ආයෝජනය කිරීම

ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරන ලද මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,652 ක් විය. මෙම ආයෝජනයන්ගෙන් ලැබුණු මුළු පොලී ආදායම රුපියල් දශ ලක්ෂ 169.53 ක් විය. මෙම ආයෝජනයන්ට අරමුදල් ලබා ගන්නේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය යෝජනා ක්‍රමය, බස් රථ මිළදී ගැනීමේ ණය යෝජනා ක්‍රමය සහ වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යන ණය සහතික ක්‍රමයන් සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අත්තිකාරම් වශයෙන් ලබා දුන් අරමුදල් සහ වාර මුදල් වශයෙන් කළ එකතු කිරීම් වලිනි.

## නිමාවට පත් වූ ණය යෝජනා ක්‍රම

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය කර්මාන්ත අනුව වර්ගීකරණය 11.13 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. නිමාවට පත් කල ණය යෝජනා ක්‍රම වලට අදල ණය සහතික ක්‍රියාවලියෙහි පලදායිකත්වය පිළිබඳ සාරාංශයක් 11.14 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II-13 වැනි සංඛ්‍යා සටහන**

**සුමක II, III සහ IV ණය සහතික ක්‍රම කර්මාන්ත අනුව වර්ගීකරණය - 1998.12.31 දිනට**

රුපියල් දශලක්ෂ

| කර්මාන්තය | සුමක II, III සහ IV (1992 - 1998)* | | | | | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රදානය කළ ණය සංඛ්‍යාව | | ප්‍රදානය කළ ණය ප්‍රමාණය | | සහතික කළ ණය ප්‍රමාණය | |
| | වටිනාකම | % | වටිනාකම | % | වටිනාකම | % |
| 1. ආහාර වර්ග සැකසීම | 3,247 | 22.0 | 2,173.9 | 19.7 | 1,257.8 | 18.4 |
| 2. වෙනත් කෘෂිකර්මාන්ත | 311 | 2.1 | 153.4 | 1.4 | 99.8 | 1.5 |
| 3. රබර් නිෂ්පාදන | 304 | 2.1 | 314.7 | 2.9 | 174.1 | 2.6 |
| 4. ලෝහ නිෂ්පාදන | 1,394 | 9.4 | 740.9 | 6.7 | 459.5 | 6.7 |
| 5. ඉදිකිරීම් ද්‍රව්‍ය | 914 | 6.2 | 556.0 | 5.0 | 367.4 | 5.4 |
| 6. ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු | 546 | 3.7 | 766.5 | 7.0 | 370.4 | 5.5 |
| 7. දැව කර්මාන්තය | 895 | 6.1 | 450.4 | 4.1 | 294.3 | 4.3 |
| 8. ඇඟළුම් | 904 | 6.2 | 790.5 | 7.2 | 438.9 | 6.5 |
| 9. රෙදිපිළි | 325 | 2.2 | 319.5 | 2.9 | 181.6 | 2.7 |
| 10. අළුත්වැඩියා කිරීමේ ස්ථාන | 558 | 3.8 | 331.0 | 3.0 | 215.3 | 3.2 |
| 11. වෙනත් ** | 5,335 | 36.2 | 4,417.7 | 40.1 | 2,939.2 | 43.2 |
| **එකතුව** | **14,733** | **100** | **11,014.5** | **100** | **6,798.3** | **100** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

* සුමක I සඳහා කර්මාන්ත අනුව ණය වර්ගීකරණය කළ දත්ත ලබාගත නොහැක.

** මගී සහ වාණිජ ප්‍රවාහනය, සම්භාණ්ඩ, සත්ව පාලනය, රසායනික ද්‍රව්‍ය, ධීවර, අවන්හල්, ෆයිබර් ග්ලාස්, ඉලෙක්ට්‍රොනික්, වීදුරු, පිඟන් භාණ්ඩ සහ පොලිතීන් කර්මාන්ත ඇතුලත් වේ.

**II - 14 වැනි සංඛ්‍යා සටහන**

**සුමක II, III සහ I ණය සහතික ක්‍රම කර්මාන්ත අනුව වර්ගීකරණය - 1998.12.31 දිනට**

රුපියල් දශලක්ෂ

| | ශීර්ෂය | සුමක I(අ) | | සුමක II(ආ) | | සුමක III(ඇ) | | සුමක IV (ඈ) | | බ.මි.ණ.(ඉ) | | සුමදි (ඊ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම |
| 1.1 | ප්‍රදානය කරන ලද ණය | 1670 | 286.1 | 2531 | 1392.5 | 3130 | 1955.6 | 9072 | 7666.4 | 1932 | 1098.6 | 703 | 862.8 |
| 1.2 | සහතික කරන ලද ණය | 1670 | 157.5 | 2531 | 713.6 | 3130 | 1312.6 | 9072 | 4772.1 | 1932 | 871.2 | 703 | 508.7 |
| 2.1 | සම්පූර්ණයෙන් ගෙවා නිමි ණය | 1235 | 184.0 | 1963 | 1057.5 | 1915 | 1108.6 | 3877 | 1386.1 | 1711 | 965.4 | 1 | 10.0 |
| 2.2 | ඉවත්කර ගන්නා ලද ණය හෝ අවලංගු වූ ණය සහතික | 113 | 31.4 | 456 | 232.2 | 890 | 590.5 | 337 | 245.0 | 104 | 60.5 | 3 | 6.0 |
| 3.1 | ලැබූ හිමිකම්පෑම් | 338 | 75.9 | 227 | 70.0 | 168 | 96.2 | 197 | 143.4 | - | - | - | - |
| 3.2 | ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම් | - | 33.9 | - | 58.6 | - | 65.2 | - | 96.5 | - | - | - | - |
| 3.3 | හිමිකම්පෑම් සමථයට පත්කිරීම් | | | | | | | | | | | | |
| 3.3.1 | සම්පූර්ණයෙන් ගෙවීම් කළ හිමිකම්පෑම් | 232 | 19.3 | 126 | 31.7 | 88 | 23.4 | 60 | 21.2 | - | - | - | - |
| 3.3.2 | අර්ධ ගෙවීම් කළ හිමිකම්පෑම් | 27 | 2.1 | 5 | 0.7 | - | - | - | - | - | - | - | - |
| 3.3.3 | ප්‍රතික්ෂේප කළ හිමිකම්පෑම් | 32 | 6.9 | 46 | 12.7 | 45 | 17.7 | 50 | 19.2 | - | - | - | - |
| 3.3.4 | හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමෙන් පසු සම්පූර්ණයෙන් ගෙවා නිම කරන ලද ණය | 36 | 2.0 | 4 | 1.4 | 5 | 3.3 | 21 | 9.9 | - | - | - | - |
| 3.3.5 | සලකා බැලීම කල් තබන ලද හිමිකම්පෑම් | 8 | 2.1 | 21 | 7.6 | 4 | 4.2 | 10 | 6.7 | - | - | - | - |
| 3.3.6 | තීරණ ගෙන නොමැති හිමිකම්පෑම් | 2 | - | 13 | 3.8 | 20 | 9.6 | 49 | 24.0 | - | - | - | - |
| 3.3.7 | ඉවත් කර ගන්නා ලද හිමිකම්පෑම් | 3 | 0.5 | 12 | 4.1 | 6 | 3.3 | 7 | 6.8 | - | - | - | - |
| 4.1 | නොපියවන ලද ණය මුදල් | 35 | 4.5 | 99 | 31.3 | 290 | 94.3 | 4765 | 2826.2 | 112 | 23.5 | 700(උ) | 820(උ) |
| 4.2 | ක්‍රියාත්මක ණය සහතික මත ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම | 35 | 2.7 | 99 | 18.5 | 290 | 62.9 | 4765 | 1881.2 | 112 | 18.8 | - | 483.5(උ) |
| 5. | රැස්කර ගන්නා ලද වාර මුදල් | - | 12.2 | - | 29.9 | - | 44.9 | - | 153.4 | - | 21.9 | - | 3.0 |
| 6. | පශ්චාත් හිමිකම් අයකර ගැනීම් | - | 10.4 | - | 18.5 | - | 17.2 | - | 3.18 | - | 1.8 | - | - |

සටහන : (අ) සුමක I - 1979 සිට 1981 දක්වා ක්‍රියාත්මක විය.
සුමක II - 1982 සිට 1989 දක්වා ක්‍රියාත්මක විය.
සුමක III - 1988 සිට 1991 දක්වා ක්‍රියාත්මක විය.
සුමක - 1992 සිට 1997 දක්වා ක්‍රියාත්මක විය.

(ඉ) බ.මි.ණ. - 1990 සිට 1992 දක්වා ක්‍රියාත්මක විය.
(ඊ) සුමදි - 1997 ආරම්භ කරන ලදී.
(උ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## ග්‍රාමීය ණය

විමර්ශනයට භාජනය වන වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව සිය ණය ව්‍යාපෘතිවල මෙන්ම විදේශ ආයතන මගින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිවල ද මෙහෙයුම් ආයතනය වශයෙන් අඛණ්ඩව ක්‍රියා කළේය. මෙහෙයුම් ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම වන්නේ ණය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අයත්වන සහභාගිත්ව ණය දෙන ආයතන ව්‍යාපෘතිවලට ඇතුලත් කර ගැනීම, මෙහෙයුම් උපදෙස් එම ණය දෙන ආයතනවලට නිකුත් කිරීම, ව්‍යාපෘති යටතේ අනුමත වූ ණය සඳහා එම ආයතනවලට ප්‍රතිමූල්‍ය මුදහැරීම, ණය යෝජනා ක්‍රම මෙහෙයවීම හා සම්බන්ධීකරණය කිරීම, ණය වාර්තා පවත්වාගෙන යාම හා අදළ ව්‍යාපෘති කාර්යාල හා අනෙකුත් දේශීය ආයතනවල සහාය ඇතිව ණය යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීමයි.

මහ බැංකුව විසින් 1998 දී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පහත දක්වේ.

**(අ) ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන ව්‍යාපෘති (ADB) :-**

(i) කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය

(ii) බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය

(iii) දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

(iv) වයඹ පළාත් ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

(v) උතුරුමැද පළාත් ග්‍රාමීය සංර්ධන ව්‍යාපෘතිය

**(ආ) කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD). කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය. (CIAD). ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (SIDA). ජපන් රජය සහ ලෝක ආහාර වැඩසටහන (WFP) මගින් අරමුදල් සපයන ව්‍යාපෘති :-**

(vi) සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය (ඉසුරු) ව්‍යාපෘතිය (IFAD සහ CIAD);

(vii) උතුරු මැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (IFAD, CIAD සහ WFP) ;

(viii) ආහාර හා පෝෂණ වර්ධනය පිළිබඳ ණය ව්‍යාපෘතිය (ජපන් රජය);

**(ඇ) ශ්‍රී ලංකා රජය මගින් අරමුදල් සපයන ව්‍යාපෘති :-**

(ix) කෑගල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය

(x) සුරතුර වැඩසටහන

### කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය

කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය 1998 දෙසැම්බර් මස අවසන් කරන ලදී. ආරම්භයේදී මෙම ව්‍යාපෘතිය 1997 වර්ෂයේදී අවසන් වීමට නියමිතව තිබුණද, දනටමත් අනුමත කර ඇති ණය මුදල්වල මුදහැරීම් කටයුතු සම්පූර්ණ කිරීමට ණය දෙන ආයතනවලට හැකිවන පරිදි, ණය සංරචකය සඳහා තවත් එක් වර්ෂයකින් දීර්ග කිරීමක් ආසියානු සංවර්ධන බැංකුව මගින් ලබාදෙන ලදී.

1989 වර්ෂයේදී ආරම්භ වූ මෙම ව්‍යාපෘතිය මගින් කුඩා ඉඩම් හිමියන්ගේ තේ නිෂ්පාදනය හා අපනයනය ඉහළ නැංවීම, කුඩා ඉඩම් හිමියන් වගා කරනු ලබන තේවල හා පෞද්ගලික තේ කම්හල්වල ගුණාත්මක බව හා ඵලදයිතාවය වැඩිදියුණු කිරීම, ග්‍රාමීය අංශයේ ආදයම් හා රැකියා අවස්ථා ඉහළ නැංවීම සහ කුඩා තේ ඉඩම් හිමියන්ට සහය වන ආයතනික අංශයන්හි හැකියාවන් වැඩිදියුණු කිරීම ඉලක්ක කරන ලදී. නව වගාව, නැවත වගාව, තවාන් සංවර්ධනය හා කර්මාන්තශාලා සංවර්ධන කටයුතු කරගෙන යාමට කුඩා තේ වතු හිමියන්ට හා පෞද්ගලික තේ කර්මාන්තශාලා හිමිකරුවන්ට උප ණය ලබාදීමට හැකිවන පරිදි සහභාගිවන ණය දෙන ආයතනවලට ප්‍රතිමූල්‍ය සැපයීම සඳහා ණය සංරචකය වෙනුවෙන් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 19 ක මුදලක් ආසියානු සංවර්ධන බැංකුව මූලික වශයෙන් වෙන් කරන ලදී. කුඩා තේ වතු හිමියන්ගෙන් ණය මුදල් සඳහා ඉල්ලුම අඩුවීමේ හේතුවෙන් ආරම්භක වර්ෂවලදී අපේක්ෂිත වේගයෙන් වෙන්කළ අරමුදල් භාවිතා නොවුණි. මෙම මන්දගාමී ප්‍රගතිය 1994 වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකුව හා රජය ණය ප්‍රතිපාදනවල සංශෝධනයන් ඇති කිරීමට හේතු විය. ඒ අනුව, රජයේද එකඟතාවය ඇතිව ණය සංරචකය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 10 කින් පහත දැමීමට කටයුතු කරන ලදී. එතැන් සිට ව්‍යාපෘති ප්‍රගතිය ක්‍රමයෙන් වර්ධනය වූ අතර ව්‍යාපෘති කාලසීමාව ඉකුත් වීමට පෙර මුළු ණය ඉලක්කයන් සම්පූර්ණ කිරීමට සහභාගිවන ණය දෙන ආයතනවලට හැකි විය. එසේ වුවද උපණය මැදිකාලීනව කල්පිරීමේ ස්වභාවය හේතුවෙන්, වසර කීපයක් තුළදී වාරික ගණනාවකින් මුදහැරීමේ අවශ්‍යතාවය නිසා මුළු මුදල් ප්‍රමාණයම සම්පූර්ණ වශයෙන් මුදහැරීමට නොහැකි විණි. 1998 දෙසැම්බර් මස ව්‍යාපෘතිය අවසන් වනවිට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 12.6 ක්වූ සංශෝධිත මුළු ප්‍රතිපාදන වලින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 11.83 ක් (සියයට 94 ක්) භාවිතා කර තිබුණි.

1998 වර්ෂය අවසානයේදී, නව වගාවට රුපියල් දශ ලක්ෂ 107 ක්ද, නැවත වගාවට රුපියල් දශ ලක්ෂ 118 ක්ද, තවාන් සංවර්ධනයට රුපියල් දශ ලක්ෂ 41 ක්ද හා කර්මාන්තශාලා සංවර්ධනයට රුපියල් දශ ලක්ෂ 374 ක්ද වශයෙන් රුපියල් දශ ලක්ෂ 641 ක මුළු මුදලක් මහ බැංකුව විසින් මුදහැර තිබුණි. ව්‍යාපෘතිය යටතේ විශාලතම ණය මුදහල ආයතනය ලෙස ඩීඑෆ්සීසී බැංකුව රුපියල් දශ ලක්ෂ 239 ක්ද, මහජන බැංකුව රුපියල් දශ ලක්ෂ 130 ක්ද හා ලංකා බැංකුව රුපියල් දශ ලක්ෂ 100 ක්ද මුදහැර තිබුණි. හෙක්ටයාර 4,338 ක් නව වගාව සඳහා ද හෙක්ටයාර 3,354 ක් නැවත වගාව සඳහා ද වශයෙන් හෙක්ටයාර 7,692 ක් ව්‍යාපෘතියේ මූලික ඉලක්ක සපුරමින් වගාකොට තිබුණි. කර්මාන්තශාලා නැවත සංවර්ධනය කිරීමේ සංරචකය යටතේ කර්මාන්තශාලා 84 ක් සඳහා ණය සපයා තිබුණි.

1998 දෙසැම්බර් මස අවසන් වනවිට සියළුම බැංකු විසින් අයකර ගැනීමට නියමිතව තිබූ මුදල වූ රුපියල් දශ ලක්ෂ 253 කින් රුපියල් දශ ලක්ෂ 229 ක් ආපසු අයකර ගනිමින් ව්‍යාපෘතිය යටතේ සමස්ත ආපසු අයවීමේ ප්‍රගතිය සියයට 91 ක සතුටුදායක මට්ටමක පැවතුණි.

කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කිරීම හේතුවෙන් එය නොකඩවා පවත්වාගෙන යාම සඳහා තේ සංවර්ධන ව්‍යාපෘතිය (තේසව) නමින් නව ව්‍යාපෘතියක් ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත කොට ඇත. එමගින් කුඩා තේ වතු අංශයට අවශ්‍ය ණය සහ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ශ්‍රී ලංකා රජය වෙත විගැහි දශ ලක්ෂ 26.3 ක ණය මුදලක් ලබාදී තිබේ. තේ අංශයේ උප ණය මුදල් මූල්‍යකරණය සඳහා සහභාගිවන ණය දෙන ආයතනවලට ණය වශයෙන් ලබාදීමට හැකිවන පරිදි එම මුළු ණය මුදලින් විගැහි දශ ලක්ෂ 15.4 ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුවට ණය සංරචකය යටතේ වෙන්කර දී තිබේ.

කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය අවසන් වීමේ සිට තේ සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භවීම තෙක් වූ අතරමැදි කාලය තුළ ව්‍යාපෘති කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා සහභාගිත්ව ණය දෙන ආයතනවලට ස්වකීය අරමුදල් මගින් කුඩා තේ වතු හිමියන්ට සියයට 14 ක පොලී අනුපාතිකයක් යටතේ ණය සැපයීම සඳහා වූ පොලී සහනාධාර යෝජනා ක්‍රමයක් 1998 දී දියත් කරන ලදී. ඒ අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ අතිරේක බදු අරමුදලින් (Cess Fund) සියයට 4 ක ප්‍රතිශතයක් මේ සඳහා ගෙවනු ලැබේ. විමර්ශනයට භාජනය වන වර්ෂය තුළ දී මෙම සහනාධාර ක්‍රමය යටතේ ණය දෙන ආයතන විසින් අනුමත කරනු ලැබූ හා මුදහරිනු ලැබූ ණය ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 85.3 ක් හා රුපියල් දශ ලක්ෂ 78.0 ක් විය.

## පළමුවන බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය

මෙම යෝජනා ක්‍රමය යටතේ ණය මුදහැරීම් 1997 දෙසැම්බර් මාසයේදී අවසන් වුවද ණය ආපසු අය කිරීම් පිළිබඳ මෙහෙයුම් කටයුතු, ක්ෂේත්‍ර ගැටළු නිරාකරණ කටයුතු සහ 1997 අවසන් කාර්තුවේදී මුදහළ ණය මුදල් වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකුවෙන් මුදල් ප්‍රතිපූරණය කරගැනීමේ කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තවදුරටත් සිදු කරන ලදී.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ කාල සීමාව තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් දශ ලක්ෂ 586.3 (එ.ජ.ඩොලර් දශ ලක්ෂ 10.964) ක මුදලක් ප්‍රතිමූල්‍ය වශයෙන් සහභාගිත්ව ණය දෙන ආයතන වෙත මුද හැර තිබුණි. ණය සංරචකය සඳහා වෙන්කර තිබූ මුළු මුදල වූ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 13.053 න් සියයට 84 ක ණය උපයෝගීකරණ අනුපාතිකයක් මෙයින් පෙන්වයි. බැංකුවේ මුළු ලැබීම් වලින් සහභාගිත්ව ණය දෙන ආයතන විසින් උප ගැණුම්කරුවන් සඳහා මුදහරින ලද ණය ප්‍රමාණයන් ආසියානු සංවර්ධන බැංකුවේ මුළු ලැබීම් වලින් සියයට 90.48 ක් මූල්‍යනය විය. සහභාගිත්ව ණය දෙන ආයතන විසින් 1998 වර්ෂය අවසාන වනවිට ක්ෂේත්‍ර සංවර්ධනය, පැල තවාන් සංවර්ධනය, පසු අස්වනු මෙහෙයුම් හා සැකසුම් කටයුතු සඳහා මුදහරින ලද රුපියල් දශ ලක්ෂ 693 ක් විය. 1998 දෙසැම්බර් අවසානයේදී මෙම ව්‍යාපෘතිය යටතේ ලබා දෙන ලද ප්‍රතිමූල්‍ය ණය මුදල්වලින් රුපියල් දශ ලක්ෂ 274.5 ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ආපසු ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මධ්‍ය පරිමාණ ණය මුදහැරීමේ සාමාන්‍ය ස්වභාවය අනුව, අනුමත කරන ලද මුළු ණය මුදලින් සමහර වාරිකයන් ඉදිරියටත් සහභාගිවන ණය දෙන ආයතන විසින් අදළ ණයලාභීන් වෙත මුදහැරීමට නියමිතව ඇත. මෙසේ මුදහරිනු ලබන ණය වාරික සඳහා සහභාගිවන ණය දෙන ආයතනවලට ප්‍රතිමූල්‍ය පහසුකම් සැලසීම පිණිස මෙම ව්‍යාපෘතියේ ණය ආපසු අයකිරීම් යොද ගනිමින් චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීමට ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවශ්‍ය මූලික පියවර ගන්නා ලදී.

## දෙවන බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය අතර 1998 අප්‍රේල් මාසයේදී අත්සන් තැබුණු ණය ගිවිසුමක් අනුව, පළමුවන බහු වාර්ෂික බෝග ව්‍යාපෘතියේ ව්‍යාප්තියක් වශයෙන් දෙවන බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය 1998 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලදී. මෙම නව ව්‍යාපෘතිය උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ හැර සමස්ත දිවයිනම නියෝජනය වන පරිදි ක්‍රියාත්මක වන අතර, 2004 වර්ෂයේ අග භාගයේදී අවසන් වීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන සංරචක පහකින් යුක්ත වන අතර, ඒවා (අ) ණය අරමුදල් (ආ) ගොවිපල උපදේශක සේවා, අලෙවිකරණ කටයුතු, කාර්මික සේවා (ඇ) පර්යේෂණ කටයුතු (ඈ) බීජ හා පැල රෝපණ ද්‍රව්‍ය සහ (ඉ) ආයතනික කටයුතු නගා සිටුවීම යන අංශවලින් සමන්විත වේ. මෙම සංරචක අතුරින් ණය සංරචකය මෙහෙයවීමේ කාර්යභාරය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරණු ලබන අතර, අනෙකුත් සංරචක මෙහෙයවීමේ වගකීම් දරණු ලබන්නේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය විසිනි.

මෙම ව්‍යාපෘතියේ අරමුණු අතර, ණය මුදල් සහ ව්‍යාප්ති සේවා සැලසීම මගින් බහු වාර්ෂික බෝග වගා අංශය සංවර්ධනය සඳහා දයකවීම, බහු වාර්ෂික බෝග සැකසුම් කිරීම සහ අලෙවි කටයුතු වැනි ව්‍යවසායකත්ව ආයතනයන්ගේ සහ ගොවීන්ගේ ලාභදායිත්වය සැලකිය යුතු ලෙස වර්ධනය කිරීම යන අරමුණු වැදගත් වේ. තවද, වාණිජ කෘෂිකාර්මික කටයුතු සඳහා පුද්ගලික අංශයේ සහභාගිත්වය දිරිගැන්වීම තුළින් දිවයිනේ කෘෂිකාර්මික අපනයන පදනම පුළුල් කිරීම සඳහා ද මෙම ව්‍යාපෘතිය උපකාරී වනු ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ බහු වාර්ෂික බෝග අංශයේ සංවර්ධනය සඳහා, සහභාගිවන ණය දෙන ආයතන හරහා මැදි හා දිගුකාලීන ණය මුදහැරීම පිණිස විගැහි දශ ලක්ෂ 11.562 (එ.ජ.ඩොලර් දශ ලක්ෂ 15.685) ක මුදලක් වෙන්කර ඇත.

ව්‍යාපෘතිය යටතේ ඒක පුද්ගල ණය සීමාව එ.ජ.ඩොලර් 150,000 ක් හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණයක් වන අතර ව්‍යාපෘතිය යටතේ සහභාගිත්ව ණය දෙන ආයතන විසින් අනුමත කළහැකි ඒක පුද්ගල ණය සීමාව එ.ජ.ඩොලර් 50,000/- ක් හෝ එම අගයට සමාන ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණයක් වන අතර මෙම සීමාව ඉක්ම වන ණය මුදල් සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය ලබා ගත යුතුවේ. තවද, ව්‍යාපෘතිය යටතේ දෙනු ලබන ණය සඳහා අවුරුදු 6 ක සහන කාලසීමාවක් ඇතුලත් වන අතර වසර 12 කින් කල් පිරෙන උපරිමයක් දක්වා ණය මුදල් නිකුත් කළ හැක. ණය ආපසු ගෙවීමේ කාලය හා සහන කාලය තීරණය කිරීමේදී ව්‍යාපෘතිය මගින් මූල්‍යකරණය කරන ලද වත්කම්, බෝග වලින් අස්වනු ලැබෙන කාලසීමාව සහ ව්‍යාපෘතියේ මුදල් ප්‍රවාහ සැලැස්ම අනුව උප ණයකරුගේ ආපසු ගෙවීමේ හැකියාව යනාදී කරුණු සහභාගිවන ණය දෙන ආයතන විසින් සැලකිල්ලට ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය යටතේ ණය අරමුදල් සපයනු ලබන්නේ ඩීඑෆ්සීසී බැංකුව (DFCC Bank), ජාතික සංවර්ධන බැංකුව (NDB) හැටන් නැෂනල් බැංකුව, කොමර්ෂල් බැංකුව සහ සම්පත් බැංකුව යන සහභාගිත්ව ණය දෙන ආයතන විසිනි. මෙම ව්‍යාපෘතියෙහි ණය මුදල් සඳහා වන පොලී අනුපාතිකය සහ ප්‍රතිමූල්‍ය පොලී අනුපාතිකය ගණනය කරනු ලබන්නේ කාලීන වෙළෙඳපොළ පොලී අනුපාතිකයන්ට ගැලපෙන ලෙස වන අතර, එය වාණිජ බැංකුවල බර තබන ලද සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) මත තීරණය කරනු ලැබේ. ඒ අනුව උප ණයකරුවන් සඳහා මුද හරිනු ලබන ණය මුදල් සඳහා බර තබන ලද සාමාන්‍ය තැන්පතු අනුපාතිකයට (AWDR) වඩා සියයට දෙකක් ඉහළින් ද, ප්‍රතිමූල්‍ය ණය සඳහා එම අනුපාතිකයට (AWDR) වඩා සියයට හයක් පහළින් ද වූ අගයන් පොලී අනුපාතික වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

## දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය 1992 දී ආරම්භ කරන ලද අතර, 1999 දෙසැම්බර් මාසයේදී අවසන් වනු ඇත. මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වන්නේ දකුණු පළාතෙහි රැකියා අවස්ථා සහ ආදායම් මාර්ග වැඩිකිරීම මගින් සහ ආර්ථික හා සමාජයීය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් එම ප්‍රදේශයේ වැසියන්ගේ ආදායම සහ ජීවන තත්ත්වය ඉහළ නැංවීමයි.

ණය සංරචකයේ වටිනාකම රුපියල් දශ ලක්ෂ 466 (විගැහි දශ ලක්ෂ 6.4) ක් වේ. එයින් රුපියල් දශ ලක්ෂ 378.5 ක් හෙවත් සියයට 81 ක් ග්‍රාමීය අංශයේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා සහභාගිවන ණය දෙන ආයතන විසින් මුදහරිනු ලබන ණය ප්‍රතිමූල්‍යකරණය සඳහා ද, ඉතිරි රුපියල් දශ ලක්ෂ 87.5 සණස ආයතනය මගින් මුදහරිනු ලබන ස්වයං රැකියා ණය ප්‍රතිමූල්‍යකරණය සඳහා ද වෙන්කර ඇත. ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (1998 ජූලි මස සිට රුහුණ සංවර්ධන බැංකුව වශයෙන් ඒකාබද්ධ කරන ලද), ඩීඑෆ්සීසී බැංකුව සහ ජාතික සංවර්ධන බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය සංරචකය ක්‍රියාත්මක කිරීමේ සහභාගි වන ණය දෙන ආයතන වේ.

ව්‍යාපෘතිය යටතේ වන උප ණය පොලී අනුපාතිකය සහ ප්‍රතිමූල්‍ය ණය පොලී අනුපාතිකය 1998 වර්ෂයේදී ද පිළිවෙලින් වාර්ෂිකව සියයට 14 ක් සහ සියයට 6 ක් වශයෙන් නොවෙනස්ව පැවතුණි. විමර්ශනයට භාජනය වන වසර තුලදී මහ බැංකුව විසින් මුළු ප්‍රතිමූල්‍ය සැපයීම් රුපියල් දශ ලක්ෂ 303.7 දක්වා ඉහළ ගිය අතර වසර තුළ සපයන ලද ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 86 ක් විය. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ ඩීඑෆ්සීසී බැංකුව විසින් 1998 දී සපයන ලද ණය සංඛ්‍යාව 757 ක් වූ අතර, එම ණයවල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 96 ක් විය. ඒ අනුව, ව්‍යාපෘතිය යටතේ 1998 වසර අවසානය දක්වා නිකුත් කරන ලද මුළු ණය සංඛ්‍යාව 6,656 ක් වූ අතර, එහි මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 342.5 ක් විය.

විමර්ශනයට භාජනය කරනු ලබන වසර තුළ, ණයවල ගුණාත්මක බව වැඩිකිරීම සඳහා පියවර කිහිපයක් ගන්නා ලදී. ඒ අනුව, රුපියල් 100,000 ට වැඩි ණය ලබා ඇති ව්‍යාපෘතීන් ඇගයීමකට ලක් කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදී. රුහුණු සංවර්ධන බැංකුවේ ශාඛා කළමනාකරුවන් සඳහා ණයදීමට සුදුසු ව්‍යාපෘතීන් සඳහා පමණක් ණය සැපයීමට පෙළඹවීමේ හා දැනුවත් කිරීමේ වැඩමුළු තුනක් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ව්‍යාපෘති දිස්ත්‍රික්ක තුනෙහි පවත්වන ලදී. තවද, රුහුණු සංවර්ධන බැංකුව ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයේද සහභාගිත්වය ඇතිව ව්‍යාපෘති ඇගයීම පිළිබඳව පුහුණුවක්ද ඔවුනට ලබාදෙන ලදී.

ණය සංරචකයෙන් සිදුවූ බලපෑම් ඇගයීම සඳහා 1998 දී ව්‍යාපෘති කාර්යාලය මගින් සමීක්ෂණයක් පවත්වන ලද අතර එයට අදළ සමීක්ෂණ වාර්තාව දනටමත් සැකසෙමින් පවතී.

## වයඹ පළාත් ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වන වයඹ පළාත් ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය 1998 දී පස්වන වර්ෂය නිමා කරන ලදී. විගැහි දශ ලක්ෂ 1.6 (රුපියල් දශ ලක්ෂ 100 ක් පමණ) ක් වෙන්කර තිබෙන මෙම ණය යෝජනා ක්‍රමය ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික වගා ළිං ඉදිකිරීම, උස්සාන වාරි ව්‍යාපෘති ඇරඹීම සහ වයඹ පළාතේ ග්‍රාමීය කාන්තාවන්ගේ ආදායම් උත්පාදන අවස්ථා වර්ධනය කිරීමෙහිලා ස්වයං රැකියා ව්‍යාපෘති ඇතිකර ගැනීම වශයෙන් අංශ තුනකින් යුක්තය. ණය යෝජනා ක්‍රමයේ ආරම්භයේ සිටම සී/ස හැටන් නැෂනල් බැංකුව සහ පුත්තලම හා කුරුණෑගල ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහභාගිවන ණය දෙන ආයතන වශයෙන් ක්‍රියාත්මක වූ අතර, 1996 වසරේ සිට ලංකා බැංකුව සහ මහජන බැංකුව ද එම ආයතන අතරට අළුතෙන් එක්වූහ.

1998 දෙසැම්බර් මාසයේදී මෙම සමස්ත ව්‍යාපෘතිය අවසන් වීමට නියමිතව තිබුණත්, ශ්‍රී ලංකා රජය තවත් එක් වර්ෂයක් සඳහා ව්‍යාපෘතිය දීර්ඝ කරන ලෙස ආසියානු

සංවර්ධන බැංකුවෙන් කරන ලද ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යාපෘතියට තවත් මාස 6 ක දීර්ඝ කිරීමක් ලැබුණි. ඒ අනුව 1999 ජුනි 30 දිනෙන් ණය යෝජනා ක්‍රමය අවසාන වීමට නියමිතය.

විමර්ශනයට භාජනය වන වර්ෂය තුළදී ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය වර්ධනය කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව පියවර කිහිපයක් ගත් අතර, සහභාගිත්ව ණය දෙන ආයතනවලට ණය ලැබීමට සුදුසු ප්‍රතිලාභී කාන්තාවන් හඳුනා ගැනීමට ඉඩදීමත්, ස්වයං රැකියා ණය ව්‍යාපෘති සංඛ්‍යාව ඉහළ දැමීමත් ඒවා අතර විය. තවද සහභාගිත්ව ණය දෙන ආයතනවල කාර්ය මණ්ඩලය සහ ණය යෝජනා ක්‍රමය යටතේ සිටින ප්‍රතිලාභීන් සඳහා ණය යෝජනා ක්‍රමයේ අරමුණු සහ විධිවිධාන සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමද ශ්‍රී ලංකා මහ බැංකුව 1998 වසර තුළ ඉටුකරන ලද ක්‍රියාකාරකම් අතර විය.

1998 වර්ෂය අවසන් වනවිට සහභාගිත්ව ණය දෙන ආයතන විසින් කෘෂිකාර්මික වගා ළිං 847 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 28.3 ක් මුදාහැර ඇති අතර, වයඹ පළාතේ කාන්තා ස්වයං රැකියා ව්‍යාපෘති 2,261 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 48.6 ක් මුදාහැර ඇත. 1996 වර්ෂයේ සිට ක්‍රියාකාරී වූ උස්සාන වාරි ව්‍යාපෘති උපාංගය යටතේ ව්‍යාපෘති 94 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 2.7 ක් මුදාහැර ඇත. කෙසේ නමුදු, 1998 වර්ෂය අවසාන වනවිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් දශ ලක්ෂ 59.3 ක ප්‍රතිමූල්‍ය පහසුකම් සහභාගිත්ව ණය දෙන ආයතනවලට ලබාදී ඇත.

## ආසියානු සංවර්ධන බැංකුව (ආ.සං.බැ.) විසින් අරමුදල් සම්පාදිත උතුරු මැද පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (කෘ.සං.ජා.අ.) මගින් අරමුදල් සම්පාදිත උතුරු මැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සම්පාදිත උතුරුමැද පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල මගින් අරමුදල් සම්පාදිත උතුරු මැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය පිළිවෙලින් 1996 දී සහ 1997 දී ආරම්භ විය. මෙම ව්‍යාපෘතීන් දෙකම අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි ගොවි නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමෙන් සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් ගොවීන්ගේ දිළිඳුකම තුරන් කිරීම අරමුණු කරගත් ඒවා වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ව්‍යාපෘති දෙකෙහිම ණය සංරචකයන් මෙහෙයවීමේ ප්‍රධානතම සම්බන්ධීකරණ ආයතනයයි. මුළු ණය සංරචකයෙහි ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 196 ක් වන අතර, එය සහභාගිවන ණය දෙන ආයතන වන මහජන බැංකුව, ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව සහ සෙලාන් බැංකුව විසින් සිය ආයතනයන්හි අරමුදලින් මූල්‍යකරණය කළයුතු වේ. ආරම්භක ව්‍යාපෘති සැලසුමට අනුව ජාතික සංවර්ධන භාරකාර අරමුදලේ මුදල් යොදා ගැනීමට සැලසුම් කර තිබූ නමුත්, එම අරමුදලේ කටයුතු නවතා දැමීමෙන් අනතුරුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහත සඳහන් වාණිජ බැංකු සමග ගිවිස ගන්නා ලදී.

1998 වසර ඉහත සඳහන් කළ නව සහභාගිවන ණය දෙන ආයතන සමග ණය සංරචකය ක්‍රියාත්මක කිරීමේ ආරම්භක වසරවීම නිසා ව්‍යාපෘති කටයුතුවල නියැලෙන නිලධාරීන් පුහුණු කිරීම සඳහා මෙම වසරේ විශේෂ අවධානය යොමු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිවන ණය දෙන ආයතනවල ශාඛා කළමනාකරුවන් මෙම ණය ව්‍යාපෘතියේ අරමුණු සහ මෙහෙයුම් උපදෙස් පිළිබඳව දැනුවත් කරවීම සඳහා වැඩමුළු දෙකක් ව්‍යාපෘති දිස්ත්‍රික්ක දෙකෙහි පවත්වන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ව්‍යාපෘති කටයුතුවලට සම්බන්ධ නිලධාරීන් වෙනුවෙන් පුහුණු පාඨමාලා කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘති දිස්ත්‍රික්ක දෙකෙහි ක්ෂේත්‍ර කටයුතුවල නියැලෙන සමාජ සහ සමෘද්ධි නියාමකයින් 60 දෙනෙකු සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ ඉසුරු ව්‍යාපෘති අත්දැකීම් පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් දෙකක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහෙයවන ලදී.

## සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන (ඉසුරු) ණය ව්‍යාපෘතිය

කෘෂිකර්ම සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර අරමුදල හා කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය අනුග්‍රහයෙන් පිළිවෙලින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 6.7 ක ණය මුදලක් සහ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 6.6 ක ආධාර මුදලක්ද, ශ්‍රී ලංකා රජයේ දායකත්වය ලෙස එ.ජ.ඩොලර් දශ ලක්ෂ 4.1 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද දරමින් ගාල්ල, මාතර, මහනුවර හා පුත්තලම දිස්ත්‍රික්කවල "දිළිඳුකම පිටුදැකීමේ නියමු ව්‍යාපෘතියක්" ලෙස 1990 දී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය සිය පරමාර්ථ කරා ළඟාවීමේ ක්‍රමවේදය ලෙස උපයෝගී කර ගත්තේ " ස්ව උපකාරක කණ්ඩායම්" සංකල්පයයි. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් ආයතනය ලෙස කටයුතු කරයි. ව්‍යාපෘතිය සැලසුම් කරන ලද අවස්ථාවේ අපේක්ෂිත ඉලක්කවලට එළඹීමෙන් අනතුරුව 1997 දෙසැම්බර් මස අවසානයේදී ව්‍යාපෘතියට ලැබුණු විදේශීය අරමුදල් නවතා දැමුවද ණය ගිවිසුමෙහි කොන්දේසිවලට එකඟව චක්‍රීය අරමුදල උපයෝගී කරගනිමින් 1998 වසර තුළදී ද ව්‍යාපෘතිය සිය කටයුතු අඛණ්ඩව මෙහෙය වීය.

1998 වසර අවසන් වනවිට දිස්ත්‍රික්ක හතර තුළ ව්‍යාපෘතිය මගින් ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ ආවරණය කරන ලද ගම්මාන සංඛ්‍යාව 2,312 ක් වන අතර ගොඩ නගන ලද "ස්ව උපකාරක කණ්ඩායම්" සංඛ්‍යාව 8,722 කි. ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී අපේක්ෂිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව වූයේ 32,000 ක් වුවද, මෙම කණ්ඩායම් තුළින් ව්‍යාපෘතියෙහි ප්‍රතිලාභ ලැබූ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 52,933 ක් විය. මෙහිදී සඳහන් කළ යුතු සුවිශේෂ ලක්ෂණය වන්නේ මුළු ප්‍රතිලාභීන්ගෙන් සියයට 67 ක් වූ 35,711 ක්ම සමන්විත

වන්නේ කාන්තා සහභාගිත්වයෙනි. 1998 වසර අවසන් වනවිට ප්‍රතිලාභීන් 45,034 දෙනෙකුගේ ආදයම් උත්පාදන ස්වයං රැකියා මූල්‍යනය කිරීම සඳහා රුපියල් දශ ලක්ෂ 416 ක මුදලක් සුළු ණය වශයෙන් ව්‍යාපෘතිය මගින් ලබාදී ඇත. ණය මුදලක සාමාන්‍යය රුපියල් 9,000 ක් වූ අතර වසර මුළුල්ලේම පවත්වාගෙන ගිය ආපසු අයකිරීමේ අනුපාතය සියයට 94 කි. මීට අමතරව ව්‍යාපෘතියෙහි ඉතිරි කිරීම් රාශීකරණ යෝජනා ක්‍රමය යටතේ 1998 අවසානයේදී ප්‍රතිලාභීන්ගේ කණ්ඩායම් ඉතිරි කිරීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 61.38 ක් විය.

1998 වසරේදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු වලට ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම සඳහා චක්‍රීය අරමුදලට රැස්කළ ණය ආපසු අයකිරීම් භාවිතා කළ අතර ව්‍යාපෘතියේ පරිපාලන හා පුහුණු කිරීම් වියදම් සපුරා ගනු ලැබුවේ අතිරේක අරමුදල් ආයෝජනයෙන් ලත් පොලී ආදායමෙනි.

වසර අවසන් වනවිට ව්‍යාපෘතියේ ණය ලබාදීමට හා අනෙකුත් උපකාරක සේවා සැපයීම පිණිස පිහිටුවන ලද කුඩා ස්ව උපකාරක කණ්ඩායම් අත්දැකීම් සහිතව පරිනතභාවයට පත්වී තිබූ අතර ව්‍යාපෘති කටයුතු අවසන් වීමෙන් පසු ප්‍රතිලාභීන්ගේ තිරසාර බව සහ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සමග අඛණ්ඩ සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමට හැකිවන පරිදි කණ්ඩායම් ක්‍රමය ආරක්ෂා කර ගනිමින්ම එම කණ්ඩායම් ඒකරාශී කරමින් විශාල ස්වේච්ඡා සංවිධානයක් ගොඩනැංවීමේ දැඩි අවශ්‍යතාවයක් ඇතිවී තිබුණි. මේ අනුව එක් ගම්මානයක ක්‍රියාත්මක වන ස්ව උපකාරක කණ්ඩායම් ඒකරාශී කොට සමිති ආඥා පනත යටතේ ක්‍රියාත්මක වන සීමිත වගකීම් සහිත ස්වාධීන ආයතන වශයෙන් සමාගම් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි වූ "ඉසුරු සංවර්ධන සමිති" පිහිටුවන ලදී. 1998 වසර අවසන් වනවිට දිස්ත්‍රික් හතර තුළ මෙවැනි සමිති 160 ක් පිහිටුවනු ලැබූ අතර මෙම සමිති ඒකාබද්ධ කරමින් දිස්ත්‍රික්ක හතරට අදාළව " දිස්ත්‍රික් ඉසුරු සංවර්ධන සමිති මහා සංගම්" හතරක් පිහිටුවීමටද ව්‍යාපෘතිය සමත් විය. මෙම මහා සංගම් රාජ්‍ය නොවන සංවිධාන ලෙස සමාගම් ආඥා පනත යටතේ ලියාපදිංචි කිරීමට පියවර ගෙන තිබෙන අතර වසර අවසන් වනවිට සාමාජිකයින්ට නිකුත් කර ඇති කොටස් ප්‍රාග්ධනය රුපියල් දශ ලක්ෂ 2.87 කි. රාශිකරණය ඇති මුළු ඉතිරි කිරීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2.25 ක් වන අතර සමිති අරමුදල් භාවිතා කර සාමාජිකයන්ට ලබාදී ඇති මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 13.81 කි.

1998 වසර තුළදී ශ්‍රී ලංකා රජය ජපන් රජයෙන් කළ ඉල්ලීමක් අනුව ජපානයේ විදේශීය ආර්ථික සහයෝගිතා අරමුදල මෙම ව්‍යාපෘතියෙහි කටයුතු කළුතර, හම්බන්තොට, බදුල්ල, නුවරඑළිය, මාතලේ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල දියත් කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සැපයීමට ඇති හැකියාව පරීක්ෂාවට ලක්කිරීමට එකඟ වූ අතර ඊට අදාළ මූලික ඇගැයීම් කටයුතු ආරම්භ කෙරිණ. මෙම ඇගැයීම් කටයුතුවලට අනුව ජපන් රජයේ අනුමැතිය මේ සඳහා ලබාගැනීමට හැකි වුවහොත් 1999 වසර තුළදී තෝරාගත් දිස්ත්‍රික්කවල මෙම ව්‍යාපෘති කටයුතු ආරම්භ කරනු ඇත.

## ආහාර හා පෝෂණ ප්‍රවර්ධන ණය ව්‍යාපෘතිය

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ආරම්භ කරන ලද ආහාර හා පෝෂණ ප්‍රවර්ධන ණය ක්‍රමය යටතේ ණය දෙන ආයතනවලට කෘෂි බෝග නිෂ්පාදනය, කෘෂි ද්‍රව්‍ය හා පොහොර තොග රැස්කිරීම, කෘෂි නිෂ්පාදන සැකසීම හා අලෙවිය සහ පශු සම්පත් සංවර්ධනය සඳහා ණය මුදා හැරීමට අරමුදල් සපයනු ලැබේ. මෙම ණය ක්‍රමයට අරමුදල් සපයන ජපන් රජයේ විශේෂිත අනුමැතිය ණය ක්‍රමය යටතේ අරමුදල් සපයන උප ව්‍යාපෘති සඳහා ලබා ඇත.

ණය ව්‍යාපෘතිය මගින් ඉලක්ක කරනු ලබන්නේ මෙරට ආහාර නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සහ අඩු පිරිවැයකින් කෘෂි අංශයට ණය සැපයීම සඳහා ගොවි සංවිධාන, සමුපකාර සමිති හා ග්‍රාමීය සංවිධාන මගින් ණය මුදල් මුදාහැරීමට ණය දෙන ආයතන ධෛර්යවත් කිරීමය.

මෙම ණය ක්‍රමය සඳහා රජය විසින් වෙන්කර ඇති මුළු මුදල රුපියල් දශ ලක්ෂ 284 කි එම මුදලින් රුපියල් දශ ලක්ෂ 100 ක් 1997/98 සඳහා අනුමත උප ව්‍යාපෘති මූල්‍යකරණය පිණිස මහ බැංකුවට සපයා ඇත.

1998 අවසානයේදී සහභාගිත්ව ණය දෙන ආයතන විසින් රුපියල් දශ ලක්ෂ 97.5 ක මුදල් කිරිපට්ටි සංවර්ධනය (රුපියල් දශ ලක්ෂ 34), පළතුරු හා එළවළු නිෂ්පාදනය (රුපියල් දශ ලක්ෂ 34), සහල් සැකසීම (රුපියල් දශ ලක්ෂ 22), කෙසෙල් වගාව (රුපියල් දශ ලක්ෂ 5.8), බිත්තර ගබඩා කිරීම (රුපියල් දශ ලක්ෂ 1.4) හා ඇඹරුම්හල් (රුපියල් දශ ලක්ෂ 0.3) සඳහා අනුමත කොට ඇත.

## කෑගල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්) ව්‍යාපෘතිය

1997 මැද භාගයේදී මෙම ව්‍යාපෘතිය අරඹන ලදී. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති බලප්‍රදේශයේ වෙසෙන ගොවීන් සහ ව්‍යවසායකයින්ගේ ආදායම, සුළු ණය ව්‍යාපෘති මගින් වැඩිදියුණු කරගැනීම සඳහා ණය පහසුකම් ලබාදෙනු ලැබේ.

විමර්ශනයට භාජනය වන වර්ෂය තුළ කෑගල්ල දිස්ත්‍රික්කයේ ව්‍යාපෘතීන් 1,029 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 50 ක් පමණ ණය මුදලක් සහභාගිත්ව ණය දෙන ආයතන විසින් මුදාහැර ඇති අතර, අදාළ කාලය තුළ ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව මගින් රුපියල් දශ ලක්ෂ 45 ක් පමණ ප්‍රතිමූල්‍ය වශයෙන් සහභාගිත්ව ණය දෙන ආයතන වෙත මුදාහැර ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ ලබාදෙන ලද ණය මුදල් උපයෝජනය පිළිබඳ තත්ත්වයන් තක්සේරු කිරීම සඳහා 1998 මාර්තු මාසයේදී මහ බැංකුව විසින් ක්ෂේත්‍ර සමීක්ෂණයක් පවත්වන ලදී. මෙම ක්ෂේත්‍ර සමීක්ෂණයේ දත්ත මගින් ණයලාභීන් විසින් ලබාගෙන ඇති ණය මුදල්වලින් සියයට 90 ක් පමණ ඵලදායී අන්දමින් භාවිතා කර ඇති බව පිළිබිඹු වේ.

## II-15 වැනි සංඛ්‍යා සටහන
## ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කෙරෙන ණය වැඩ සටහන්

| ව්‍යාපෘතියේ නම | අරමුදල් සපයනු ලබන ආයතනය | පුළුල් අරමුණ | මුලිකව වෙන් කරන ලද මුදල | ණයකරුවන් සඳහා වන පොලී අනුපාතය (%) | 98.12.31 දිනට දෙන ලද ණය (රු.දශලක්ෂ) | ණය ආපසු අයකර ගැනීමේ අනුපාතය(%) |
|---|---|---|---|---|---|---|
| 1. කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය (1989-1997) | ආසියානු සංවර්ධන බැංකුව(ADB) | කුඩා තේ වතු හිමියන්ගේ තේ නිෂ්පාදනය හා ඵලනයනය වැඩි කිරීම, තේ අංශයේ ආයතනික ක්‍රමය දියුණු කිරීම හා රැකියා අවස්ථා පුළුල් කිරීම. | එ.ජ.ඩොලර් දශ ලක්ෂ 12.6 | 14.0<br>14.3 | 724.3 | 91.0 |
| 2. බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය (1989 - 1997) | -එම- | බහු වාර්ෂික බෝග නිෂ්පාදනය හා වාණිජකරණය වැඩිදියුණු කිරීම. | එ.ජ.ඩොලර් දශ ලක්ෂ 13.2 | 14.0 | 693 | 60.0 |
| 3. දෙවැනි බහුවාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය (1998-2004) | -එම- | බහු වාර්ෂික බෝග නිෂ්පාදනය වාණිජකරණය කිරීම, පැල තවාන් සංවර්ධනය කිරීම,පසු අස්වනු සැකසීම වැඩිදියුණු කිරීම හා එම බෝග අලෙවි කටයුතු වැඩි දියුණු කිරීම | එ.ජ.ඩොලර් දශ ලක්ෂ 11.562 | බර තබන ලද සාමාන්‍ය තැන්පතු අනුපාතය +2(වර්තමාන -12) | – | – |
| 4. දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (1992-1999) | -එම- | දකුණු පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම. | එ.ජ.ඩොලර් දශ ලක්ෂ 8.1 | 14.0 | 342.5 | – |
| 5. වයඹ පළාත් ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (1993 - 1999) | -එම- | ව්‍යාපෘතියට අයත් ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික, සමාජීය හා පෝෂණ තත්ත්වයන් නංවාලීම | එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2.7 | 14.0 | 79.6 | 90.0 |
| 6. උතුරු මැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (1996-2006)<br>උතුරු මැද පළාතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (1997-2003) | ADB, IFAD SIDA සහ WFP | අඩු ආදයම් ලබන පවුල්වල දිළිඳු බව නැති කිරීම හා ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය වැඩිකිරීම හා අඩු ආදයම් ලබන පවුල්වල රැකියා අවස්ථා වැඩිකිරීම. | ශ්‍රී ලංකා රු. දශ ලක්ෂ 153 හා ශ්‍රී ලංකා රුපියල් දශ ලක්ෂ 43 | පවතින වෙළෙඳපොළ පොලී අනුපාතය | – | – |
| 7. සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය (1990-1997) | IFAD, CIDA, GOS L | රැකියා අවස්ථා ඇති කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා පිරිවැය අවම කරගත හැකි සුළු ණයදීමේ ක්‍රමයක් ආරම්භ කිරීම. | විගැහි දශ ලක්ෂ 4.85 | 16.0 (කෘෂි)<br>20.0 (වෙනත්) | 367.0 | 94.0 |
| 8. ආහාර හා පෝෂණ ප්‍රවර්ධන ණය යෝජනා ක්‍රමය (1997 දී ආරම්භ කරන ලදී.) | ජපන් රජය | ආහාර නිෂ්පාදනය හා ආහාර පැකපීමේ ක්‍රම දියුණු කිරීම. | ශ්‍රී ලංකා රුපියල් දශ ලක්ෂ 284 | 10.0 | 2.6 | – |
| 9. නව සපිරි ග්‍රාමීය ණය යෝජනාක්‍රමය (1986 සිට ඉදිරියට) | සහභාගිත්ව ණය දෙන ආයතන (ශ්‍රී ලංකා රජයේ පොලී සහනාධාර ඇතුව | කෙටිකාලීන ආහාර බෝග වගා කරන ගොවීන් නගා සිටුවීම. | – | 12.0 | 422(97/98 මහ හා 98 යල) | 70.0 (සමස්ත) |
| 10. කැගල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය(1997-2007) | ශ්‍රී ලංකා රජය | ව්‍යාපෘති ප්‍රදේශය තුළ ආදයම් ඉපැයීමේ කටයුතු වර්ධනය කිරීම මගින් පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම. | ශ්‍රී ලංකා රුපියල් දශ ලක්ෂ 100 | 10.0 | 50 | – |
| 11. සුරතුර ණය වැඩ සටහන අදියර 2 (1998 සිට ඉදිරියට) | සහභාගිත්ව ණය දෙන ආයතන (ශ්‍රී ලංකා රජයේ පොලී සහනාධාර ඇතුව) | ස්වයං රැකියා ව්‍යාප්ත කිරීම මගින් රැකියා විරහිත උගත් තරුණයන්ගේ ආදයම් වැඩි කිරීම හා ජීවන තත්ත්වය උසස් කිරීම. | ශ්‍රී ලංකා රුපියල් දශ ලක්ෂ 1000 | 10.0 | 575.2 | 59.0 (98.06.30 දිනට) |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## සුරතුර වැඩ සටහන - කුඩා ව්‍යවසාය ණය තුළින් ස්වයං රැකියා ප්‍රවර්ධනය

නව මුහුණුවරකින් 1997 වර්ෂයේදී, ආරම්භ කරන ලද සුරතුර වැඩ සටහනේ ii වන අදියර 1998 වර්ෂය තුළදීද, ලංකා බැංකුව, මහජන බැංකුව හා හැටන් නැෂනල් බැංකුවේ සහභාගිත්වයෙන් නොකඩවා ක්‍රියාත්මක විය. රජය මගින් සපයන ලද ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ 1996 වර්ෂයේදී හඳුන්වා දුන් සුරතුර පළමු වැඩ සටහන තුළින් අරමුණු කරන ලද්දේ විශේෂයෙන්ම රැකියා විරහිත උගත් තරුණ පිරිසට කුඩා ව්‍යවසාය මගින් ස්වයං රැකියා අවස්ථා ඇතිකර ගැනීම සඳහා කුඩා ප්‍රමාණයේ ණය මුදල් සැපයීමය. මෙම වැඩ සටහනේ II වන අදියර යටතේ සුළු ප්‍රමාණයේ ණය මුදල්, සහභාගිත්ව ණය දෙන ආයතන ඔවුන්ගේ අරමුදල් වලින් ණය සැපයේ. අවසාන ණයකරුවන්ට වාර්ෂිකව සියයට 10 ක සහනදායී පොලියකට ණය ලබාදීම පවත්වා ගෙන යෑම සඳහා රජය විසින් සහභාගිත්ව ණය දෙන ආයතනවලට සියයට 10 ක පොලී සහනාධාරයක් ලබාදෙන ලදී.

මෙම කුඩා ව්‍යවසාය ණය සඳහා පවතින ඉහළ ඉල්ලුම සැළකිල්ලට ගනිමින් II වන අදියරේ මූලික ඉලක්කයන් සංශෝධනය කරමින් ව්‍යාපෘති ඒකක 10,000, ඒකක 20,000 දක්වාත්, ණය මුදල් වටිනාකමට පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 500 සිට රුපියල් දශ ලක්ෂ 1,000 දක්වාත් ඉහළ නංවන ලදී. අදළ සහභාගිත්ව ණය දෙන ආයතන තුන රුපියල් දශ ලක්ෂ 1,310 ක් වටිනා ණය මුදල් 25,095 ක් පිරිනමා ඇත. මෙයින් 1998 වර්ෂය අවසන් වනවිට රුපියල් දශ ලක්ෂ 575 මුදල් ව්‍යාපෘති 15,116 ක් වෙනුවෙන් මුදහැර ඇත. සහභාගිත්ව ණය දෙන ආයතන විසින් I වැනි අදියර යටතේ ලබාදෙන ලද ණය මුදල් වලින් ආපසු අයකර ගැනීමේ සමස්ත අනුපාතිකය ලංකා බැංකුව සියයට 69 ක්ද, මහජන බැංකුව සියයට 59 ක්ද , හැටන් නැෂනල් බැංකුව සියයට 89 ක්ද ලෙස පවත්වා ගැණුනි.

1998 ජුලි මසයේදී සුරතුර I වන අදියරය අගැයීම් සඳහා සමීක්ෂණයක් පවත්වන ලදී. මෙම සමීක්ෂණයෙන් අදහස් කරන ලද්දේ මෙම යෝජනා ක්‍රමය යටතේ අරඹන ලද ව්‍යාපෘතිවලට ණය මුදල් උපයෝජනය කිරීම පිළිබඳ ප්‍රගතිය ඇගයීම මත, ණය මුදල් ආපසු අයකර ගැනීමේ ප්‍රගතිය ඇගයීමත් සහ ඉලක්ක කණ්ඩායම් වෙත ණය මුදල් මුද හැරීම සම්බන්ධව වූ කරුණු පිළිබඳවත්ය.

මෙම සමීක්ෂණය තුළින් ලද සොයා ගැනීම් ව්‍යාපෘතියේ ප්‍රගතියන් මිශ්‍ර ප්‍රතිඵල පෙන්නුම් කරයි. ව්‍යාපෘතියේ ඉලක්ක කණ්ඩායම් වූයේ උගත් රැකියා විරහිත තරුණ පිරිස් වුවද, ඉන් පරිබාහිර සාපේක්ෂව ආදයම් මට්ටමක් ඇති පුද්ගලයන් වෙතද, මෙම ව්‍යාපෘතියෙන් ණය මුදල් ලබාදී ඇති බව හෙළි විය. මෙම වැඩසටහන යටතේ මූල්‍යකරණය ලද මුළු ව්‍යාපෘති වලින් සියයට 42 ක් අළුතින් ආරම්භ කරන ලද ව්‍යාපෘතීන් සඳහා විය. ණය දෙන ආයතන විසින් ලබාදෙන ලද මුළු ණය මුදල් වලින් සියයට 79 ක් කුඩා පරිමාණ වාණිජ අංශ සඳහා වන අතර, ඉතිරිය කෘෂිකාර්මික හා සේවා කටයුතු සඳහා විය. සුරතුර ණය යෝජනා ක්‍රමය යටතේ සමීක්ෂණයට භාජනය වූ මූල්‍යකරණය කර ඇති ව්‍යාපෘතීන්ගෙන් සියයට 39 ක් පමණ ණය මුදල් ආපසු ගෙවීම පිළිබඳව සතුටුදයක තත්ත්වයක් වාර්තා කර ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගැයීම සඳහා වූ මෙම සමීක්ෂණය තුලින් ලද තොරතුරු අනුව ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ වෙනස්කම් 1998 වර්ෂය තුළදී සිදු කරනු ලැබීය.

## බැංකු අධ්‍යයන කේන්ද්‍රය

1998 දෙසැම්බර් 21 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය බැංකු අධ්‍යයන කේන්ද්‍රය ලෙස වෙනස් කරන ලදි. 1998 වර්ෂය තුළදී බැංකු අධ්‍යයන කේන්ද්‍රය මගින් පුහුණු ලාභීන් 926 දෙනෙක් සඳහා පුහුණු පැය 1875 කින් සමන්විත පුහුණු පාඨමාලා 47 ක් පවත්වනු ලැබීය. මේ සඳහා මහ බැංකු සේවකයින් 263 දෙනෙකු ද, ප්‍රාදේශීය සංවර්ධන බැංකු (ප්‍රා.සං.බැ.) සහ ප්‍රදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං.බැ.) සේවකයින් 247 දෙනෙකු ද, වාණිජ බැංකු වලින් 200 දෙනෙකු ද සහභාගී වූහ. ඉතිරිය සංවර්ධන බැංකු, මූල්‍ය සමාගම් සහ අනෙකුත් ආයතන වලින් නියෝජනය විය. සියළු පාඨමාලා බැංකු අධ්‍යයන කේන්ද්‍ර භූමියේ දී පවත්වනු ලැබී ය.

1998 දී බැංකු අධ්‍යයන කේන්ද්‍රය මගින් සාර්ථකව පාඨමාලා නිම කරන අයට ඩිප්ලෝමා හෝ සහතික පත්‍ර ප්‍රදනය කිරීමේ අරමුණින් සාපේක්ෂව දිගුකාලීන පාඨමාලා ප්‍රථමයෙන් පවත්වන ලදී. මෙම පාඨමාලා අතර මහ බැංකු කටයුතු, වාණිජ බැංකු කටයුතු, කළමනාකරණ සංවර්ධන යන මූලික විෂයයන් සඳහා ඩිප්ලෝමා පාඨ-මාලාවන් 3 ක් ද, උසස් ගිණුම්කරණ විෂය සඳහා සහතික පත්‍ර පාඨමාලාවක්ද විය. මෙම පාඨමාලා අර්ධකාලීන පදනමක් මත පවත්වන ලදී. පුහුණු පාඨමාලා 47 න් 9 ක් ප්‍රාදේශීය සංවර්ධන බැංකු සහ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සේවකයන්ට සීමා විය. ස්වර්ණාභරණ උකස් මත ණය දීම, ණය දීම සඳහා බලපාන ඇප සහ අදල නීතිමය ක්‍රියාපටිපාටි, ගිණුම්කරණය, කළමනාකරණය සහ ව්‍යාපෘති ඇගැයීම යන විෂය ක්ෂේත්‍ර මෙම පාඨමාලා වලින් ආවරණය විය. ප්‍රධාන වශයෙන් මහ බැංකු නිලධාරීන් පුහුණු කිරීම සඳහා පරිගණක භාවිතය පිළිබඳ පාඨමාලා 10 ක් පවත්වන ලදී. තවද, මහ බැංකු කාර්ය මණ්ඩලය සඳහා ඉංග්‍රීසි භාෂාව, වාර්තා ලිවීම සහ ගිණුම්කරණය පිළිබඳ අදල පුහුණු පාඨමාලාවන් ද පවත්වන ලදී. විදේශ විනිමය ගණුදෙණු, අරමුදල් කළමනාකරණය, මූල්‍ය අංශයේ මෑතකාලීන සංවර්ධනයක්, බැංකු සඳහා උපායශීලී සැලසුම්කරණය, සඵල ණය කළමනාකරණය, කොළඹ කොටස් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය, කුලී පිට මිළදී ගැනීම් සහ කල් බදු, රාජ්‍ය ණය සුරැකුම්පත් වෙළෙඳපොළ, විදේශ විනිමය ලිහිල්කරණය, විශිෂ්ඨත්වය සඳහා කළමනාකරණය - නායකත්වය, ගුණාත්මකභාවය සඳහා කණ්ඩායම් ක්‍රියාකාරිත්වය සහ විශ්‍රාම ගැනීමෙන් පසු ජීවන රටාව යන ප්‍රධාන ක්ෂේත්‍රයන් යටතේ අනිකුත් පුහුණු පාඨමාලා පවත්වනු ලැබීය.

ඉහත පුහුණු පාඨමාලාවන්ට අමතරව බැංකු අධ්‍යයන කේන්ද්‍රය මගින් විශේෂ පාඨමාලා 17 ක් පවත්වන ලදී. එයින් 12 ක් මහ බැංකු සේවකයින් සඳහා විය. විදේශ විනිමයට අදාල අවදානම් කළමනාකරණය, ද්‍රවශීලතා කළමනාකරණය, බැංකු සුපරීක්ෂණ ශිල්පී ක්‍රම, බැංකු සඳහා තොරතුරු පද්ධති විගණනය සහ රක්ෂණය, ප්ලාස්ටික් කාඩ් මෙහෙයුම්, සහතික කරන ලද බැඳුම්කර ලිපි, භාණ්ඩ මිළට ගැනීම පිළිබඳ ලෝක බැංකු නීති යනාදී ක්ෂේත්‍ර මෙම පාඨමාලා වලින් ආවරණය විය. තවද, බැංකුවට බඳවා ගනු ලැබූ නවකයින් සඳහා නම්නීකරණ පාඨමාලාවක් ද පවත්වනු ලැබී ය.

1998 වර්ෂයේ මෙම අධ්‍යයන කේන්ද්‍රය විසින් මහ බැංකු ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ සහ සමරු දේශන මාලාවක් ආරම්භ කරන ලදී. ප්‍රසිද්ධ දේශන මාලාව තුළින් නූතන ආර්ථික ප්‍රතිපත්ති සහ ගැටළු පිළිබඳ ජනතාව තුළ වූ දැනුම පුළුල් කරලීම අපේක්ෂා කෙරිණ. නව අදහස් පතුරුවාලීම සහ ආර්ථික සහ මූල්‍ය අංශයන්හි සංවර්ධනයන්ට අදල ගැටළු පිළිබඳව අදහස් සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා මූල්‍ය අංශය, අධ්‍යාපනික ක්ෂේත්‍රය හා රාජ්‍ය අංශයෙහි නිරත වෘත්තියමය පුද්ගලයින්ට අවස්ථාව ලබා දීම සමරු දේශනයන්හි අභිප්‍රාය විය. නිදහස් සමරු දේශනය, ජනරජ සමරු දේශනය, මහ බැංකු සංවත්සර දේශනය සහ ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලීය සංවත්සර දේශනය නමින් හඳුන්වනු ලැබූ සිහිවටන දේශන 4 ක් 1998 දී පවත්වනු ලැබී ය. මෙම දේශන පවත්වනු ලැබුවේ බැංකු, මූල්‍ය, සහ ආර්ථික විද්‍යාව පිළිබඳ පෘථුල දැනුමකින් යුතු පුද්ගලයන් විසිනි. මෙම දේශන මහ බැංකු කාලීන පත්‍රිකා මාලාව යටතේ මුද්‍රණය කරන ලදී.

"ශ්‍රී ලංකාවේ 50 වසරක ආර්ථික සංවර්ධනය" යන මාතෘකාව මත නිදහස් සමරු දේශනය පවත්වනු ලැබුවේ අන්ක්ටාඩ් (UNCTAD) සමුළුවේ හිටපු මහ ලේකම් ආචාර්ය ගාමිණී කොරයා මහතා විසිනි. " ඉදිරි දශකය සඳහා වූ ආර්ථික ප්‍රමුඛතාවයන් " යන මාතෘකාව මත ජනරජ සමරු දේශනය පවත්වනු ලැබුවේ සීමාසහිත වනික් ආයතනයේ සභාපති ආචාර්ය ඩබ්ලිව්. එම්. තිලකරත්න මහතා විසිනි. "බැංකු සුපරීක්ෂණය සහ නීතිමය ක්‍රියාපටිපාටි" යන මාතෘකාව මත මහ බැංකුවේ 48 වෙනි සංවත්සර සමරු දේශනය පවත්වනු ලැබුවේ බැංකු සුපරීක්ෂණය පිළිබඳ 'බාල්' කමිටුවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් චාල්ස් ඒ ෆ්‍රීලන්ඩ් මහතා විසිනි. " ප්‍රජා ක්‍රාන්තිය : අභියෝග සහ අවස්ථා" යන මාතෘකාව යටතේ විද්‍යාලීය සංවත්සර දේශනය පවත්වනු ලැබුවේ ජාතික සංවර්ධන බැංකුවේ සභාපති ආචාර්ය එන්. ටී. එච්. සඳරත්න මහතා විසිනි.

1998 දී ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ 9 ක් පවත්වනු ලැබී ය. මෙම සම්මන්ත්‍රණවලදී ප්‍රධාන කථිකයා විසින් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර තවත් දේශකයින් දෙදෙනෙකු විසින් ඊට අදලව සිය අදහස් ඉදිරිපත් කරන ලදී. සම්මන්ත්‍රණවල මාතෘකා සහ ප්‍රධාන කථිකයින්ගේ නාම ලේඛණය පහත දක්වා ඇත.

| | | | |
|---|---|---|---|
| i. | "දකුණු ආසියාතික ආර්ථික අර්බුදය : ශ්‍රී ලංකාව සඳහා ආදර්ශ" | - | නිමල් රත්නායක මයා<br>ගණකාධිකාරී<br>ශ්‍රී ලංකා මහ බැංකුව |
| ii. | "ලෝක ආර්ථිකය තුළ අන්තර් ජාතික මූල්‍ය අරමුදලේ සහ ලෝක බැංකුවේ ඉදිරි කාර්ය භාරය" | - | ඇන්ටන් ඔප් ඩි බෙකේ මයා<br>අන්තර් ජාතික මූල්‍ය අරමුදලේ<br>ශ්‍රී ලංකා නේවාසික නියෝජිත |
| iii. | "දකුණු ආසියාවේ මෑතකාලීන සංවර්ධනයන්" | - | ආචාර්ය එච්.එන්.තේනුවර මයා<br>ජ්‍යෙෂ්ඨ අර්ථශාස්ත්‍රඥ<br>ශ්‍රී ලංකා මහ බැංකුව |
| iv. | "1997 ශ්‍රී ලංකා ආර්ථිකය සහ 1998 සඳහා අපේක්ෂා (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව තුළින් ඉස්මතු කර ඇති තොරතුරු)" | - | ආර්.ඒ.ජයතිස්ස මයා<br>ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ<br>ශ්‍රී ලංකා මහ බැංකුව |
| v. | "ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තියේ මෑතකාලීන ප්‍රවනතා" | - | ආචාර්ය පී.ඩබ්.ආර්.බී.ඒ.යූ.හේරත් මයා<br>ජ්‍යෙෂ්ඨ අර්ථශාස්ත්‍රඥ<br>ශ්‍රී ලංකා මහ බැංකුව |
| vi. | "ලෝක වෙළෙඳම සහ ආරක්ෂණවාදය : ශ්‍රී ලංකාව සඳහා ගැටලු" | - | ආචාර්ය එච්.එන්.තේනුවර මයා<br>ජ්‍යෙෂ්ඨ අර්ථශාස්ත්‍රඥ<br>ශ්‍රී ලංකා මහ බැංකුව |
| vii. | "යූරෝ සහ එමගින් ශ්‍රී ලංකාවට වන බලපෑම්" | - | ගෝඩින් ඕ නෙල්සන් මහතා<br>ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරී - මහ බැංකු (ආසියාව)<br>මෝගන් ගරන්ටි ට්‍රස්ට් සමාගම<br>නිව්යෝක් සිංගප්පූරුව |

viii. "අයවැය තුළින් ඉස්මතු වන තොරතුරු" - ආර්.ඒ. ජයතිස්ස මයා
ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා මහ බැංකුව

ix. "ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනයන් : පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණයේ මූලික සොයාගැනීම් - 1996/97" - ආචාර්ය එස්.එස්.කොළඹගේ මයා
සංඛ්‍යාන අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා මහ බැංකුව

විමර්ශනයට භාවිතය වූ වසර තුලදී ශ්‍රී ලංකා මහ බැංකු සේවකයින් 150 දෙනෙකුට බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ වූ ස්වයං අධ්‍යයන පිවිසුම තුලින් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමට අවස්ථාව ලැබිණි. මෙයට සහයෝගී වශයෙන් වාචික පණිවුඩ හුවමාරුව සහ වාර්තා ලිවීමේ කුසලතා වර්ධනය සඳහා පංති ද පවත්වනු ලැබීය. බැංකු කටයුතු අධ්‍යයන ව්‍යාපෘතියේ වූ පුස්තකාලය මගින් මහ බැංකු කාර්ය මණ්ඩලයට, විද්‍යාලීය කාර්ය මණ්ඩලයට සහ දේශීය සහ විදේශීය විශ්ව විද්‍යාලයන්හි පර්යේෂණ නිලධාරීන්ට අවශ්‍ය තොරතුරු සහ දත්ත සැපයීම සිදු කරනු ලැබී ය. අධ්‍යයන කේන්ද්‍රයේ පුස්තකාලයට අලුතින් පොත් 350 ක් එකතු කරනු ලැබූ අතර කාලීන සඟරා 52 කට දායක වී ඇත.

## සේවක අර්ථසාධක අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් පනතේ (සේ.අ.අ.) විධිවිධාන අනුව දායක මුදල්, දඩ මුදල් සහ ආයෝජන ආදායම් ලබා ගැනීම, ලියාපදිංචි කරන ලද සේවා යෝජකයින්ගේ හා අරමුදලේ සාමාජිකයින්ගේ ගිණුම් නිසි ලෙස පවත්වාගෙන යාම සහ සාමාජිකයන් වෙත ප්‍රතිලාභ ගෙවීමේ කටයුතු වන වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. මෙම විධිවිධාන මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා පරිපාලන කටයුතු පැවරී ඇති කම්කරු කොමසාරිස් දෙපාර්තමේන්තුව සමග සමීප සබඳතාවයකින් යුතුව ඉහත සඳහන් කටයුතු පවත්වාගෙන යනු ලැබේ.

1996 දී එල්ල වූ බෝම්බ ප්‍රහාරය හේතුවෙන් එවකට පරිගණකගත කරන ලද දත්ත සහ දෙපාර්තමේන්තු ලිපි ලේඛන බොහොමයක් විනාශයට පත් වූ අතර, අළුතින් සකස් කරන ලද මෘදුකාංග යොද ගනිමින් නව අයි.බී.එම්.ඒ.එස් 400 පරිගණකය මගින් සේවක අර්ථසාධක අරමුදලේ සාමාජික ගිණුම්වල දත්ත යථා තත්ත්වයට පත් කිරීම හා යාවත්කාලීන කිරීම සිදු කරනු ලැබීය.

බෝම්බ පිපිරීම හේතුකොටගෙන අඩාල වූ 1994 සහ 1995 වර්ෂවල සියළුම සාමාජිකයන්ගේ ගිණුම් ප්‍රකාශ 1997 දී නිකුත් කරන ලදී. 1996 සහ 1997 වර්ෂ සඳහා වූ සාමාජික ගිණුම් ප්‍රකාශ ද විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම තුළින් සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කිරීමට කටයුතු කෙරිණි.

### දායක මුදල්

තාවකාලික දත්ත අනුව 1997 වර්ෂයේ දී ලැබූ රුපියල් බිලියන 10.8 හා සසඳ බලන කල 1998 වර්ෂය තුළදී අරමුදලට ලැබුණ දායක මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 12.2 ක් විය. එය පෙර වර්ෂයේ ලැබූ දායක මුදල් මට්ටමට වඩා සියයට 13 ක වැඩි වීමකි.

මූලාරම්භයේ සිටම සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් කොළඹ මධ්‍යගත කොට සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් එකතු කිරීම කරන ලදී. එහෙත්, 1997 අප්‍රේල් මස සිට සේවායෝජකයින්ගෙන් සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් එකතු කිරීම අරමුදලේ ගිණුම් විවෘත කර ඇති රාජ්‍ය බැංකු දෙකෙහි එනම්, ලංකා බැංකුව හා මහජන බැංකුව මගින් කරන ලදී. මෙම වැඩපිළිවෙල සකස් කළේ සේවායෝජකයන්ට ස්වකීය කැමැත්ත අනුව බැංකුවක් මාර්ගයෙන් දායක මුදල් සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට පහසුවනු පිණිසයි. කෙසේ වුවද, බැංකු ශාඛා මගින් දායක මුදල් රැස්කිරීමේ මෙම විමධ්‍යගත ක්‍රමය අරමුදලට අත්විඳීමට සිදුවූ පරිපාලනමය ගැටළු හේතුවෙන් 1998 ජුනි මාසයේ සිට නවතා දමන ලදී. ඉන්පසු 1997 ට පෙර ක්‍රියාත්මක වූ මධ්‍යගත ක්‍රමයම වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි වැඩිදියුණු කිරීම් ද සහිතව නැවත හඳුන්වා දෙන ලදී.

### සාමාජික ගිණුම්

1998 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය තුළ අදළ වර්ෂයට පොලිය එකතු කිරීමට පෙරාතුව මුළු සාමාජික ශේෂය දළ වශයෙන් රුපියල් බිලියන 156 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙය 1997 වර්ෂයේ මට්ටමට වඩා රුපියල් බිලියන 28 ක හෙවත් සියයට 21.8 කින් වැඩිවීමකි.

### ආයෝජන

සමාලෝචිත වර්ෂය තුළදී අරමුදලේ අතිරික්ත මුදල් රජයේ සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවල, මිල නියමිත පොදු සමාගම් කොටස්වල හා ප්‍රාදේශීය සංවර්ධන බැංකු කොටස්වල හා ප්‍රාදේශීය වැවිලි සමාගම්වල ආයෝජනය කරන ලදී. 1998 දෙසැම්බර් 31 දින වනවිට අරමුදල මගින් කළ මුළු ආයෝජන වටිනාකම රුපියල් බිලියන 162 ක් විය. මෙය 1997 වර්ෂය අවසානයේ තිබූ ආයෝජන මට්ටමට වඩා රුපියල් බිලියන 25 කින් හෝ සියයට 18.2 කින් වැඩිවීමකි.

### ආයෝජන වලින් ලැබූ ආදායම සහ බදු ගෙවීම්

සේවක අර්ථසාධක අරමුදලට දී තිබූ ආදායම් බදු නිදහස 1989 වර්ෂයේ සිට ඉවත් කිරීමක් සමග 1998 වර්ෂයේ අරමුදලෙහි ආයෝජන ආදායම් මත වූ ආදායම් බදු වගකීම් ප්‍රමාණය රුපියල් බිලියන 2 ක් විය.

1997 ආයෝජන වලින් ලත් ආදයම වන රුපියල් බිලියන 18.2 සමග සසඳ බලන කල 1998 ලත් ආදයම රුපියල් බිලියන 20 ක් විය.

### ප්‍රතිලාභ ගෙවීම්

1997 වර්ෂයේ ගෙවන ලද රුපියල් බිලියන 4.6 ක මුදල සමග සසඳ බලන කල 1998 වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදල සාමාජිකයන් වෙත සාමාජික ප්‍රතිලාභ වශයෙන් රුපියල් බිලියන 6.1 ක මුදලක් ගෙවන ලදී. මෙය කලින් වර්ෂය සමග සසඳ බැලීමේදී සියයට 32 ක වර්ධනයකි. 1997 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව 61,196 ක් සමග සසඳන කල්හි විමසුමට ලක්වන වර්ෂය තුළදී ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව 68,928 ක් විය. මෙම ප්‍රතිලාභ ගෙවීම් ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය යටතේ තවදුරටත් කරන ලදී.

### සේවක අර්ථසාධක අරමුදල් නිවාස ණය යෝජනා ක්‍රමය

විමසුමට ලක්වන වර්ෂය තුළදී ශේෂ සහතික කොට අදළ කම්කරු කාර්යාලය වෙත යවා ඇති මුළු අයදුම්පත් සංඛ්‍යාව 6,674 ක් විය

### අතිකුත් කටයුතු

1998 පෙබරවාරි මාසයේදී බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද 50 වෙනි නිදහස් ස්වර්ණ ජයන්ති ප්‍රදර්ශනයේදී අරමුදලේ ඉතිහාසයේ ප්‍රථමවරට එහි සාමාජිකයින්ට සිය ශේෂයන් අරමුදල වෙත නොපැමිණ පිටස්තර ස්ථානයක සිට ඒ මොහොතේදීම ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසන ලදී. ඉන්පසුව මෙම පහසුකම නාරාහේන්පිට පිහිටි කම්කරු මහලේකම් කාර්යාලයටත්, මහනුවර සහ කැගල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාල වලටත් සලසන ලදී.

තවද, සමාලෝචිත වර්ෂය තුළදී දිවයිනේ විවිධ ප්‍රදේශවල පවත්වන ලද ජනාධිපති ජංගම සේවා සඳහා අරමුදලේ සහභාගිත්වයක් තිබුණි. මෙම රැස්වීම් වලදී සාමාජිකයින්ට සිය ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සඳහා අවස්ථාවක් සැලසුනු අතර, ඒවාට පිළිතුරු සැපයීමට අරමුදලේ කාර්ය මණ්ඩලය කටයුතු කරන ලදී.

1998 වර්ෂය තුළදී අරමුදල විසින් ප්‍රථමවරට සාමාජික-යින් අතර අරමුදලේ සේවා කටයුතු පිළිබඳව දැනුවත් බව ඇති කිරීම උදෙසා අධ්‍යයන වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙවැනි වැඩසටහන් දෙකක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතුකරයේ සේවය කරන සාමාජිකයින් උදෙසා පැවැත්වීය.

## විනිමය පාලන

භාණ්ඩ ලභා වීමට පෙර ගෙවීම්, විකුණා මුදල් ගෙවන පදනම මත ගෙවීම් සහ තෑගි සහ වෙළෙඳ සාම්පල් ආනයනය වැනි කරුණු සම්බන්ධිත ආනයන ගෙවීම් ක්‍රම තවදුරටත් ලිහිල් කිරීම සඳහා 1977 අංක 1 දරන විශේෂ ආනයන බලපත්‍ර නියෝගවලට 1998 අප්‍රේල් මාසයේ දී කරන ලද සංශෝධන වලට සහ ශ්‍රී ලංකාව තුල රන් සහ මැණික් කර්මාන්තය වැඩි දියුණු කිරීමේ අරමුණින් රන් සහ අනෙකුත් වටිනා ලෝහ සහ මැණික් වෙළෙඳාම නිදහස් කිරීමට කරනු ලැබූ සංශෝධනවලට අමතරව විනිමය පාලන නීතිරීති ප්‍රධාන වෙනස්කම් කිසිවක් 1998 වර්ෂය තුල සිදු නොවීය. විනිමය පාලන දෙපාර්තමේන්තුව ප්‍රාග්ධන ගිණුම් සම්බන්ධ කටයුතු, ජංගම ජාත්‍යන්තර ගනුදෙනු පරීක්ෂා කිරීම, නැව්ගත කරන්නන් හට බලපත්‍ර නිකුත් කිරීම, විදේශ මුදල් මාරු කරන්නන්, හෝටල් හිමියන්, ස්වර්ණාභරණ වෙළඳසැල් හිමියන් සහ විදේශිකයින් සඳහා සපයනු ලබන සේවාවන් වෙනුවෙන් විදේශ ව්‍යවහාර මුදල් භාර ගැනීමට අවසරලත් පුද්ගලයින් වෙත නිකුත් කරන ලද බලපත්‍ර අළුත් කිරීම යනාදී කාර්යයන්හි තවදුරටත් නිරත වූ අතර ඊට අමතරව එම කාර්යයන් හා සම්බන්ධ කටයුතු අධීක්ෂණයෙහිද නිරත විය.

### විදේශ ආයෝජන

ශ්‍රී ලංකික සමාගම් විසින් විදේශ ආයෝජන සඳහා කරන ලද ඉල්ලීම් එකින් එක සලකා බලා අවසර ලබා දෙන ලදී. 1998 වර්ෂය තුලදී ඉන්දියාව, මාලදිවයින, පෝලන්තය, ඇමරිකා එක්සත් ජනපදය, නෙදර්ලන්තය සහ බංගලා දේශය වැනි රටවල එ.ජ. ඩොලර් දශලක්ෂ 13.3 ක් වූ විදේශ ආයෝජන 9 ක් සඳහා කරන ලද ඉල්ලීම් වෙනුවෙන් ගරු මුදල් අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව අවසර ලබා දෙන ලදී. මෙයට අමතරව, එක්සත් ජනපද ඩොලර් 500,000 ක් දකුණු ආසියානු කලාපීය අරමුදලෙහි ආයෝජනය කිරීමට ජාතික සංවර්ධන බැංකුවට අවසර ලබා දුනි.

### අපනයනකරුවන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ණය

විදේශීය ව්‍යවහාර මුදල් ඒකක වල පවත්වාගෙන යනු ලබන ගිණුම් පහසුකම් සඳහා ඉඩ ප්‍රස්ථා සැපයීම මගින් සෘජු සහ වක්‍ර අපනයනකරුවන්ට සපයනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ණය පහසුකම් තවදුරටත් පුළුල් කරන ලදී. ණය ලබාගැනීමේ අරමුණ හා ණය ආපසු ගෙවීමේ කාලය පිළිබඳව පැවැති සීමාවන් ලිහිල් කරන ලදී.

### විදේශ ණය

1998 වර්ෂය තුළ දී නේවාසික සමාගම් 5 ක් විසින් පිළිගත් ජාත්‍යන්තර මූල්‍ය ආයතන වලින් විදේශ ණය ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම් වලට අනුමැතිය ලබා දුනි.

### සංක්‍රමණය වීම මත ප්‍රාග්ධන සංක්‍රාමයන්

1998 වර්ෂය තුළදී වෙනත් රටවල වාසය සඳහා වීසා/ස්ථිර වාසික තත්ත්වයන් ලැබූ ශ්‍රී ලාංකික පුද්ගලයින් විසින් ප්‍රාග්ධන අරමුදලේ සංක්‍රාමයන් සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් 136 ක් වෙනුවෙන් අනුමැතිය ලබා දෙන ලදී. මෙයට අමතරව, නැසීගිය අයගේ බූදලයට අයත් අරමුදල් මුදා හැරීමට සහ එකතු වූ අරමුදල් ප්‍රේෂණය කිරීම සඳහා අනුමැතිය ලබා දුනි.

### ආනයන

1998.04.08 දිනැති අංක 1022/6 දරන රජයේ ගැසට් නිවේදනයට අනුව ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින්

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් යොමු කරන ලද ආනයන අයදුම්පත් නිශ්කාෂන සම්බන්ධ පහත සඳහන් කටයුතුවල නියැලුනි.

i. විදේශ විනිමය නොගෙවනු ලබන පදනම මත එක්සත් ජනපද ඩොලර් 1000 ඉක්මවන වටිනාකමක් සහිත භාණ්ඩ ආනයනය.

ii. විදේශීය ඉපැයීම් පදනම් කර ගෙන ආනයනය කරනු ලබන මෝටර් රථ.

iii. ස්කන්ධ ප්‍රාග්ධනය වෙනුවෙන් විදේශ සහභාගිත්වයෙන් ලැබුණු යන්ත්‍ර සහ උපකරණ.

iv. ව්‍යාපෘති හා සම්බන්ධිත භාණ්ඩ.

v. යුධ හමුදා විසින් කරන ලද ආනයන.

vi. ණයවර ලිපි සම්බන්ධයෙන් කරන ලද සංශෝධන.

vii. තීරුබදු රහිත සාප්පුවල විකිණීම සඳහා වාණිජ බැංකු විසින් විකුණා මුදල් ගෙවන පදනම මත රන් ආනයනය අනුමත කිරීම් හා සම්බන්ධ කටයුතු.

## අධීක්ෂණය

ජංගම ජාත්‍යන්තර ගනුදෙනු නිදහස් කිරීමත් සමග අවසර නොලත් කටයුතු වෙනුවෙන් විදේශ විනිමය භාවිත කිරීම හා සාවද්‍ය ලෙස විදේශ විනිමය මුදා හැරීම වැලැක්වීමේ අරමුණ පෙරදැරි කරගෙන විනිමය පාලන දෙපාර්තමේන්තුවේ මෙහෙයවීම් කටයුතු ශක්තිමත් කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ, එ.ජ. ඩොලර් 5000 ඉක්ම වූ විදේශ විනිමය මිලදී ගැනීම් සම්බන්ධ තොරතුරු දිනපතාත්, එ.ජ. ඩොලර් 5000 ට අඩු විදේශ විනිමය මිලදී ගැනීම් සම්බන්ධ තොරතුරු සති පතාත් සියළුම වාණිජ බැංකු විසින් ඉදිරිපත් කළ යුතු වේ.

1998.04.08 දිනැති අංක 1022/6 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව භාණ්ඩ ලඟාවීමට පෙර ගෙවීම් පදනම යටතේ ආනයනය කරන ලද භාණ්ඩ හා සේවා ශ්‍රී ලංකාවට ගෙන්වා ඇත්ද යන්න තහවුරු කරගනු පිණිස එවැනි පූර්ව ගෙවීම් සම්බන්ධ පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී. නාවික හා ගුවන් සේවා නියෝජිතයින් සහ ආසන්න වශයෙන් නියෝජිතයින් 100 ක් වෙනුවෙන් පෙනී සිටින භාණ්ඩ නැව්ගත කරන්නන් විසින් පවත්වා ගෙන යනු ලබන රුපියල් ජංගම ගිණුම්හි හර සහ බැර භාණ්ඩ ප්‍රකාශන ගනු, හර සටහන්, මෙරට ප්‍රේෂණ මෙමෝපත් ආදිය සමඟ සංසන්දනය කිරීම මගින් පරීක්ෂා කරන ලදී.

## විමර්ශන

ජංගම ජාත්‍යන්තර ගනුදෙනු වෙනුවෙන් විදේශ විනිමය නිදහස් කිරීම සම්බන්ධ ලියවිලි පරීක්ෂා කිරීමේ දී හඳුනා ගනු ලැබූ උල්ලංඝනය කිරීම් විමර්ශනය කිරීමට අමතරව, කොටස් හුවමාරුව, විකිණීම සහ මිලදී ගැනීම සම්බන්ධ විනිමය පාලන නීතිරීති උල්ලංඝනය කිරීම සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැතිව කරන ලද විදේශ ආයෝජන පරීක්ෂා කිරීම් ආදී විමර්ශන කටයුතු දෙපාර්තමේන්තුව විසින් කරන ලද අතර එවැනි උල්ලංඝනය කිරීම් සම්බන්ධව විනිමය පාලන පනතට අනුව අදාල නීතිමය පියවර ගන්නා ලදී. පරීක්ෂණ කිහිපයකට අදාල විමර්ශන කටයුතු දැනටමත් සිදුවෙමින් පවතී.

## රාජ්‍ය ණය

මුදල් නීති පනතේ 113 වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකාණ්ඩුවේ දේශීය රාජ්‍ය ණය නිකුත් කිරීම, කළමනාකරණය සහ දේශීය ණය සේවාකරණය සහ විදේශීය ණය සේවාකරණය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් මෙම කටයුතු කරනු ලැබේ. මෙලෙස පැවරී ඇති වගකීම් ඉටු කරනු වස් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රුපියල් ණය, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර යන දේශීය ණය උපකරණ නිකුත් කිරීම අඛණ්ඩව සිදු කරනු ලැබේ.

බදු සංචිත සහතිකපත්වලට අදළ සේවාකරණ ගෙවීම් සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ණයකර නිකුත් කිරීමට අදළ කටයුතු ද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

## සංවර්ධන කටයුතු

දේශීය ණය සුරැකුම්පත් වෙළෙඳපොළ තවදුරටත් දියුණු කිරීමේ අරමුණින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පියවර කිහිපයක් ගන්නා ලදී. එවැනි එක් සංවර්ධන ක්‍රියාමාර්ගයක්, ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය ශක්තිමත් කිරීම පිණිස ගනු ලැබූ පියවර හා සම්බන්ධ වේ. ණය සුරැකුම්පත් වෙළෙඳපොළේ ඇතිවන තත්කාලීන සංවර්ධනයන් පිළිබඳ තොරතුරු අඛණ්ඩ ලෙස හුවමාරු කර ගැනීම සඳහා ප්‍රාථමික අලෙවිකරුවන් සමග නිරන්තර රැස්වීම් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. මෙම රැස්වීම්වලදී රජයේ ණය සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනයට අදළ කාලීන වැදගත් කමකින් යුත් කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට හැකිවිය.

භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වැනි ණය උපකරණවලට අදළ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ වෙළෙඳපොළ කටයුතු පිළිබඳ තොරතුරු රැස්කිරීම සහ විශ්ලේෂණය කිරීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නිරතුරුව සිදු කරනු ලැබීය. මෙලෙස රැස් කරන ලද තොරතුරු රොයිටර්, ඉන්ටර්නෙට් ආදී විද්‍යුත් මාධ්‍යයන් මගින් ප්‍රකාශයට පත් කිරීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී. රජයේ ණය සුරැකුම්පත්හි ආයෝජනය පිළිබඳව මහජනතාවගේ අවබෝධය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව පුවත්පත්, රොයිටර් සේවය හා වෙනත් පරිගණක

ජාලයන් ඔස්සේ ප්‍රවෘත්ති නිවේදන මගින් වෙළෙඳපොළට නිරන්තරයෙන් තොරතුරු සංනිවේදනය කරන ලදී. ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් රැස්කළ තොරතුරු ඇතුලත් දත්ත පදනමක් පිහිටුවන ලද අතර සමස්ත වෙළෙඳපොළ සහ එක් එක් ප්‍රාථමික අලෙවිකරුගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ කාර්ය සාධනය ගණනය කිරීමට මෙම දත්ත භාවිතා කරනු ලැබීය. සමස්ත වෙළෙඳපොළ සමග සැසඳීමේදී තම තත්ත්වය ඇගයීමට හැකිවන පරිදි අදළ තොරතුරු සංක්ෂිප්ත ආකාරයෙන් එක් එක් ප්‍රාථමික අලෙවිකරුවන් සමග වෙන් වෙන් වශයෙන් සතිපතා පැවැත් වූ රැස්වීම්වලදී ඔවුන් වෙත නිවේදනය කරන ලදී. ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය පිළිබඳව සිදු කරන වාර්ෂික විශ්ලේෂණ සඳහා ද මෙම දත්ත පදනම භාවිතා කෙරිණි.

විමර්ශනයට භාජනය වූ වර්ෂය තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ණය උපකරණ හා සම්බන්ධ ප්‍රාථමික නිකුතු සහ ද්විතීයික වෙළෙඳපොළේ අලෙවි කටයුතු වැඩිදියුණු කිරීමට අදළ ක්‍රියාපටිපාටි සංවර්ධනය කිරීමේ නිරත විය. භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමට අවශ්‍ය වූ පරිගණක මෘදුකාංග රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් දියුණු කරන ලදී. මීට අමතරව රජයේ ණය සුරැකුම්පත් පිළිබඳව ප්‍රාථමික අලෙවිකරුවන්ගේ හා ආයතනික ආයෝජකයන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වන ලදී.

1997 ජුනි මස ස්ථාපනය කරන ලද ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමය රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ දියුණු කිරීමට අදළ විවිධ කරුණු පිළිබඳව කටයුතු කිරීමට අනුකමිටු කිහිපයක් පිහිටුවිය. යෝජිත විද්‍යුත් මාධ්‍ය ලංසු කිරීමේ ක්‍රමය සහ ලේඛන රහිත සුරැකුම්පත් ක්‍රමය, පරිසනකාශ්‍රිත තැරැව්කරුවකු පත්කිරීම, ප්‍රාථමික වෙළෙඳ කටයුතු සඳහා වෙනම නෛතික ආයතනයක් පිහිටුවීම, ප්‍රධාන පාලක ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම(Global Master Repurchases Agreement) සඳහා අතිරේක කොන්දේසි පැනවීම සහ ප්‍රතිමිලදී ගැනීම් සම්බන්ධයෙන් ප්‍රශස්ත භාවිතයන් ඇතුලත් සංග්‍රහයක් පිළියෙල කිරීම මෙම කටයුතු වලින් සමහරකි.

රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ ක්‍රියාකාරි කිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පියවර කීපයක් ගන්නා ලදී. 1998 ජුනි මාසයේදී පෙර හුරුවක් ලෙස හඳුන්වා දෙන ලද විද්‍යුත් මාධ්‍ය ලංසු ඉදිරිපත් කිරීමේ ක්‍රමය ද මෙයට ඇතුලත් වේ. මෙම ක්‍රමය දනට පවතින ලේඛන පදනම් කරගත් ලංසු ඉදිරිපත් කිරීමේ ක්‍රමය සමග සමාන්තරව ක්‍රියාත්මක විය.

ද්විතීය වෙළෙඳපොළ වර්ධනය වේගවත් කිරීම සඳහා විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් වෙළෙඳ කටයුතු ගැලපීමේ ක්‍රමයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා මහ බැංකුව සහ ප්‍රාථමික වෙළෙඳුන්ගේ සංගමය අවබෝධ කරගෙන තිබුණි. සුදුසු පරිගණකාශ්‍රිත තැරැව්කරුවකු තෝරා ගැනීම සඳහා ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් විසින් සාකච්ඡා මාලාවක් රොයිටර් සේවය, සසියා නෙට් සහ ලංකා ඔන් ලයින් සමග පවත්වන ලදී. සසියා නෙට් විසින් සංවර්ධනය කරන ලද ක්‍රමය පෙරහුරුවක් ලෙස ක්‍රියාත්මක විය.

1998/99 වර්ෂ වලදී පරිණත වී ගෙවා නිම කිරීමට තිබූ (1999 වර්ෂය තුළදී අනිවාර්යයෙන් සහ 1998 වර්ෂය තුළදී වෛකල්පික වශයෙන්) රුපියල් දශ ලක්ෂ 16,000 ක් වටිනා රුපියල් ණය 7 ක් 1998 වර්ෂය තුළදී ගෙවා නිදහස් කරන ලදී. සියයට 15 ක වාර්ෂික පොලී අනුපාතිකයක් සහිත රුපියල් දශ ලක්ෂ 6,000 ක මුළු වටිනාකමකින් යුක්ත වූ රුපියල් ණය 3 ක් සහ සියයට 16 ක වාර්ෂික පොලී අනුපාතිකයක් සහිත රුපියල් දශ ල,ක්ෂ 10,000 ක මුළු වටිනාකමකින් යුක්ත වූ රුපියල් ණය 4 ක් මෙයට ඇතුළත් විය. මීට අමතරව, සීමාසහිත එයාර් ලංකා සමාගමේ සියයට 26 ක කොටස් අයිතිය පැවරීමෙන් ලත් අරමුදල් පදනම් කරගෙන ශ්‍රී ලංකා මහ බැංකුව සතු වූ රුපියල් දශ ලක්ෂ 2,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් විශ්‍රාම ගන්වන ලදී. රජයේ සෘජු පොලී වියදම අවම කිරීම සඳහා, ඉහළ පොලී අනුපාතික යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් මේ සඳහා තෝරා ගනු ලැබීය.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණික උපදෙස් ලබා ගැනීම සඳහා විදේශ උපදේශකවරයකුගේ සහාය ලබා ගන්නා ලදී. ඔහු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්, ප්‍රාථමික අලෙවිකරුවන් සහ ආයතනික ආයෝජකයන් සඳහා පුහුණු සැසිවාර කීපයක් මෙහෙයවනු ලැබීය.

1998 සැප්තැම්බර් 04 වැනිද සිට බලපවත්වන පරිදි භාණ්ඩාගාර බිල්පත් සඳහා නව ආරක්ෂණ විධි කිහිපයක් හඳුන්වා දී ඇත. ඒවා අතර, විශේෂ දිය සළකුණක් සහිතව විශේෂයෙන් සපයන ලද ආරක්ෂිත කඩදසි භාවිතා කිරීම, පාරජම්බුල කිරණවලට පමණක් පෙනෙන පරිදි කඩදසි තුළ ආරක්ෂක කෙඳි භාවිතා කිරීම සහ පසුතල සැකැස්ම සහ පත්‍රිකා සීමාවන් ඉන්ටැග් ලියෝ ක්‍රමයට මුද්‍රණය කිරීම ඇතුලත් වේ. පහසුවෙන් හඳුනා ගැනීම සඳහා භාණ්ඩාගාර බිල්පත් වර්ණයන් තුනකින් මුද්‍රණය කර ඇත. උදා: මාස 3 බිල්පත් තැඹිලි පැහැයෙන්ද, මාස 6 බිල්පත් ලා කොළ පැහැයෙන්ද, මාස 12 බිල්පත් ලා නිල් පැහැයෙන් ද වේ.

## මෙහෙයුම් කටයුතු

නොපියවූ මුළු දළ රාජ්‍ය ණය ප්‍රමාණය 1998 වර්ෂය අවසන් වනවිට රුපියල් දශ ලක්ෂ 887,234 ක් වූ අතර 1997 වර්ෂය හා සසඳන විට රුපියල් දශ ලක්ෂ 146,249 ක් හෙවත් සියයට 19.7 ක වර්ධනයක් පෙන්නුම් කළේය. නොපියවූ මුළු දළ රාජ්‍ය ණය ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 419,500 (සියයට 47.3) ක් දේශීය ණය වූ අතර රුපියල් දශ ලක්ෂ 467,734 (සියයට 52.7) ක් විදේශ ණය විය. 1997 වසර හා සසඳ බලන කල 1998 වසරේදී නොපියවූ දේශීය ණය රුපියල් දශ ලක්ෂ 54,939 කින් හෙවත් සියයට 15.1 කින් සහ නොපියවූ විදේශ ණය

රුපියල් දශ ලක්ෂ 91,309 කින් හෙවත් සියයට 24.3 කින් ද වැඩිවීමක් පෙන්නුම් කළේය. දළ රාජ්‍ය ණය සංයුතිය II - 16 වැනි සංඛ්‍යා සටහනින් දක්වේ.

**II-16 සංඛ්‍යා සටහන**
**රාජ්‍ය ණය සංයුතිය**

| කාණ්ඩය | 1997 අවසානයට (රු.ද.ල.) | % | 1998 අවසානයට (රු.ද.ල.) | % |
|---|---|---|---|---|
| දේශීය ණය | 364,561 | 49.2 | 419,500 | 47.3 |
| භාණ්ඩාගාර බිල්පත් | 114,996 | | 119,996 | |
| රුපියල් සුරැකුම්පත් | 239,475 | | 250,570 | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 10,000 | | 48,915 | |
| භාණ්ඩාගාර තැන්පතු සහතික | 83 | | 12 | |
| බදු සංචිත සහතිකපත් | 7 | | 7 | |
| විදේශීය ණය | 376,425 | 50.8 | 467,734අ | 52.7 |
| එකතුව | 740,986 | 100.0 | 887,234 | 100.0 |

අ. තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## භාණ්ඩාගාර බිල්පත්

### ප්‍රාථමික වෙළෙඳපොළ

1997 අවසානයයේදී රුපියල් දශ ලක්ෂ 114,996 ක් වූ භාණ්ඩාගාර බිල්පත්වල නොපියවන ලද මුළු වගකීම් ප්‍රමාණය හා සැසඳීමේදී 1998 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 119,996 ක් විය. රුපියල් දශ ලක්ෂ 5,000 ක් වූ මෙම වැඩිවීම 1998 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 7,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් නව නිකුතුවේ සහ රුපියල් දශ ලක්ෂ 2,000 ක් වටිනා මහ බැංකුව සතුවූ භාණ්ඩාගාර බිල්පත් විශ්‍රාම ගැන්වීමේ ශුද්ධ ප්‍රතිඵලයකි. භාණ්ඩාගාර බිල්පත් සඳහා අනුදත් සීමාව රුපියල් දශ ලක්ෂ 125,000 ක් ලෙස 1998 වර්ෂය තුළදී නොවෙනස්ව පැවතුනි.

1998 මාර්තු මාසයේදී රුපියල් දශ ලක්ෂ 2,000 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් ගෙවා නිදහස් කිරීමට හැකිවුයේ සීමාසහිත එයාර් ලංකා සමාගමේ කොටස් වලින් සියයට 40 ක් පෞද්ගලීකරණය කිරීමෙන් ලත් ආදායමෙනි. මෙම විශ්‍රාම ගැන්වීම රුපියල් දශ ලක්ෂ 1,100 ක් 1998 වසර තුළදී ද රුපියල් දශ ලක්ෂ 900 ක් 1999 වසර තුළදී ද කල්පිරීමට නියමිත වූ භාණ්ඩාගාර බිල්පත් වලින් සමන්විත විය. භාණ්ඩාගාර බිල්පත් මෙසේ කලින් ගෙවා නිදහස් කිරීමෙන් ගෙවිය යුතුව තිබූ පොලිය රුපියල් දශ ලක්ෂ 114.4 ක් ඉතිරි කර ගැනීමට හැකි වූ අතර රුපියල් දශ ලක්ෂ 31.7 ක් 1998 වර්ෂයේදී ද රුපියල් දශ ලක්ෂ 82.7 ක් 1999 වර්ෂයේදී ද කල්පිරීමට නියමිතව තිබූ භාණ්ඩාගාර බිල්පත් සඳහා විය.

රාජ්‍ය ණය, බැංකු කටයුතු හා ආර්ථික පර්යේෂණ යන දෙපාර්තමේන්තු මගින් මෙහෙයවනු ලබන මූල්‍ය මෙහෙයුම් ඒකකය මගින් ප්‍රාථමික වෙළෙඳපොළට සතිපතා ඉදිරිපත් කරන බිල්පත් ප්‍රමාණය, එහි පරිණත රටාව සහ මහ බැංකුව වෙත භාණ්ඩාගාර බිල්පත් පූර්ව වෙන්කිරීම් පිළිබඳව තීරණ ගැනීම අඛණ්ඩව සිදු කරගෙන යන ලදී. ප්‍රාථමික වෙන්දේසිවලදී මහ බැංකුව විසින් මිලදී ගනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල පරිණත කාල ව්‍යුහය තීරණය කිරීම ද ඉහත ඒකකය මගින් සිදු විය.

1998 වර්ෂයේදී ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංඛ්‍යාව 18 ක් ලෙස නොවෙනස්ව පැවති අතර එය වාණිජ බැංකු 11 කින් හා වාණිජ බැංකු නොවන මූල්‍ය ආයතන 7 කින් සමන්විත විය. මුදල් හා ණය වෙළෙඳපොළ අගැයීම සහ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ කටයුතු හා සම්බන්ධ කරුණු සාකච්ඡා කිරීම සඳහා එක් එක් ප්‍රාථමික අලෙවිකරුවන් සමග වෙන් වෙන් වශයෙන් සතිපතා රැස්වීම් 1998 වර්ෂයේදී ද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නොකඩවා පවත්වන ලදී. මෙයට අමතරව තත්කාලීන කරුණු හා ඒවායේ ආර්ථික පසුබිම සම්බන්ධයෙන් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ හා මහ බැංකුවේ අදහස් හුවමාරු කර ගැනීමේ අරමුණින් සියළුම ප්‍රාථමික අලෙවිකරුවන් සමග දෙසතියකට වරක් රැස්වීම් පැවැත්වීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරිණි.

සතිපතා පැවැත්වෙන භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි වලට සහභාගිවීම ප්‍රාථමික අලෙවිකරුවන්ට හා මහ බැංකුව විසින් බලය පවරන ලද ආයතනික ආයෝජකයන්ට පමණක් සීමා විය. 1998 වර්ෂය තුළදී පිළිගන්නා ලද ලංසුවල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 230,683 ක් විය. මෙම වසරේදී භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළෙඳපොලේ පිළිගන්නා ලද මුළු ලංසු ප්‍රමාණයෙන් සියයට 59.9 ක් හෙවත් රුපියල් දශ ලක්ෂ 138,140 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් මිලදී ගත් වාණිජ බැංකු ප්‍රාථමික අලෙවිකරුවෝ ප්‍රධාන ගැනුම්කරුවෝ වූ අතර මුළු විකුණුම් වලින් සියයට 22.5 ක් මිලදී ගත් වාණිජ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවෝ දෙවැනි ප්‍රධාන ගැණුම්කරුවෝ වූහ. ඉතිරි සියයට 6.3 ක බිල්පත් මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන අරමුදල් මගින් මිලදී ගෙන ඇත. 1998 වර්ෂයේදී පිළිගන්නා ලද ලංසු මූලාශ්‍ර අනුව බෙදී ගිය ආකාරය II - 17 වැනි සංඛ්‍යා සටහනෙන් දක්වේ.

භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි සඳහා ලද රුපියල් දශ ලක්ෂ 294,487 ක් වූ මුළු ලංසු ප්‍රමාණයෙන් සියයට 69.2 ක් වාණිජ බැංකු ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ද, සියයට 25.8 ක් බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ද, සියයට 5.0 ක් ආයතනික ආයෝජකයින්ගෙන් ද විය.

1998 අවසානයේ පැවති නොපියවූ භාණ්ඩාගාර බිල්පත් වලින් රුපියල් දශ ලක්ෂ 58,134 ක් (සියයට 48) පරිණත කාලසීමාව මාස 12 බිල්පත් වූ අතර රුපියල් දශ ලක්ෂ 26,478 ක් (සියයට 22) පරිණත කාලසීමාව මාස 6 බිල්පත් විය. ඉතිරි සියයට 30 හෙවත් රුපියල් දශ ලක්ෂ 35,384 න් පරිණත කාලසීමාව මාස 3 බිල්පත් සියයට 17 ක් ද වෙනත් පරිණත කාලසීමා සහිත බිල්පත් සියයට 13 ක් ද විය. 1998 වර්ෂය තුළදී නිකුත් කරන ලද මුළු සහතිකපත් ප්‍රමාණය 74,480 ක් විය.

II -17 සංඛ්‍යා සටහන

**මූලාශ්‍රය අනුව භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවලදී පිළිගත් ලංසු - 1998**

රුපියල් දශලක්ෂ

| මූලාශ්‍රය | පරිණත කාලය (මාස) 3 | 6 | 12 | වෙනත් | එකතුව | % |
|---|---|---|---|---|---|---|
| 1. දේශීය වාණිජ බැංකු | 58,010 | 26,773 | 29,855 | - | 114,638 | 49.70 |
| රාජ්‍ය බැංකු | 43,382 | 23,964 | 23,129 | - | 90,475 | 39.2 |
| පෞද්ගලික බැංකු | 14,628 | 2,809 | 6,726 | - | 24,163 | 10.5 |
| 2. විදේශ බැංකු | 15,502 | 2,280 | 5,720 | - | 23,502 | 10.2 |
| 3. බැංකු නොවන (අ) | 17,616 | 13,358 | 20,907 | - | 51,881 | 22.5 |
| 4. ආයතනික ආයෝජකයන් (ආ) | 5,552 | 5,245 | 3,866 | - | 14,663 | 6.3 |
| 5. මහ බැංකු මිලදී ගැනීම් | - | - | - | 25,999 | 25,999 | 11.3 |
| එකතුව | 96,680 | 47,656 | 60,348 | 25,999 | 230,683 | 100.0 |

(අ) ජා.ඉ.බැං. ඇතුළත්ව
(ආ) මහ බැංකුව මගින් පාලනය වන අරමුදල්

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1998 වර්ෂය තුළදී පරිණත කාලය මාස 3, මාස 6 සහ මාස 12 භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලද අනුපාතිකයන් පිළිවෙලින් සියයට 9.97-12.65, 9.95-12.92 සහ 10.24-13.06 යන පරාසයන්හි උච්චාවචනය විය. පරිණත කාලසීමා අනුව භාණ්ඩාගාර බිල්පත්හි වාර්ෂිකරණය කරන ලද බර තැබූ සාමාන්‍ය ඵලද අනුපාතිකයන් II - 18 වැනි සංඛ්‍යා සටහනෙන් දක්වා ඇත. ඉකුත් වර්ෂය සඳහා වූ රුපියල් දශ ලක්ෂ 12,661 හා සසඳන විට මෙම වර්ෂය තුළ නිකුත් කළ භාණ්ඩාගාර බිල්පත් වෙනුවෙන් වූ මුළු පොලී බැඳීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 13,851 කි.

1998 දී භාණ්ඩාගාර බිල්පත් සඳහා ලද ලංසුවල අවම හා උපරිම බර තැබූ සාමාන්‍ය වාර්ෂික ඵලද අනුපාතික මාස 3 බිල්පත් සඳහා සියයට 9.84 ක් හා සියයට 12.72 ක් ද, මාස 6 බිල්පත් සඳහා සියයට 9.89 හා සියයට 12.98 ක් ද, මාස 12 බිල්පත් සඳහා සියයට 10.18 ක් හා 13.09 ක් ද විය.

II-18 සංඛ්‍යා සටහන

**වාර්ෂිකරණය කරණය කරන ලද**
**බර තැබූ සාමාන්‍ය ඵලද අනුපාතික**

වාර්ෂික ප්‍රතිශතය

| වර්ෂය | පරිණත කාලය (මාස) 3 | 6 | 12 | සමස්ත සාමාන්‍ය |
|---|---|---|---|---|
| 1994 | 14.32 | 14.75 | 15.90 | 14.89 |
| 1995 | 16.31 | 17.43 | 17.63 | 16.84 |
| 1996 | 16.04 | 16.46 | 17.17 | 16.46 |
| 1997 | 11.03 | 11.95 | 12.29 | 11.60 |
| 1998 | 11.77 | 12.13 | 12.20 | 11.98 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## ද්විතියික වෙළෙඳපොළ

භාණ්ඩාගාර බිල්පත් සඳහා ද්විතීයික වෙළෙඳපොළ කටයුතු 1998 වර්ෂයේදී සැලකියයුතු ප්‍රමාණයකින් වර්ධනය විය. ප්‍රාථමික අලෙවිකරුවන් අතර සහ ඔවුන් සහ ගණුදෙනුකරුවන් අතර අයිතිය පැවරීමේ ගණුදෙනු මෙන්ම ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රති විකුණුම්ද සැලකියයුතු ප්‍රමාණයකින් සිදු විය. 1998 වර්ෂය තුළ ප්‍රාථමික අලෙවිකරුවන් විසින් අයිතිය පැවරෙන පරිදි සිදුකරන ලද විකිණීම් හා මිලදී ගැනීම් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් බිලියන 144 ක් හා රුපියල් බිලියන 28 ක් වූ අතර ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රති විකුණුම් යටතේ සිදු කරන ලද ගනුදෙනු ප්‍රමාණය පිළිවෙලින් රුපියල් බිලියන 1,059 ක් හා රුපියල් බිලියන 643 ක් විය. 1998 අවසානයේදී ප්‍රාථමික අලෙවිකරුවන් සතුව තිබූ, භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් බිලියන 19 ක් විය.

## රුපියල් ණය

1998 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 52,300 ක් වටිනාකම ඇති රුපියල් ණය 15 ක් නිකුත් කරන ලදී. සේවක අර්ථසාධක අරමුදල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1998 වර්ෂයේදී ද රුපියල් ණය වෙනුවෙන් ප්‍රධාන දයකයෝ වූහ. මෙම ආයතනික ආයෝජකයන් දෙදෙනාගෙන් ලැබුණු මුළු දයකවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 48,200 ක් හෙවත් සියයට 92.2 ක් විය.

වර්ෂය තුළදී නිකුත් කළ රුපියල් ණය සඳහා වූ වාර්ෂික පොලී අනුපාතික සියයට 11.00 සිට සියයට 12.25 දක්වා පරාසයක වූ අතර පරිණත කාලසීමාව වර්ෂ 4/5 සිට 9/10 දක්වා පරාසයක විය. මෙයින් ණය 3 ක් වර්ෂ 5 ක ස්ථිර පරිණත කාලසීමාවක් සහිතව නිකුත් කළ ණය වූ අතර ඉතිරි ණය 12 වර්ෂ 4/5, 5/6, 6/7, 7/8 සහ 9/10

වශයෙන් වූ වෛකල්පික කාලසීමාවන් සහිතව නිකුත් කළ ඒවා විය. නිකුත් කරන ලද ණය පිළිබඳ තොරතුරු සංක්ෂිප්තව II - 19 සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

**II-19 සංඛ්‍යා සටහන**
**රුපියල් ණය නිකුත් කිරීම - 1998**

| වාර්ෂික පොලී අනුපාතිකය (සියයට) | පරිණත කාලය (වර්ෂ) | ණය සංඛ්‍යාව | නිකුත් කළ ප්‍රමාණය (රුපියල් දශලක්ෂ) |
|---|---|---|---|
| 11.00 | 5 | 3 | 10,000 |
| 11.50 | 4-5 | 1 | 5,500 |
| 12.00 | 5-6 | 1 | 6,000 |
| 11.25 | 6-7 | 5 | 16,800 |
| 12.25 | 7-8 | 4 | 12,500 |
| 11.50 | 9-10 | 1 | 1,500 |
| එකතුව | | 15 | 52,300 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1998 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 41,205 ක් වටිනා රුපියල් ණය 19 ක් ආපසු ගෙවන ලදී. ඒ අනුව, රුපියල් දශ ලක්ෂ 11,095 ක රුපියල් ණය සඳහා වූ ශුද්ධ දයකවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් නොපියවූ රුපියල් ණය වගකීම් ප්‍රමාණය 1997 අවසානයේ පැවති රුපියල් දශ ලක්ෂ 239,475 සිට 1998 අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 250,570 දක්වා වැඩිවිය. නොපියවූ රුපියල් ණය වගකීම්වල පරිණත කාල රටාව II - 20 සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

1998 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 33,086 ක් වූ රුපියල් ණය මත පොලී ගෙවීම් ප්‍රමාණය ඊට පෙර වර්ෂය සමග සසඳන විට රුපියල් දශ ලක්ෂ 3,065 ක (සියයට 10.2 ක) වැඩි වීමක් පෙන්නුම් කරයි.

## භාණ්ඩාගාර බැඳුම්කර

ශ්‍රී ලංකා මහ බැංකුව 1997 මාර්තු මාසයේ සිට ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර බැඳුම්කර ස්වරූපයෙන් අලෙවි කළහැකි, මැදි හා දිගුකාලීන, කූපන් සහිත රාජ්‍ය ණය උපකරණයක් නිකුත් කරන ලදී. මෙම භාණ්ඩාගාර බැඳුම්කර 1995 අංක 32 දරණ පනතින් සංශෝධිත ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත යටතේ නිකුත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1998 වර්ෂය තුළදී භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් වැදගත් ප්‍රතිපත්තිමය තීරණ කීපයක් ගන්නා ලදී. ඒ අනුව භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පවත්වනු ලබන ප්‍රාථමික වෙන්දේසිවලදී තීරණය වන බර තබන ලද සාමාන්‍ය මිල පදනම් කර ගනිමින්, තරඟකාරී නොවන අයුරින්, මහ බැංකුව මගින් කළමනාකරණය කරනු ලබන අරමුදල් වලින් ලැබෙන ලංසු භාර ගැනීමට ඉඩ දෙන ලදී. මීට අමතරව, බැංකු පනතේ 86 වන වගන්තිය යටතේ දක්වෙන පරිදි භාණ්ඩාගාර බැඳුම්කර ද්‍රවශීල වත්කමක් ලෙස පිළිගැනීමට තීරණය කෙරිණි.

**II-20 සංඛ්‍යා සටහන**
**1998 අවසානයේදී රුපියල් ණයවල පරිණත කාල රටාව**

| පරිණත කාලසීමාව වර්ෂය | වටිනාකම (රු.දශලක්ෂ) | ප්‍රතිශතය |
|---|---|---|
| 2 | 5,500.00 | 2.19 |
| 3 | 15,000.00 | 5.99 |
| 4 | 5,000.00 | 2.00 |
| 5 | 16,000.00 | 6.39 |
| 6 | 5,500.00 | 2.19 |
| 10 | 5,979.86 | 2.39 |
| 30 | 24,088.00 | 9.61 |
| 4-5 | 5,500.00 | 2.19 |
| 4-6 | 10,316.68 | 4.12 |
| 4-8 | 3,500.00 | 1.40 |
| 5-6 | 20,877.77 | 8.33 |
| 5-7 | 53,715.01 | 21.44 |
| 6-7 | 38.800.00 | 15.48 |
| 6-8 | 1,000.00 | .40 |
| 7-8 | 17,900.00 | 7.14 |
| 8-10 | 1,000.00 | .40 |
| 9-10 | 1,500.00 | .60 |
| 1-10 | 19,392.62 | 7.74 |
| එකතුව | 250,569.94 | 100 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

මීට අමතරව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 1998 දී භාණ්ඩාගාර බැඳුම්කර 'සමූහ' නිකුතු ආරම්භ කරනු ලැබිය. මෙම සමූහ නිකුතුවක්, පොදු කල්පිරෙන දිනයක්, කූපන් අනුපාතයක් සහ පොලී ගෙවීමේ උපලේඛනයකින් යුක්ත කේවල නිකුතුවක කොටසක් ලෙස සලකනු ලැබේ. වෙළෙඳපොළ ද්‍රවශීලතාවය මෙන්ම, ද්විතීයක භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළේ ගණුදෙනු පහසු කිරීමට හා වඩාත් ක්‍රියාකාරී කිරීමට මෙම ක්‍රමය ඉවහල් වනු ඇත.

1998 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 38,915 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරන ලදී. මෙම බැඳුම්කර පරිණත වීමේ කාලසීමාව අවුරුදු 2,3 සහ 4 වලින් යුක්ත විය. වර්ෂය තුළදී වෙන්දේසි 52 ක් පවත්වන ලද අතර, මෙම වෙන්දේසි වසර 2 කින් පරිණත වන නිකුතු 29 කින්ද, වසර 3 කින් පරිණත වන නිකුතු 14 කින්ද, වසර 4 කින් පරිණත වන නිකුතු 9 කින්ද සමන්විත විය. නිකුත් කරන ලද රුපියල් දශ ලක්ෂ 38,915 ක් වූ මුළු බැඳුම්කර වලින් රුපියල් දශ ලක්ෂ 25,065 ක් හෙවත් සියයට 64.4 ක් වසර 2 කින්ද, රුපියල් දශ ලක්ෂ 9,450 ක් හෙවත් සියයට 24.3 ක් වසර 3 කින්ද රුපියල් දශ ලක්ෂ 4,400 ක් හෙවත් සියයට 11.3 ක් වසර 4 කින් ද පරිණත වන ඒවා විය. පවත්වන ලද සෑම වෙන්දේසියකටම පෙර ශ්‍රී ලංකා මහ බැංකුව එම වෙන්දේසියෙන් නිකුත් කෙරෙන භාණ්ඩාගාර බැඳුම්කරවලට අදළ කූපන් අනුපාතික ප්‍රකාශයට පත් කරන ලදී. 1998 අවසානයේදී වසර 2,3 හා 4 කින් පරිණත වන භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන වාර්ෂික කූපන් අනුපාතික පිළිවෙලින් සියයට 11.00, 11.50 සහ 12.00 වශයෙන් විය.

1998 දී පවත්වනු ලැබූ සියළුම භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සඳහා අධි දයකත්වයක් ලැබුණු අතර, ලැබුණු මුළු ලංසු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 86,222 ක් විය. මෙම ලංසු වලින් රුපියල් දශ ලක්ෂ 2,025 ක් අධි මිලටද, රුපියල් දශ ලක්ෂ 125 ක් සම මිලටද, රුපියල් දශ ලක්ෂ 83,810 ක් අව මිලටද ලැබුණි. බර තබන ලද සාමාන්‍ය ඵලද අනුපාතිකය යටතේ ලංසු ඉදිරිපත් කිරීමට අවසර ලත් ආයතනික ආයෝජකයන්ගෙන් (ශ්‍රී ලංකා මහ බැංකුව මගින් කළමනාකරණය කරනු ලබන අරමුදල්) ලැබුණු ලංසු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 262 කි. භාණ්ඩාගාර බැඳුම්කරවල ප්‍රාථමික නිකුතු පිළිබඳ තොරතුරු II - 21 සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

1998 ඔක්තෝබර් මාසයේදී රුපියල් දශ ලක්ෂ 1,000 ක් වටිනා විශේෂ නිකුතු දෙකක් පැවති අතර, මෙම නිකුත් කිරීම් සිදු කරන ලද්දේ මහා භාණ්ඩාගාරය විසින් පවරා ගන්නා ලද මාර්ග ඉදිකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සීමාගම ලබාගත් ණය ක්‍රමවත් කිරීම සඳහාය. මෙම නිකුතු සියයට 11.00 ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ වසර දෙකකින් කල්පිරෙන ලෙස නිකුත් කරන ලද රුපියල් දශ ලක්ෂ 500 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර වලින්ද සියයට 11.50 ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ වසර 3 කින් පරිණත වන පරිදි නිකුත් කරන ලද රුපියල් දශ ලක්ෂ 500 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර වලින් ද සමන්විත විය.

බැඳුම්කර දරන්නන් විසින් ප්‍රාථමික අලෙවිකරුවන් මගින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද කූපන්පත් වලට අර්ධ වාර්ෂිකව පොලී ගෙවනු ලැබිණි. 1998 දී ගෙවන ලද මුළු පොලී ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,101 ක් විය.

වර්ෂය තුළදී නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර සහතිකපත් ප්‍රමාණය 5,304 ක් වූ අතර ඉන් 3,728 ක් වසර 2 කින් ද, 1,167 ක් වසර 3 කින් ද, 409 ක් වසර 4 කින් ද, පරිණත වන ඒවා විය. අර්ධ වාර්ෂික පොලී ගෙවීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත ලැබුණු කූපන්පත් ප්‍රමාණය 7,906 කි.

1998 දී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ ද්විතීයික වෙළෙඳපොළ දියුණු කිරීම සඳහා පියවර කිහිපයක් ගන්නා ලදී. ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන් විසින් භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් ද්විතීය වෙළෙඳපොළේ කරන ලද මිලදී ගැනීමේ සහ විකිණීමේ මිල ගණන් ප්‍රකාශ කිරීම අවශ්‍ය වූ අතර, එම මිල ගණන් මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කරවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරිණි. ප්‍රාථමික අලෙවිකරුවන් විසින් ප්‍රකාශ කරන ලද ගැණුම් සහ විකුණුම් මිල ගණන් පදනම් කර ගනිමින්, ප්‍රසිද්ධ කිරීමේ අරමුණින්, බර තබන ලද සාමාන්‍ය මිල ගණන් සහ පොලී අනුපාතික ගණනය කරන ලදී. 1998 ජූලි සහ සැප්තැම්බර් මාස වලදී භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් ආයෝජකයන්ගේ සහ සාමාන්‍ය මහජනතාවගේ දැනුම වැඩි කිරීමේ අදහසින් රජයේ සුරැකුම්පත් සඳහා සම්මන්ත්‍රණ කිහිපයක් පවත්වන ලදී.

II-21 සංඛ්‍යා සටහන

**භාණ්ඩාගාර බැඳුම්කරවල තෝරාගත් තොරතුරු - 1998**

| කාණ්ඩය | | | කල්පිරීමේ කාලසීමාව (අවුරුදු) | ලැබුණු ලංසු ප්‍රමාණය (රු.ද.ල.) | පිළිගත් ලංසු ප්‍රමාණය (රු.ද.ල.) | බර තබන ලද සාමාන්‍ය ඵලද අනුපාතිකය (වර්ෂයකට සියයට) | කූපන් අනුපාතිකය (වර්ෂයකට සියයට) |
|---|---|---|---|---|---|---|---|
| 11.00% | 2000 | අ | 2 | 4,142 | 2000 | 10.81-10.87 | 11.00 |
| 11.00% | 2000 | ආ | 2 | 2,260 | 1,815 | 11.33-12.07 | 11.00 |
| 11.00% | 2000 | ඇ | 2 | 4,495 | 2,000 | 11.94-11.98 | 11.00 |
| 11.00% | 2000 | ඈ | 2 | 2,560 | 2,000 | 11.95-12.23 | 11.00 |
| 11.50% | 2001 | ඈ | 3 | 3,120 | 2,250 | 12.44-12.59 | 11.00 |
| 11.00% | 2000 | ඉ | 2 | 7,483 | 3,000 | 12.63-12.82 | 11.50 |
| 11.00% | 2000 | ඊ | 2 | 5,430 | 2,250 | 12.79-12.83 | 11.00 |
| 11.50% | 2001 | ඈ | 3 | 5,885 | 2,500 | 13.01-13.90 | 11.00 |
| 12.00% | 2002 | අ | 4 | 4,490 | 2,000 | 12.93-13.94 | 11.50 |
| 11.00% | 2000 | උ | 2 | 4,357 | 3,000 | 13.07-13.34 | 12.00 |
| 11.00% | 2000 | ඌ | 2 | 7,269 | 3,500 | 13.76-13.94 | 11.00 |
| 11.00% | 2000 | ඒ | 2 | 5,312 | 2,500 | 13.92-13.94 | 11.00 |
| 11.00% | 2000 | ඔ | 2 | 6,917 | 2,000 | 13.56-13.93 | 11.00 |
| 11.50% | 2001 | ඉ | 3 | 6,594 | 3,500 | 13.91-13.93 | 11.00 |
| 12.00% | 2002 | ආ | 4 | 5,395 | 2,400 | 13.83-13.94 | 11.50 |
| 11.50% | 2001 | ඊ | 3 | 4,051 | 1,200 | 13.09-13.81 | 12.00 |
| 11.00% | 2000 | ඔ | 2 | 6,462 | 1,000 | 12.99-13.50 | 11.50 |
| | | | | | | | 11.00 |
| එකතුව | | | | 86,222 | 38,915 | | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

වසර තුළදී සැලකියයුතු වටිනාකම් වලින් යුක්ත වූ අයිතිය පැවරීමේ මිල දී ගැනීම් හා විකිණීම් කටයුතු වලද, ප්‍රතිමිලදී ගැනීමේ ගණුදෙනු වලද යෙදීම මගින් ප්‍රාථමික අලෙවිකරුවන් භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ ද්විතීයික වෙළඳ කටයුතුවල නියුක්ත වූහ. 1997 අවසානයේදී ප්‍රාථමික වෙළෙඳුන් සතුව පැවති භාණ්ඩාගාර බැඳුම්කරවල වටිනාකම වූ රුපියල් දශ ලක්ෂ 4,023 ක් හෙවත් නොපියවන ලද භාණ්ඩාගාර බැඳුම්කර වලින් සියයට 40 සමග සසඳන විට 1998 අවසානයේදී මෙම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 21,474 ක් හෙවත් නොපියවන ලද මුළු භාණ්ඩාගාර බැඳුම්කර වලින් සියයට 44 ක් විය.

## භාණ්ඩාගාර තැන්පතු සහතික

1998 වර්ෂය තුළදී භාණ්ඩාගාර තැන්පතු සහතිකපත් නිකුත් කිරීමක් සිදු නොවිණි. වර්ෂය තුළදී ආපසු ගෙවන ලද භාණ්ඩාගාර තැන්පතු සහතිකවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 70.3 ක් වූ අතර එයින් රුපියල් දශ ලක්ෂ 59.5 ක් මුල් මුදල් ආපසු ගෙවීම සඳහා ද රුපියල් දශ ලක්ෂ 10.8 ක් පොලී ගෙවීම සඳහා ද යොදා ගැනිණි. 1998 වර්ෂය අවසානයේදී නොපියවා පැවති භාණ්ඩාගාර තැන්පතු සහතිකවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 12.4 ක් විය.

## අනෙකුත් දේශීය ණය උපකරණ

1998 වර්ෂය තුළදී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය යන ආයතනවල ණයකර සඳහා නිකුත් කිරීම් හෝ ආපසු ගෙවීම් සිදු නොවුණි. වර්ෂය අවසානයේදී මෙම බැඳුම්කරවල නොපියවූ ශේෂයන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 500, රුපියල් දශ ලක්ෂ 109 සහ රුපියල් දශ ලක්ෂ 83 බැගින් විය.

බදු සංචිත සහතිකපත්වල ආපසු ගෙවීමක් හෝ පොලී ගෙවීමක් සිදු නොවූ අතර මෙම සහතිකපත්වල නොපියවූ ශේෂය 1998 වසර අවසානයේදී රුපියල් දශ ලක්ෂ 7 ක් ලෙස නොවෙනස්ව පැවතිණි.

## විදේශීය ණය

1998 අවසානයේදී නොපියවූ මුළු විදේශීය රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 467,734 ක් වූ අතර 1997 අවසානය හා සසඳන කල එය රුපියල් දශ ලක්ෂ 91,309 (සියයට 24.3) ක වර්ධනයක් පෙන්වීය. වසර අවසානයේදී නොපියවූ මුළු ණයෙන් ද්විපාර්ශවීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 234,284 (සියයට 50) ක් වූ අතර බහු පාර්ශවීය ණය සහ වාණිජමය ණය ප්‍රමාණයන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 211,715 (සියයට 45) ක් සහ රුපියල් දශ ලක්ෂ 21,735 (සියයට 5) ක් විය. ප්‍රධාන ද්විපාර්ශවීය ණය හිමියන් වූයේ ජපානය, ඇමෙරිකා එක්සත් ජනපදය හා ජර්මනියයි. මුළු ද්විපාර්ශවීය ණය ප්‍රමාණයෙන් මෙකී මූලාශ්‍රයන්ගේ දයකත්වය රුපියල් දශ ලක්ෂ 214,483 ක් හෙවත් සියයට 92 ක් විය. බහුපාර්ශවීය අංශයේ විශාලතම ණය හිමියා වූ ජාත්‍යන්තර සංවර්ධන සංගමය, මුළු බහුපාර්ශවීය ණය ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 111,711 කට හෙවත් සියයට 53 කට හිමිකම් පෑවේය.

ණය මුදල් උපයෝජනය අනුව වර්ග කිරීමේදී ව්‍යාපෘති ණය, වැඩසටහන් ණය සහ භාණ්ඩ ණය රජයේ මුළු විදේශ ණය ප්‍රමාණයෙන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 357,078 (සියයට 76) ක්, රුපියල් දශ ලක්ෂ 45,698 (සියයට 10) ක් සහ රුපියල් දශ ලක්ෂ 30,661 (සියයට 7) ක් විය. ණය දෙන්නන් අනුව සහ ණය මුදල් උපයෝජනය කරන ලද ආකාරය අනුව 1998 අවසානයේදී රජයේ විදේශීය ණය සංයුතිය II - 22 සංඛ්‍යා සටහනෙහි දක්වේ.

**II-22 සංඛ්‍යා සටහන**
**1998 අවසානයේදී නොපියවූ දළ විදේශීය ණය**

| වර්ගය | රුපියල් දශලක්ෂ | % |
|---|---|---|
| 1 ණය දෙන්නන් අනුව | 467,734 | 100 |
| ද්විපාර්ශවීය | 234,284 | 50 |
| බහුපාර්ශවීය | 211,715 | 45 |
| වාණිජමය | 21,735 | 5 |
| 2 ණය මුදල් උපයෝජනය අනුව | 467,734 | 100 |
| මුදල් | 5,052 | 1 |
| භාණ්ඩ | 30,661 | 7 |
| ආහාර | 29,079 | 6 |
| වැඩසටහන් | 45,698 | 10 |
| ව්‍යාපෘති | 357,078 | 76 |
| තාක්ෂණික ආධාර | 166 | - |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1998 වසර තුළදී විදේශීය රාජ්‍ය ණය මුල් මුදල් ආපසු ගෙවීම් හා පොලී සහ අනෙකුත් ගාස්තු පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 11,601 ක් සහ රුපියල් දශ ලක්ෂ 7,513 ක් විය. වසරේ බෙදා හරින ලද සමස්ත ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 37,725 ක් විය.

1998 දී නව විදේශ ණය 21 ක් ගිවිසුම්ගත කරන ලද අතර වසර අවසානයේදී ක්‍රියාත්මක වූ මුළු ණය සංඛ්‍යාව 476 ක් දක්වා වර්ධනය විය. මෙම ණය අවුරුදු 1 සිට 17 දක්වා වූ සහන කාලයකින් යුක්ත වූ අතර ආපසු ගෙවීමේ කාලය අවුරුදු 0 සිට 42 දක්වා විය. වාර්ෂික පොලී අනුපාතිකය සියයට 0 සිට සියයට 10.85 දක්වා විය. ණය තුළ අන්තර්ගත ප්‍රදාන ප්‍රතිශතය සියයට 2 සිට 91 දක්වා වූ පරාසයක විය. ණය දෙන්නන් අනුව 1998 අවසානයේදී රජයේ විදේශීය ණය සහන කාල, පරිණත කාල, පොලී අනුපාතික සහ ප්‍රදාන ප්‍රතිශතය පිළිබඳ පරාසයන් II - 23 සංඛ්‍යා සටහනෙහි දක්වේ.

**II-23 සංඛ්‍යා සටහන**
**විදේශ ණය, පිළිබඳ සංඛ්‍යා සම්පිණ්ඩනය**

| වර්ගය | පරිණත කාලය (අවුරුදු) | | පොලී අනුපාතිකය/ සේවා ගාස්තු (% වාර්ෂික) | ප්‍රදාන ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| | සහන කාලය | ආපසු ගෙවීම් කාලය | | |
| ද්වි පාර්ශවීය | 1- 17 | 5 - 42 | 0.00 - 7.39 | 4 - 91 |
| බහු පාර්ශවීය | 5 - 11 | 6 - 40 | 0.75 - 8.25 | 2 - 87 |
| වාණිජමය | 1 - 10 | 0 - 20 | 5.95 - 10.85 | 2 - 61 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

### මහ බැංකු සුරැකුම්පත්

රාජ්‍ය ණය නිකුත් කිරීම හා සේවාකරණයට අමතරව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම හා සේවාකරණය කිරීමට අදාළ කටයුතු ද සිදුකරන ලදී. 1998 පෙබරවාරි 27 වැනි දින මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම නැවත ආරම්භ කරන ලද අතර පූර්ව නිගමනය මත තීරණය නොකරන ලද ප්‍රමාණයක් ප්‍රාථමික වෙළඳ නියෝජිතයන්ගේ සහ වාණිජ බැංකුවල දයකවීම් සඳහා වර්ෂය අවසානය තෙක් විවෘතව පැවතිණ.

සෑම මහ බැංකු සුරැකුම්පත් නිකුතුවක් සඳහාම පරිණත කාලය දින 7 ක් විය. සුරැකුම්පත් සඳහා උපයෝගී කරගන්නා ලද පොලී අනුපාතිකය, මහ බැංකු ප්‍රතිමිලදී ගැනීම් සඳහා පාවිච්චි කරන ලද වාර්ෂිකරණය කළ දෛනික පොලී අනුපාතිකයට සමාන විය. ඒ අනුව පොලිය වාර්ෂිකව සියයට 11.93-12.06 වූ පරාසයක පැවතුණි. 1998 වසර තුළදී නිකුත් කරන ලද මුළු මහ බැංකු සුරැකුම්පත් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 40 වසර තුළදී සම්පූර්ණයෙන්ම ආපසු ගෙවන ලද බැවින් 1998 දෙසැම්බර් අවසානයේදී නොපියවූ සුරැකුම්පත් ශේෂයක් නොවීය. 1998 වර්ෂය සඳහා මුළු පොලී වියදම රුපියල් දශ ලක්ෂ 0.092 ක් විය.

## ලේකම් දෙපාර්තමේන්තුව

ලේකම් දෙපාර්තමේන්තුව මගින් මහ බැංකුවෙහි මුදල්, නෛතික සේවා, සැපයුම්, ගමනාගමන සහ අනෙකුත් සේවා යන ක්ෂේත්‍රයන්හි සියළු පරිපාලන සේවාවන් ලබා දීම නොකඩවා ක්‍රියාත්මක කෙරිණි.

1998 වර්ෂය තුළ, වියදම මත දැඩි පාලනයක් සහතික කිරීම පිණිස සවිස්තරාත්මක සමූහ සැලැස්ම නමැති රාමුව තුළ විධිමත් අයවැය ක්‍රමයක් හඳුන්වා දුන් අතර එමගින් වියදම් ප්‍රතිඵලදායීව සහ කාර්යක්ෂමතාව වර්ධනය වන අයුරින් හැසිරවීම අරමුණු කෙරිණි.

මේ අරමුණ සඳහා, සවිස්තරාත්මක වියදම් සැලැස්ම යටතේ දෙපාර්තමේන්තුව විසින් කරන ලද යෝජනාවන් සහ යෝජනා ක්‍රම තිරසාර මුදුන් පමුණුවා ගැනීමේ පරමාර්ථය තුළ පවතීද යන්න හඳුනා ගැනීම සඳහා විධිමත් පරිශීලනයක් කරන ලදී. ආදයම් සහ වියදම් (ප්‍රාග්ධන සහ පරිපාලන යන දෙඅංශයම) ඇතුළත් මහ බැංකුවේ අයවැය ලේඛනය පිළියෙල කරන ලදී. අයවැයෙන් පරිබාහිර වූ (ප්‍රාග්ධන සහ පරිපාලන දෙඅංශයම) වැය සඳහා වූ අයදුම් නිරීක්ෂණය කරන ලද අතර, ඒ සඳහා පරිපූරක අනුමැතියක් ලබා ගන්නා ලදී. වඩාත් නම්‍ය වූ අයවැය ලේඛනයක් පිළියෙල කිරීම පිණිස අයවැය නිරීක්ෂණ කමිටු අවස්ථාවෙහිදී පෙර වසරෙහි අයවැය හා සම්බන්ධ ඵලදායීතාවයන් නිරීක්ෂණය කරන ලද අතර සංශෝධිත අයවැය සංඛ්‍යා අදාළ අයවැයට ඇතුළත් කෙරිණි.

1998 මුළු පරිපාලන වියදම් රුපියල් දශ ලක්ෂ 2,372 ක් වූ අතර මෙයට නෝට්ටු සහ කාසි නිකුතුව සඳහා වූ වැය සහ අනෙකුත් පරිපාලන වියදම් සඳහා වූ රුපියල් දශ ලක්ෂ 1,618 ක්ද අඩංගු විය. මෙම වියදමින්, සියයට 74.8 ක් හෝ රුපියල් මිලියන 1,211 ක් වේතන, දීමනා, අතිකාල ගෙවීම් සහ වෛද්‍ය ප්‍රතිලාභ යනාදිය අතුළත් කාර්ය මණ්ඩල සඳහා කල වියදම් වූ අතර පරිපාලන වියදම් සහ ආයතනික වියදම් පිළිවෙලින් සියයට 12.8 ක් සහ 12.4 ක් විය.

මහ බැංකුවේ සමස්ථ කාර්ය මණ්ඩලය 1998 අවසානයේදී 2,102 ක් වූ අතර, ඉන් 511 ක් මාණ්ඩලික නිලධාරීන් විය. වසර තුළදී මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගිය වූවන්ගේ සංඛ්‍යාව 69 ක් විය.

1998 දී පරිපාලන වියදම් තුළ වූ සමහර අයිතමයන් සඳහා සැළකිය යුතු ඉහළ යාමක් සිදු විය. සමහර බැංකු නිලධාරීන් රේණුකා ගොඩනැගිල්ලෙහි සහ ශාලිමා ගොඩනැගිල්ලෙහි අළුතින් පදිංචි කරවීමට සිදු වීමෙන් ඒවාහි බදු සහ කුලීද, විදුලිය වැනි අනෙකුත් ද සඳහාද වැය වර්ධනය වුණි.

1998 දෙවැනි භාගය තුළදී බැංකුවට අයත් පැරණි සහ දීර්ඝ කරන ලද නව ගොඩනැගිල්ල ත්‍රස්තවාදී ආවරණ සඳහා රක්ෂණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් රක්ෂණ වාරික පිරිවැය වැඩි විය.

ප්‍රාග්ධන පිරිවැය 1997 දී වූ රුපියල් දශ ලක්ෂ 938 හා සසඳන විට 1998 දී එය රුපියල් දශ ලක්ෂ 2,766 ක් විය. මෙම පිරිවැයෙන් වැඩිම ප්‍රමාණයක් වූ රුපියල් දශ ලක්ෂ 2,626 ක්ම ජනාධිපති මාවතේ පිහිටි පැරණි ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ නව මහ බැංකු ගොඩනැගිල්ලෙහි ඉදි කිරීම් සඳහා විය. නව ගොඩනැගිල්ල සඳහා වැය කල මුදල රුපියල් දශ ලක්ෂ 2,287 ක් සහ පැරණි ගොඩනැගිල්ල සඳහා වැය කල මුදල රුපියල් දශ ලක්ෂ 337 ක් ද විය. මෝටර් රථ සහ ඡායා පිටපත් මැෂින්, ඩිජිටෙල් කොපි මැෂින් සහ කැල්කියුලේටර් වැනි උපකරණ වර්ෂය තුළදී මිලදී ගන්නා ලදී. මහ බැංකුවේ වාහන සංඛ්‍යාව වැඩි කිරීම සඳහා ආසන්න වශයෙන් පිරිවැය රුපියල් දශ ලක්ෂ 56 ක් වූ නව වාහන 22 ක් 1998 වර්ෂය තුළදී මිලදී ගැණුනි. ජර්මන් ආධාර යටතේ මිලදී ගන්නා ලද පරිඝණක යන්ත්‍ර 125, එක් එක් දෙපාර්තමේන්තුවෙන් කරන ලද ඉල්ලීම පදනම් කරගෙන ඔවුන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳ අධ්‍යනයකින් පසු බෙදා දෙන ලදී. බැංකුවේ ඉතා

වැදගත් වූ අවශ්‍යතාවයන් සඳහා හැරුණුකොට නව ලී බඩු මිලදී ගැනීම, බැංකුවට අයත් ගොඩනැගිලි ඉදි කිරීම සම්පූර්ණ කර නිලධාරීන් නැවත ස්ථානගත කිරීමේ අවශ්‍යතාවය මත ප්‍රමාද කරන ලදී.

මහ බැංකුවෙහි නීතිපතා සිදු කෙරෙන නෛතික කටයුතු සඳහා යොමු වීමට අමතරව, නෛතික අංශය බලපත්‍රලාභී බැංකු පාලනය සහ ඒවායෙහි කටයුතු සොයා බැලීම හා සම්බන්ධ විධිවිධානයන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා 1998 අංක 30 දරන බැංකු පනතට කෙටුම්පත් සංශෝධනයන් සකස් කිරීමෙහි නිරත විය. එමෙන්ම නෛතික අංශය මඟින් තවදුරටත් ලියාපදිංචි කොටස්, සුරැකුම්පත් සහ භාණ්ඩාගාර බිල්පත් විධිවිධාන පනත යටතේ ප්‍රාථමික ගණුදෙනුකරුවන් සඳහා වූ රෙගුලාසි සම්බන්ධ කෙටුම්පත් රෙගුලාසි සකස් කරන ලදී.

## ප්‍රවෘත්ති හා ප්‍රකාශන

මහ බැංකුව වෙනුවෙන් තොරතුරු රැස්කර තබා ගන්නා සහ ඒවා විවිධ මාධ්‍යයන් මඟින් මහ ජනතාව වෙත බෙදා හරින්නා ලෙස පසුගිය වසරෙහි ද දෙපාර්තමේන්තුව අඛණ්ඩව සිය කටයුතු කරගෙන යන ලදී.

බැංකුව තුළ තොරතුරු බෙද හරින්නා ලෙස කටයුතු කරමින් දෙපාර්තමේන්තුව වසර තුළ අභ්‍යන්තර ප්‍රවෘත්ති ප්‍රකාශන 18 ක් පළ කරන ලදී. එමෙන්ම පුස්තකාලය සිය පළපුරුදු කාර්ය මණ්ඩලයේ සහායෙන් වරණීය විඥපන පරිවපන (Selective Dissemination of Information) පද්ධතිය; වාර ප්‍රකාශන සහ සඟරා සංසරණය සහ අන්තර් පුස්තකාල පිරුළුම වැනි පාඨක සේවාවන් තුළින් බැංකු කාර්ය මණ්ඩලය සඳහා වූ පුස්තකාල පහසුකම් හා සේවාවන් වඩාත් ඉහළ මට්ටමකට නංවා ඇත. ඒ අතරම පුස්තකාලයේ පවතින සම්පත් පිළිබඳ දැනුවත් කිරීම සඳහා පොත් සහ CD ROMs පරිග්‍රහණ ලැයිස්තු සංසරණය කිරීමද, වාර ප්‍රකාශනවල පටුන පිටු සේවය, රටවල් පිළිබඳ අධ්‍යයන මාලාව, ප්‍රවර්තන තාක්ෂණික සාහිත්‍යය සහ අළුතින්ම සාකච්ඡාවන්ට බඳුන් වන මාතෘකාවන් පිළිබඳ තොරතුරු එක් කිරීමද සිදු කරන ලදී. දැනට පොත් 8,590 ක්ද, වාර ප්‍රකාශන 354 ක්ද, වාර්තා 4,870 ක සහ CD ROMs 104 කට වැඩි එකතුවක් ද පුස්තකාලය සතුව පවතී. එමෙන්ම ශ්‍රී ලංකා ප්‍රකාශනවල එකතුවද 2,000 ක් පමණ විය. මෙම සියළුම ප්‍රකාශනයන්හි නාමාවලින් පරිගණකගත කොට ඇත.

බාහිර ලෝකය වෙත තොරතුරු බෙද හරින්නකු ලෙස දෙපාර්තමේන්තුව විසින් දෛනික විනිමය අනුපාතික ආර්ථික දර්ශක, පාරිභෝගික මිල දර්ශක, භාණ්ඩාගාර බිල්පත්, බැඳුම්කර හා රුපියල් ණය පිළිබඳ තොරතුරු මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන් වෙත නිකුත් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. 1998 පසු භාගයෙහි ලෝක ආර්ථිකයේ ස්වභාවය, කාර්තුමය ජාතික ආදයම් ඇස්තමේන්තු නිකුත් කිරීම, ශ්‍රී ලංකාව සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි iv වන වගන්තිය යටතේ උපදෙස් සහ මෑත කාලීන ආර්ථික සංවර්ධනය යන මාතෘකා යටතේ ප්‍රවෘත්ති සාකච්ඡා 4 ක් පවත්වන්නට යෙදුනි. වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා ආර්ථිකය, ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත, මාසික විවරණිකා, මාණ්ඩලික පත්‍රිකා 23 වැනි වෙළුම, ආර්ථික හා සමාජ දත්ත යන ප්‍රකාශනයන්ද, දෙපාර්තමේන්තුවේම මාසික හා ද්විමාසික ප්‍රකාශනයන් වන සටහන හා නිව්ස් සර්වේ ද මහජනතාව වෙත නිකුත් කරන ලදී. ශිෂ්‍ය ජනගහනය තුළ වඩාත් ජනප්‍රිය සඟරාවක් බවට පත්ව ඇති සටහන සඟරාව 1998 වසරෙහි පිටපත් 180,000 ක අලෙවියක් වාර්තා කරයි. මෙම සඟරාව සඳහා වන ඉල්ලුමෙහි ඉහළ යාම හේතුවෙන් මාසිකව මුද්‍රණය කරන පිටපත් සංඛ්‍යාව 10,000 - 25,000 දක්වා ඉහළ ගොස් ඇත. එහෙත් මේ හා සැසඳීමේදී ඉංග්‍රීසි කියවන පාඨකයින්ගේ සීමිත බව නිසා නිව්ස් සර්වේ සඟරාවෙහි 1998 වසරෙහි අලෙවිය පිටපත් 3,500 කට සීමා විය. එහෙත් එය පසුගිය වසර හා සාපේක්ෂව ගත් විට සතුටුදායක මට්ටමක විය.

1996 බෝම්බ පිපිරීමෙන් පසුව නව මුහුණුවරකින් යුතුව ආරම්භ කරන ලද පාසල් සිසුන් සඳහා වන අධ්‍යාපන සම්මන්ත්‍රණ, 1998 වසරෙහි ද අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. වසර පුරා එවැනි සම්මන්ත්‍රණ 5 ක් පවත්වන ලද අතර, එයින් වැඩමුළු 3 ක් අ.පො.ස. (උ.පෙ.) සිසුන් සඳහාද, එකක් ගුරු භවතුන් සඳහාද, අනෙක පොලිස් පරීක්ෂකවරුන් සඳහාද වේ. අධ්‍යාපන ප්‍රකාශන මාලාවෙහි පළමුවැන්න ආර්ථිකයක් හඳුනා ගනිමු ප්‍රකාශනය ද 1998 වසරෙහි දෙපාර්තමේන්තුව විසින් පළ කරන ලදී. එමෙන්ම නිදහස් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය 1948-1998 ප්‍රකාශනයෙහි සිංහල සහ දෙමළ පිටපත්, 1997 වාර්ෂික වාර්තාව සහ සමාජ ආර්ථික දත්ත ප්‍රකාශනයන් අ.පො.ස.(උ.පෙ.) වාණිජ සහ කලා විෂය ධාරාවන් සහිත පාසල් වෙත නොමිලයේ යවන ලදී.

ශ්‍රී ලංකාවට නිදහස ලැබීමේ ස්වර්ණ ජයන්තිය සමරමින් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි පෙබරවාරි 5-25 දක්වා පවත්වන්නට යෙදුනු ස්වර්ණ ජයන්ති ප්‍රදර්ශනයට දෙපාර්තමේන්තුව ක්‍රියාශීලීව සහභාගී විය. ශ්‍රී ලංකා මහ බැංකුව හා සම්බන්ධ වූ මෙහි කටයුතු සියල්ල දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ලදී. මෙහිදී බැංකු ප්‍රකාශනයන් විශේෂයෙන්ම නිදහස් සමරුව වෙනුවෙන් බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද නිදහස් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය 1948-1998, අවලෝකිතේශ්වර බිත්ති ඵලකය හා ජාතික කොඩිය සහිත ටයි පටි රඳවනය අලෙවිය සඳහා තබා තිබුණි.

මහජන බැංකුවේ 37 වෙනි සංවත්සරය සමරමින් 1998 ජූලි 01-05 දක්වා පැවැත්වූ ජන නිපැයුම් කාර්මික හා වෙළෙඳ ප්‍රදර්ශනයට ද දෙපාර්තමේන්තුව සහභාගී වූ අතර එහිදී ද බැංකුවේ ප්‍රකාශන අලෙවි කවුළුවක් පවත්වමින් පාඨකයින් සමූහයක් හඳුනා ගන්නා ලදී.

ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව වෙනුවෙන් ඉසුරු වාර්තා චිත්‍රපටයේ දෙවැන්න කාන්තා ශක්තිය පිළිබඳව ඉසුරු මාගම නමින් නිෂ්පාදනය කරන ලදී. මෙම වාර්තා චිත්‍රපටය සඳහා ඇඹිලිපිටිය, දෙනියාය, මාතර හා මහනුවර ආදී

අගනුවරින් බැහැර ප්‍රදේශවලදී රූ ගත කිරීම් සිදු කරන ලදී.

බැංකුවේ කටයුතු හා අදළ ඡායාරූප මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන්ට ලබා දීමද දෙපාර්තමේන්තුවේ ඡායාරූප සේවය මහින් අඛණ්ඩව සිදු කරන ලදී. 1999 ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලිය සමරු කාසිය නිර්මාණය කිරීමද, ප්‍රාදේශීය සංවර්ධන බැංකු 04 ක් සඳහා එනම්, වයඹ, රජරට, සබරගමුව සහ ඌව සඳහා නිල ලාංඡන සැළසුම් කිරීම හා නිර්මාණය කිරීමද දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. බැංකු ත්‍යාග දවටුම් කඩදාසි නිර්මාණය කිරීම, සටහන හා තෝරා ගත් ආර්ථික දත්ත ප්‍රකාශනයන් සඳහා පොත් කවර නිර්මාණය කිරීම බැංකුවේ නව ගොඩනැගිල්ල විවෘත කිරීම පිළිබඳව ආරාධනා පත් සැළසුම් කිරීම සහ බැංකුවෙහි නොයෙකුත් දැන්වීම් නිර්මාණය කිරීමද දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

SEACEN සාමාජිකයකු ලෙස බැංකු තොරතුරු SEACEN ත්‍රෛමාසිකය වෙත සැපයීමෙන්ද, අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල ඉල්ලීම පරිදි අදල තොරතුරු යාවත්කාලීන කිරීමේ කටයුතු හරහාද දෙපාර්තමේන්තුව ජාත්‍යන්තරව තොරතුරු සැපයීමේ ක්‍රියාකාරකම්වල තවදුරටත් නියැලිනි.

බැංකුවෙහි මුද්‍රණ අවශ්‍යතා සපුරාලමින් මුද්‍රණාලය විසින් වසර තුළ පැවරුම් 260 ක් නිම කරන ලදී. වාර්ෂික වාර්තාව, විවරණිකා, සමාජ ආර්ථික දත්ත, සටහන හා නිව්ස් සර්වේ සහරා හැරුණුවිට නිදහස් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය 1948-1998 ප්‍රකාශනයද, මුදල් අමාත්‍යංශය වෙනුවෙන් බජට් ඇට් අ ග්ලාන්ස්, බජට් ස්පීච්, සික්ස් ඉයර්ස් ඩිවලොප්මන්ට් ප්‍රෝග්‍රෑම් ප්‍රකාශනයන් මුද්‍රණය කිරීමද මුද්‍රණාලය මහින් කරන ලදී. ඊට අමතරව 1999 වසර සඳහා සුබපැතුම්පත් මුද්‍රණය හා සාක්කු දින පොත් මුද්‍රණය ද සිදු කෙරින.

## පර්යේෂණ කටයුතු

ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේදී, අධිපතිතුමාට සහ මුදල් මණ්ඩලයට මග පෙන්වීම සහ මහජනයාට තොරතුරු සැපයීම අරභයා, පර්යේෂණ කටයුතුවලට අවශ්‍ය වන අදළ ආර්ථික හා මූල්‍යමය තොරතුරු රැස්කිරීමේ හා විශ්ලේෂණය කිරීමේ කටයුතුවල ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව අඛණ්ඩව නිරත විය. දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) වෙත දත්ත සැපයීම අඛණ්ඩව කරගෙන යනු ලැබූ අතර, 1998 මැයි මාසයේදී රජය සහ ජා.මූ.අ. අතර වූ සාකච්ඡා සම්බන්ධීකරණයටද දායක විය. වෙනත් ජාත්‍යන්තර සංවිධානවලට දත්ත සැපයීම මෙන්ම එබඳු ආයතන සමඟ වැඩකටයුතු සම්බන්ධීකරණයද දෙපාර්ථමේන්තු විසින් අඛණ්ඩව සිදු කරන ලදී. මහජනතාව සඳහා මුද්‍රිත මාධ්‍ය උපයෝගී කරගෙන සතිපතා මූල්‍ය තොරතුරු සැපයීම අඛණ්ඩව සිදු කළ අතර, ප්‍රතිපත්ති සම්පාදනය කරන්නන් හට තොරතුරු සැපයීම සඳහා තෝරාගත් මාසික ආර්ථික දත්ත සකස් කිරීමද අඛණ්ඩව සිදු කරන ලදී. පෙර පරිදිම වාර්ෂික වාර්තාව සහ මූල්‍ය නීති පනතේ 116 වන වගන්තිය ප්‍රකාර අයවැය පිළියෙල කිරීමේදී භාවිතා කිරීම සඳහා , සැප්තැම්බර් 15 වාර්තාව, සැකසීමේ කටයුතුවලද දෙපාර්තමේන්තුව නියැලුනි. එමෙන්ම පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් 1998 දී, ශ්‍රී ලංකා ආර්ථිකය- 1998 , වාර්තාව සහ මාසික විවරණයද ප්‍රකාශයට පත් කරන ලදී. ශ්‍රී ලංකා ආර්ථිකය-1998 වාර්තාව සාමාන්‍ය අර්ධ වාර්ෂික වාර්තාව තවදුරටත් පුළුල් කිරීමක් වූ අතර, එමගින් ප්‍රක්ෂේපණයන්ද ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකාවේ පනස් වසරක නිදහස සැමරීම නිමිත්තෙන් දෙපාර්තමේන්තුව විසින් 1998 පෙබරවාරි මාසයේදී , නිදහස් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය, නමින් ප්‍රකාශනයක් ප්‍රකාශයට පත් කරන ලදී. මාණ්ඩලික පත්‍රිකා, වෙළුම් අංක 23 හි කලාප අංක 1 සහ 2 ද 1998 මැයි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී. රජය විසින් ගිවිස ගන්නා ලද විවිධ විදේශ ණය, මූල්‍ය ප්‍රතිපත්තිය කෙරෙහි ඇති වන බලපෑම් සම්බන්ධ උපදෙස් දෙමින් මුදල් මණ්ඩල පත්‍රිකා ගණනාවක් මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබූ අතර අදල මුදල් මණ්ඩල තීරණ මුදල් අමාත්‍යාංශය වෙත දැනුම් දෙන ලදී.

මූල්‍ය සමස්තයන්, ගෙවුම් ශේෂ දත්ත, ජාත්‍යන්තර වෙළෙඳ භාණ්ඩවල මිල ගණන් සහ මාසික විදේශීය වෙළෙඳ දත්ත යනාදිය දෙපාර්තමේන්තුව විසින් රැස් කරන ලදී. එමෙන්ම විදේශ වෙළෙඳපොළවල තේ සහ රබර් වෙන්දේසි පිළිබඳ සංඛ්‍යා සහ මාසික වාර්තාද මුදල් මණ්ඩලයේ දැන ගැනීම සඳහාත්, අමාත්‍යවරුන්, වෙනත් ආයතන සහ සංවිධානවල ඉල්ලීම මත විවිධ ආර්ථික විෂයයන් පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ අඩංගු වාර්තා සැකසීමද අඛණ්ඩව සිදු කරන ලදී. කාර්මික නිෂ්පාදන සමීක්ෂණ (අර්ධ වාර්ෂික හා වාර්ෂික), සුළු පරිමාණ කර්මාන්ත, මහ කොළඹ නිවාස අනුමත කිරීම්, නිවාස හා දේපොල සංවර්ධනය හා මූල්‍යනය, භාණ්ඩ හා සේවා බදු හා රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්කවල කුඩා රබර් හිමියන් පිළිබඳ සමීක්ෂණය යන සමීක්ෂණයන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් 1998 වසර තුළදී පවත්වන ලදී. මහ කොළඹ ප්‍රදේශයේ නිවාස ඉදිකිරීමේ ප්‍රවනතාවය හඳුනා ගැනීම සඳහා, මහ කොළඹ නිවාස අනුමත කිරීමේ දර්ශකය, නමින් නව දර්ශකයක් සකස් කරන ලදී. නව වෙළෙඳ දර්ශකයන් ගණනය කිරීමේ කටයුතුද මේ වසර තුළදී ආරම්භ කරන ලදී.

1998 මාර්තු මාසයේදී පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින්, ක්‍රි.ව. 2000 න් පසු දකුණු ආසියාව : තිරසාර වර්ධනය සඳහා ප්‍රතිපත්ති හා , නිදහස් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය හා ක්‍රියාකාරිත්වය : 1948-1998, යටතේ සවිස්තරාත්මක සම්මන්ත්‍රණ දෙකක් පවත්වන ලදී. මෙයින් පළමු සම්මන්ත්‍රණය ලෝක බැංකුවේ ආර්ථික සංවර්ධන

ආයතනයේ අනුග්‍රහයෙන් පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. ඊට අමතරව ලෝක බැංකුවේ ආර්ථික සංවර්ධන ආයතනයේ අරමුදල් උපයෝගී කොටගෙන 1998 මැයි මාසයේදී, "සාර්ව ආර්ථික කළමනාකරණය සහ ප්‍රතිපත්ති විශ්ලේෂණය" නමින් වැඩ මුළුවක්ද පවත්වන ලදී. අභ්‍යන්තර හා අන්තර්ජාතික වෙළෙඳම පිළිබඳ අමාත්‍යාංශයේ වාණිජ දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන්, ලෝක වෙළෙඳ සංවිධානයේ ගිවිසුම් හා ක්‍රමවේදය, පිළිබඳ සම්මන්ත්‍රණයක්ද දෙපාර්තමේන්තුව විසින් 1998 මැයි මාසයේදී පවත්වන ලදී. විදේශයන්හි පශ්චාත් උපාධි අධ්‍යාපනයෙන් පසු ආපසු පැමිණි නිලධාරීන් විසින් පවත්වන්නට යෙදුනු සම්මන්ත්‍රණ කිහිපයක්ද දෙපාර්තමේන්තුව විසින් මෙහෙය වනු ලැබිණ. එමෙන්ම නිලධාරීහු මෙරට සහ විදේශයන්හි පැවැති සම්මන්ත්‍රණ වලදී ආර්ථික කරුණු පිළිබඳ පත්‍රිකාද ඉදිරිපත් කළහ.

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ස්ව කැමැත්තෙන් මෙන්ම අනෙකුත් ආයතනවල ඉල්ලීම මත පර්යේෂණ අධ්‍යයන ගණනාවක් කරන ලදී. එම අධ්‍යයනයන් බොහෝ දුරට ප්‍රතිපත්ති අභිමුඛ මෙන්ම අධ්‍යයන අරමුණු සඳහා වූ ඒවා විය. මේ අධ්‍යයනයන් සාර්ව හා සූක්ෂම ආර්ථික විද්‍යා විශ්ලේෂණ මෙන්ම ප්‍රතිපත්ති තීරණ යන විෂය ක්ෂේත්‍රයන්ගෙන් ආවරණය වූ අතර, මේවායින් සමහරක් 1998 මහ බැංකු මාණ්ඩලික පත්‍රිකා ප්‍රකාශනයේ කලාපයේ ප්‍රකාශයට පත් කරන ලදී. භාණ්ඩ හා සේවා බද්ද පිළිබඳ සමීක්ෂණ වාර්තාව සහ මහ කොළඹ ප්‍රදේශයේ වාණිජ හා නේවාසික ගොඩනැගිලි වල උපයෝජනය පිළිබඳ වාර්තාවද සපයන මාණ්ඩලික පත්‍රිකා වශයෙන් මුදල් මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබීය. නැගෙනහිර ආසියානු රටවල මහ බැංකු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ පර්යේෂණ ව්‍යාපෘතිවල පර්යේෂකයන් ලෙස දෙපාර්තමේන්තු නිලධාරීන් අඛණ්ඩ ලෙස සේවය කරනු ලැබීය., සුරැකුම්කරණය සහ වාණිජ බැංකු ව්‍යාපාරික කටයුතු වලට එය කරනු ලබන බලපෑම, යන මැයෙන් යුත් එවැනි ඒකාබද්ධ පර්යේෂණ අධ්‍යයනයක් වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී.

වර්ෂය තුළදී දෙපාර්තමේන්තු නිලධාරීහු මුදල් මෙහෙයුම් ඒකකය, භාණ්ඩාගාර බිල්පත් ටෙන්ඩර් කමිටුව, විනිමය අනුපාත කමිටුව, මූල්‍ය අංශයේ මෙහෙයුම් කමිටුව, තීරුබදු කමිටුව, මූල්‍ය හා ආයෝජනය පිළිබඳ ඉන්දු-ලංකා ඒකාබද්ධ උප කමිටුව, දකුනු ආසියානු කලාපීය සහයෝගීතා සංවිධානයේ (සාර්ක්) සහ බංගලාදේශය, ඉන්දියාව, මියැන්මාරය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය ඇතුලත් ආර්ථික සහයෝගිතා සංවිධානය (BIMSTEC) වැනි කලාපීය කමිටුවල කටයුතුවලද නිරත විය. ,දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංවිධානයේ මහ බැංකු අධිපතිවරුන් හා මුදල් අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ අන්තර් ජාලය, වැඩ කටයුතු සම්බන්ධීකරණය පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් ඒකකයක්ද පිහිටුවන ලදී.

## සංඛ්‍යාත සහ ක්ෂේත්‍ර සමීක්ෂණ

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් (අ) ජාතික ගිණුම්, මිල හා වැටුප් ඇතුළත් සාර්ව ආර්ථික හා සමාජ දත්ත සහ (ආ) කුටුම්භ හා ආයතනික අංශ පිළිබඳ මූලික දත්ත එක් රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ කටයුතු මෙම වසරෙහිද නොකඩවා කරගෙන යන ලදී.

1996/97 පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණයේ දත්ත සහ විශ්ලේෂණ ඇතුළත් වාර්තාවේ වැඩ කටයුතු නිම කිරීම, කාර්තුමය ජාතික ආදයම් ඇස්තමේන්තු සැකසීම හා පළ කිරීම, කොළඹ දිස්ත්‍රික්කය හා තවත් තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයක් සඳහා වූ නව පාරිභෝගික මිල දර්ශක ගණනය කිරීම දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද ප්‍රධාන කාර්ය භාරයන් විය. මීට අමතරව ප්‍රාදේශීය නිෂ්පාදන දර්ශකයන් ප්‍රකාශයට පත් කිරීමේ අරමුණින් ප්‍රාදේශීය මට්ටමේ දත්ත එකතු කරන වැඩපිළිවෙලක් ද ආරම්භ කෙරුණ අතර, ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානයන්හි ආහාර ද්‍රව්‍යවල තොග සහ සිල්ලර මිල ගණන් දත්ත ප්‍රකාශයට පත් කිරීමද අඛණ්ඩව සිදු විය.

### පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණය - 1996/97

පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණයෙහි (1996/97) ගවේෂණයන් ඇතුළත් වාර්තාවෙහි වැඩ කටයුතු වර්ෂය තුළදී අවසන් කෙරිණි. සමීක්ෂණයේ සොයා ගැනීම් කාණ්ඩ දෙකකින් ප්‍රකාශයට පත් කෙරෙනු ඇත. පළමුවන කාණ්ඩයට සමීක්ෂණයේ දත්ත පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් ඇතුළත් වන අතර, දෙවන කාණ්ඩය සමීක්ෂණයේ දත්ත ඇතුළත් වගු වලින් සමන්විත වනු ඇත. දනට මුද්‍රණය වෙමින් පවතින මෙම වාර්තාව, 1999 අප්‍රේල් මාසයේදී ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. මෙම වාර්තාව ප්‍රකාශයට පත් වීමත් සමඟම අවුරුදු පනහකට ආසන්න කාලයක් ආවරණය කෙරෙන සමාජ ආර්ථික තොරතුරු වලින් පොහොසත් දත්ත පදනමක් සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව සමත් වනු ඇත.

පෙර සමීක්ෂණයන්හිදී පරිද්දෙන්ම මෙම සමීක්ෂණයද ප්‍රජා විද්‍යාත්මක තොරතුරු, අධ්‍යාපනය, නිවාස තත්ත්වය, සෞඛ්‍යය, ශ්‍රම බලකාය, ආදයම, වියදම, පරිභෝජනය, ඉතිරි කිරීම්, ආයෝජනය සහ ණය ගැනීම් ආදී තොරතුරු ඇතුළත් පුළුල් සමාජ ආර්ථික දත්ත රාශියක් සපයයි. සමාජ ආර්ථික දත්ත නාගරික, ග්‍රාමීය හා වතු වශයෙන් ආංශිකව සහ භූගෝලීය කලාපීය වශයෙන් ඉදිරිපත් කිරීමට අමතරව, මෙවර වාර්තාවේ නව අංගයක් වන්නේ එම දත්ත පළාත් මට්ටමින් ද රැස් කර වගුගත කර තිබීමයි. මෙලෙස පළාත් මට්ටමේ දත්ත ලබා දීම මඟින් ප්‍රාදේශීය දත්ත පදනම ශක්තිමත් කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම දත්ත ප්‍රාදේශීය ආණ්ඩුවලට සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන් සංවර්ධනය සඳහා වන ප්‍රාදේශීය සැළසුම්කරණ කටයුතුවලදී මහත් සේ උපකාරී වනු ඇත.

මෙම සමීක්ෂණයට සම්බන්ධ (අ) දත්ත පරිගණක ගත කිරීමට සහ පරීක්ෂා කිරීමට අවශ්‍ය මෘදුකාංග සංවර්ධනය කිරීම (ආ) දත්ත පරිගණකගත කිරීම (ඇ) දත්තවල නිරවද්‍යතාවය සහ අඛණ්ඩතාවය පරීක්ෂා කිරීම (ඈ) දත්ත සැකසුම් කටයුතු සඳහා අවශ්‍ය මෘදුකාංග සංවර්ධනය කිරීම (ඉ) දත්ත සැකසුම් කටයුතු සහ දත්ත වගුගත කිරීම (Tabulation) ආදී සමීක්ෂණයට සම්බන්ධ සියළුම දත්ත සැකසීමේ කටයුතු පළමු වරට සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් කරන ලදී.

ගෘහස්ථ අංශයේ ක්ෂුද්‍ර මට්ටමේ තොරතුරු නොපමාව ලබා දීමෙහි අරමුණ ඇතිව, සමීක්ෂණයේ දත්ත සැකසීමේ කටයුතු එක් එක් වටය බැගින් ගෙන සම්පූර්ණ කළ අතර, එමගින් සමීක්ෂණයේ මූලික සොයා ගැනීම් ඉතා ඉක්මණින් ප්‍රකාශයට පත් කළහැකි විය. මෙම ප්‍රතිඵල ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 1997, ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත - 1998 සහ නිදහස් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය යන ප්‍රකාශනවල පළ කරන ලදී. පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණයේ (1996/97) වැදගත් ගවේෂණයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ පැවති ප්‍රසිද්ධ සම්මන්ත්‍රණයකදී ඉදිරිපත් කිරීමට යෙදුණි. මෙම සමීක්ෂණ දත්ත 1998 ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙන්ද ලබාගත හැකිය.

මෙම සමීක්ෂණයෙන් ලබා ගත් සංඛ්‍යානමය තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි ජාතික ගිණුම් දත්ත පදනම ශක්තිමත් කිරීමටද, කොළඹ දිස්ත්‍රික්ක පාරිභෝගික මිල දර්ශකය හා අනෙකුත් ප්‍රාදේශීය මිල දර්ශක ගණනය කිරීමටද උපයෝගී කර ගන්නා ලදී.

## දිස්ත්‍රික් පාරිභෝගික මිල දර්ශක ගණනය කිරීම

දැනට ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරනු ලබන මිල දර්ශකයන්ට අතිරේක වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නව පාරිභෝගික මිල දර්ශකයක් හඳුන්වා දෙන ලදී. කොළඹ දිස්ත්‍රික් පාරිභෝගික මිල දර්ශකය නම් වූ මෙම මිල දර්ශකය 1998 දී ප්‍රකාශයට පත් කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව මෙහෙය වූ පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණයෙන් (1996/97) ලබා ගන්නා ලද වියදම් රටාවන් මෙම නව මිල දර්ශකයේ භාණ්ඩ බර තැබීම් සඳහා උපයෝගී කර ගන්නා ලදී. දර්ශකයෙහි බර තැබීම් ගණනය කිරීම සඳහා භාවිතා කරන ලද ඉලක්කගත ජනගහණය, ආදායම අනුව පෙළ ගස්වන ලද කොළඹ දිස්ත්‍රික්කයෙහි කුටුම්භවල පහලම සියයට 40 න් සමන්විත වේ. මිල දර්ශකයේ පදනම් කාලය වන්නේ 1996 ඔක්තෝබර් සිට 1997 සැප්තැම්බර් දක්වා කාලයයි. දර්ශකය සඳහා අවශ්‍ය මිල දත්ත කොළඹ දිස්ත්‍රික්කයෙන් තෝරා ගත් වෙළෙඳපොළවල් කිහිපයකින් ලබා ගන්නා ලදී. මෙම දර්ශකය ගණනය කිරීම සඳහා අවශ්‍ය දත්ත දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙලෙහි අදාල දත්ත සමීක්ෂකයන් මගින් ආරම්භක අවස්ථාවේදී කොළඹ දිස්ත්‍රික්කයෙහි මධ්‍යස්ථාන පහකින් එනම් හංවැල්ල, හෝමාගම, . මොරටුව, අවිස්සාවේල්ල සහ පිටකොටුවේ වෙළෙඳපොළ වලින් ලබා ගන්නා ලදී. අනතුරුව 1999 ජනවාරි මාසයේ සිට කොළඹ දිස්ත්‍රික්කයේ තවත් උප නාගරික සහ අර්ධ ග්‍රාමීය මධ්‍යස්ථාන හයක් එකතු කර ගනිමින් මෙම දර්ශකයට ඇතුළත් මධ්‍යස්ථාන සංඛ්‍යාව පුළුල් කෙරෙන අතර, එම යෝජිත මධ්‍යස්ථාන අතරට කොළොන්නාව, නුගේගොඩ, දෙහිවල, පිළියන්දල, මහරගම සහ පාදුක්ක අයත් වෙයි. මෙම මධ්‍යස්ථානවල මිල ගණන් එකතු කිරීම සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කරනු ලැබේ.

## දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 1978 වසරෙහි දී ආරම්භ කරන ලද දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල එහි 20 වැනි වසරෙහි කටයුතු සපුරන ලදී. මෙම වැඩපිළිවෙල යටතේ පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිල ගණන්, කෘෂිකාර්මික භාණ්ඩවල නිෂ්පාදන මිල ගණන් සහ අසංවිධිත අංශයේ වැටුප් තොරතුරු රැස් කිරීමේ කටයුතු අඛණ්ඩව කරගෙන යනු ලැබීය. මීට අමතරව මෙම වැඩපිළිවෙල මගින් ප්‍රධාන නිෂ්පාදිත ප්‍රදේශයන්හි කෘෂිකාර්මික කටයුතුවල ක්‍රියාකාරීත්වයද පරීක්ෂාවට ලක් කෙරිණි. මේ යටතේ දත්ත සමීක්ෂකයන් ලෙස පාසැල් ගුරුවරුන් යොදා ගනිමින් දීප ව්‍යාප්ත පුළුල් ජාලයක් මගින් දත්ත රැස් කිරීම කරනු ලැබේ. වී, තේ, රබර් හා පොල් වගාව සහ සුළු පරිමාණ ගොඩනැගිලි තැනීම් යන උප අංශ මෙම වැඩපිළිවෙල යටතේ ආවරණය වේ. මෙසේ එකතු කරනු ලබන දත්ත පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය මගින් නිතිපතා ප්‍රකාශයට පත් කරනු ලැබේ. දත්ත විමර්ශකයන් විසින් එකතු කරනු ලබන දත්තවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමටත්, මෙම දත්ත ප්‍රාදේශීය පාරිභෝගික මිල දර්ශක ගණනය සඳහා යොදා ගැනීමේ අරමුණ පැහැදිලි කිරීම සඳහාත් විමර්ශකයන් සඳහා 1998 වර්ෂයේදී සම්මන්ත්‍රණ මාලාවක් අනුරාධපුර, මහනුවර සහ මාතර දී පැවැත්වූ අතර දත්ත රැස් කිරීම පිළිබඳ පුහුණුවක් ලබා දීමද එම සම්මන්ත්‍රණ වලින් සිදු විය.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව පිටකොටුවේ තොග වෙළෙඳපොළෙන් දෛනිකව තොග මිල ගණන් එකතු කිරීමෙන් හා අනෙකුත් මධ්‍යස්ථාන වලින්ද එම තොරතුරු රැස් කිරීමෙන් මෙම වැඩසටහනෙහි තවදුරටත් නියැලී සිටී. 1998 වසරෙහි දී පිටකොටුව වෙළෙඳපොළෙන් සිල්ලර මිල ගණන් රැස් කිරීමද දෛනික පදනමින් සිදු කෙරිණි. මෙසේ රැස් කර ගන්නා ලද තොරතුරු ගොවීන්ට, වෙළෙඳුන්ට සහ පාරිභෝගිකයන්ට ලබා දීමේ අරමුණෙන් යුතුව දිනපතා මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. මීට අමතරව මෙම දත්ත රජයට සහ පෞද්ගලික අංශයෙහි ආයතනවලට ද සපයනු ලැබේ.

## ජාතික ගිණුම්

ජාතික ආදායම් ගිණුම් ඇස්තමේන්තු කටයුතු දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කරගෙන යන ලදී. මීට ප්‍රාථමික හා ද්විතියික දත්ත එකතු කිරීම සහ ගණනය

කිරීම ඇතුළත් විය. නිෂ්පාදනය හා එකතු කළ වටිනාකම්වල මෑත කාලයේදී සිදු වූ ව්‍යුහාත්මක වෙනස්වීම් හඳුනා ගැනීමෙහි අරමුණින් යුතුව ජාතික ගිණුම් ගණනය කිරීම සඳහා දනට භාවිතා කරන ලද 1982 පදනම් වසර 1996 පදනම් වසර ලෙස වෙනස් කර ඇත. මෙතෙක් ජාතික ගිණුම් සැකසීමේදී මූලික වශයෙන් යොද ගත් නිෂ්පාදන ගිණුම්වලට අමතරව ආදයම් උත්පාදන ගිණුම් ද (Generation of Income Accounts) නව පදනම් වසර යටතේ වැඩි දියුණු කිරීමට අවශ්‍ය වූ බැවින් ප්‍රාථමික හා ද්වීතියික මූලාශ්‍රයන් හි තෝරා ගත් අංශ කිහිපයක විස්තරාත්මක තොරතුරුවල ප්‍රසාරණයක් කිරීමට අදහස් කෙරේ. ජාතික ගිණුම් ක්‍රමය - 1993 (System of Narional Accounts) විසින් යෝජිත සංශෝධනයන්ට අනුරූප වීම මෙම සංවර්ධනයන්ගේ මූලික අභිමතාර්ථය විය.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව 1998 වර්ෂය තුළදී කාර්තුමය ජාතික ආදයම් සැකසීමේ අභ්‍යාසය සම්පූර්ණ කිරීමට සමත් විය. 1998 වර්ෂයේ පළමුවැනි, දෙවැනි හා තුන්වෙනි කාර්තු සඳහා ජාතික ආදයම් ඇස්තමේන්තු 1996 සහ 1997 වර්ෂවල අනුරූප කාර්තුවල ඇස්තමේන්තුත් සමඟ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් කාර්තුව අවසන් වී තුන් මාසයක කාලයක් ඇතුළත මුද්‍රිත හා විද්‍යුත් සංනිවේදන මාධ්‍යය සහ ශ්‍රී ලංකා මහ බැංකු මාසික විවරණිකාවන් මඟින් ප්‍රකාශයට පත් කෙරිණි. මින් සාර්ව ආර්ථික වැදගත්කමකින් යුතු තොරතුරු කාලීනව ලබා දීම මෙහිදී අවධාරණය කෙරිණි. මීට පෙර, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සකසන ලද ජාතික ආදයම් සංඛ්‍යා, වාර්ෂික ඇස්තමේන්තුවලට පමණක් සීමා විය. වර්තමාන ආර්ථික තත්ත්වය පිළිබඳ වඩාත් හොඳ අවබෝධයක් කාර්තුමය ජාතික ආදයම් ඇස්තමේන්තු මඟින් සැපයෙන අතර, පෙරදී කිසියම් වර්ෂයක ජාතික ආදයම් තත්ත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඊළඟ වර්ෂයේ දෙවන කාර්තුව වනතුරු සිටීමට සිදු විය. ආර්ථිකයෙහි වර්තමාන ප්‍රවනතාවන් පිළිබඳ තොරතුරු වඩාත් කලින් ලැබීම නිසා පෞද්ගලික අංශයට සහ රජයට, අළුතින් මතු වන යම් යම් සිද්ධීන් හා ගැටළුවලට වඩා හොඳින් ප්‍රතික්‍රියා කළහැකි අතර, අවශ්‍ය විටෙක කිසියම් විසඳීමක් සැලසීම සඳහා ද මැදිහත් විය හැකි වෙයි.

## ප්‍රකාශන

දෙපාර්තමේන්තුව විසින් "ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික දත්ත" සහ "ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංඛ්‍යාන" යන වාර්ෂික ප්‍රකාශනයන් දෙක පළ කරනු ලැබීය. මෙම ප්‍රකාශන මඟින් ශ්‍රී ලංකාවේ ජන විකාශන, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය, ජාතික ආදයම හා වියදම, කෘෂිකර්මය, කර්මාන්ත, විදේශ වෙළෙඳම හා මුදල්, මිල හා වැටුප්, බැංකු කටයුතු, ප්‍රාග්ධන වෙළෙඳපොළ, රාජ්‍ය මූල්‍ය සහ සමාජ ආර්ථික සේවාවන් ඇතුළු විවිධ සමාජ ආර්ථික විචල්‍යයන්ට අදළ විස්තරාත්මක කාල ශ්‍රේණි හා හරස්කඩ දත්ත ඉදිරිපත් කෙරේ. ප්‍රාදේශීය ආර්ථික ප්‍රජාවන් පිළිබඳ සංසන්දනාත්මක සංඛ්‍යා තොරතුරු ද මෙම ප්‍රකාශනයන්හි ඇතුළත් වේ. එසේම මහ බැංකුවේ වෙනත් ප්‍රකාශනයන් කිහිපයක් සඳහා ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව දයක විය.

## තොරතුරු තාක්ෂණ

දෙපාර්තමේන්තුවෙන් සිදු කෙරෙන වර්තමාන කාර්යයන් වඩා හොඳින් නිරූපනය වන ලෙසට දත්ත සැකසුම් දෙපාර්තමේන්තුව තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව (තො.තා.දෙ.) යයි 1998 අප්‍රියෙල් මාසයේදී නැවත නම් කරන ලදී. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විමසුමට ලක්වෙන වර්ෂය තුළදී තම පැරණි කාර්යයන් සියල්ල නව ඒ.එස් 400 පසුබිමට මාරුකිරීමේ කටයුතු අවසන් කළේය.

1996 ජනවාරි මාසයේ සිදුවූ බෝම්බ ප්‍රහාරයෙන් පසුව දෙපාර්තමේන්තුව, බැංකු සේවකයින්ගේ වැටුප් ගෙවීමේ කටයුතු හා වෙනත් කටයුතු සඳහා ජන සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය උපයෝගීකරගත් අතර සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙනයාම සඳහා පරිගණක පද්ධතියක් කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක තාක්ෂණ ආයතනයේ පිහිටුවන ලදී. මේවායින් සිදු කෙරුණ සියළු කටයුතු ඒ.එස් 400 පසුබිමට මාරු කරනු ලැබූ අතර මේ ආයතන දෙකෙහි කටයුතු කිරීමද අවසන් කරන ලදී.

සේවක අර්ථසාධක අරමුදලේ කටයුතු සඳහා භාවිතා කරන ලද සියළු පරිගණක සැලසුම් වඩා ක්‍රියාකාරීත්වයෙන් යුක්තවන ලෙසට හා වර්ෂ 2000 දී කටයුතු කිරීමට අවශ්‍ය වන ඉලක්කම් හතරකින් වර්ෂය දක්වෙන ලෙසට, ඒ.එස් 400 පසුබිම යටතේ නැවතත් ලියා සකස් කරණ ලදී. මෙම පසුබිම යටතේ දෙපාර්තමේන්තුවේ විවිධ අංශවල සවි කරන ලද පරිගණක පර්යන්ත උපයෝගී කරගනිමින් කම්කරු දෙපාර්තමේන්තුවට තොරතුරු විමසීමේ පහසුකම් සලසා දෙනු ලැබූ අතර, එමගින් දිස්ත්‍රික් කම්කරු කාර්යාල කිහිපයක්ද සම්බන්ධ කිරීමට පරීක්ෂණ පවත්වා ඇත. ක්‍රියාත්මක කරන ලද නව ක්‍රම මගින් සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ සිදු කෙරෙන කටයුතුවල වර්ධනයක් ඇති කිරීමට හැකි වී තිබේ. මේ නිසා ලබන වර්ෂයේදී අරමුදලේ සාමාජිකයින්ගේ වාර්ෂික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම වඩා ඉක්මනින් සිදු කෙරෙනු ඇත. මෙතෙක් ලිපි ලේඛන භාවිතයෙන් ක්‍රියාත්මක වූ සේව්‍යයින්ගේ දයක මුදල් එකතු කිරීමේ ක්‍රමය වෙනුවට ඩිස්කට් භාවිතා කරමින් කෙරෙන උප පද්ධතියක්ද සකස් කර තිබේ. බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වූ 50 වෙනි නිදහස් සමරු උළෙලේදී, සේවකයින්ට, ප්‍රදර්ශන භූමියේ සිට තමන්ගේ 1996 වාර්ෂික ගිණුම් ප්‍රකාශ ලබාගැනීමට පහසුකම් සලසා දෙන ලදී.

සංනිවේදන තාක්ෂණය උපයෝගී කරගනිමින් මහ බැංකුව, වාණිජ බැංකු හා ප්‍රාථමික ගණුදෙනුකරුවන් සමග සම්බන්ධ කිරීමට යොදගත හැකි පරිගණක යෙදුම් සංවර්ධනය කරන ලදී. බැංකු ක්ෂෙත්‍රයේ පවතින ද්‍රවශීලතාවය මැන ගැනීමට හැකිවෙන පරිදි මෙම පරිගණක යෙදුම් උපයෝගී කරගනිමින් සෑම බැංකුවක්ම තමන්ගේ ද්‍රවශීලතා

ප්‍රමාණයන් සෑම උදෑසනකම මහ බැංකුව වෙත දනුම් දෙනු ලැබේ. මෙම සම්බන්ධතාවය භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රාථමික වෙන්දේසියේ ලංසු තැබීම් දනුම්දීම සඳහා ද භාවිතා කරන ලදී. බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ සිදු කෙරෙන කාර්යයන් ස්වයංක්‍රීය කිරීම සඳහා නව පරිගණක සැළසුමක් සකස්කර තිබේ.

විමර්ශනයට ලක්වෙන වර්ෂය තුළදී කාර්යාල කටයුතු ස්වයංක්‍රීය කිරීම සඳහා මහා පරිමාණ නවීකරණ ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ප්‍රථම අදියර යටතේ. ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි පෞද්ගලික පරිගණක 125 හා සර්වර් 10 ක් සවිකර, සමීප පරිගණක ජාල 10 ක් සකස්වෙන පරිදි ඒවා එකිනෙකට සම්බන්ධ කරන ලදී. අළුතෙන් ගොඩනගන හා අළුත්වැඩියා කෙරෙමින් පවතින ගොඩනැගිලි දෙකට ඒමෙන් පසුව ෆයිබර් ඔප්ටික් නාරටියක් මගින් මේ සමීප පරිගණක ජාල සියල්ල සම්බන්ධ කර එක් විශාල සමීප පරිගණක ජාලයක් සකස්වෙන පරිදි මෙහි දෙවෙනි අදියර ආරම්භ කරනු ඇත.

තත්කාල දළ පියවුම් ගෙවුම් ක්‍රමය නම් වූ මහා ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීමේ කටයුත්තකට බැංකුව සම්බන්ධ වී සිටී. මෙහි පළමු පියවර වශයෙන් ලෝක බැංකු මූල්‍ය ආධාර යටතේ ඕස්ට්‍රේලියාවේ ප්‍රයිස්වෝටර්හවුස් කූපර්ස් ආයතනය විසින් බැංකු කටයුතු ස්වයංකරණය හා රජයේ ණය සුරැකුම් වෙළඳපල පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ බැංකුවලට නවීන ගෙවුම් ක්‍රමයක් හඳුන්වාදීමට හැකිවෙනු ඇත. වර්ෂ 2000 අග භාගයේදී මේ නව ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් මහ බැංකුවේ හා බැංකු හා මූල්‍ය අංශයේ කටයුතු වර්ෂ 2000 ට සම්පූර්ණයෙන් අනුකූල කිරීමේ කාර්යයන් ක්‍රියාත්මක වෙමින් පවතී. නිශ්කාෂණය හා පියවීම් ක්‍රමයද ඇතුලත් වෙන අත්‍යවශ්‍ය මහ බැංකු කටයුතු සියල්ල සඳහා පිළියම් ඉදිරිපත් කර ඇති අතර එම පිළියම්වල අත්හද බැලීමේ කටයුතු ද අවසන්කර තිබේ. වෙනත් දෙපාර්තමේන්තුවල ක්‍රියාත්මක වෙන සුළු ප්‍රමාණයේ පරිගණක යෙදුම් පරීක්ෂා කිරීම දන් අවසන් කෙරෙමින් පවතී. වෙළඳ බැංකු 32 හි ක්‍රියාත්මක වෙන වර්ෂ 2000 ව්‍යාපෘති කටයුතු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී කරගෙන යනු ඇත.

## ශ්‍රී ලංකා ස්වයංකෘත චෙක්පත් නිශ්කාෂණාගාරය

ශ්‍රී ලංකා ස්වයංකෘත චෙක්පත් නිශ්කාෂණාගාරය සිය කටයුතු සුපුරුදු පරිදි පවත්වාගෙන යන ලදී. හරපත් හා බැරපත් වැනි වෙනත් ගෙවුම් උපකරණ හඳුන්වාදෙනු ලැබුවද නිශ්කාෂණය කරන ලද චෙක්පත් ප්‍රමාණය වසරක් පාසා වැඩිවෙමින් පවතී. 1998 වර්ෂයේදී නිශ්කාෂණය කරන ලද චෙක්පත් ප්‍රමාණය සියයට 7 කින් වැඩිවෙමින් අයිතම 31,356,490 සංඛ්‍යාවක් දක්වා ළඟාවිය. දිනපතා සාමාන්‍යයෙන් චෙක්පත් 131,750 ක් නිශ්කාෂණය කරන ලදී.

ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය (ස්ලිප්ස්) වඩා ව්‍යාප්ත ලෙස භාවිතා කෙරෙමින් පවතී. මේ මගින් දිනකට සිදු කෙරෙන ගණුදෙනු ප්‍රමාණය 1000 සිට 12,000 දක්වා වූ පරාසයක රැඳී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුව සිය සේවකයන්ගේ වැටුප් හා වෙනත් ගෙවීම් සිදුකිරීම සඳහා ද මෙම ක්‍රමය භාවිතා කිරීමට පටන් ගන්නා ලදී.

ශ්‍රී ලංකා ස්වයංකෘත චෙක්පත් නිශ්කාෂණාගාරය සඳහා උපස්ථ නිශ්කාෂණාගාරයක් පිහිටුවීම සඳහා ටෙන්ඩරය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙය 1999 වර්ෂයේදී ස්ථාපනය කෙරෙනු ඇත.

## පුහුණු වැඩ කටයුතු

මහ බැංකුව සිය නිලධාරීන් අධ්‍යයන සහ අනධ්‍යයන ක්ෂේත්‍රවල පුහුණු කිරීමේ ප්‍රතිපත්තිය සලකා බැලෙන වර්ෂය තුළදී ද තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. අධ්‍යයන පුහුණු කිරීම පිළිගත් විදේශීය විශ්ව විද්‍යාලවල ආර්ථික විද්‍යාව සහ ඒ හා සම්බන්ධ වෙනත් ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි අධ්‍යයනයන්ට අදළ විය. වර්ෂය තුළදී නිලධාරීන් 6 දෙනෙක් ආර්ථික විද්‍යා ක්ෂේත්‍රවල ශාස්ත්‍රපති උපාධි පාඨමාලා හැදෑරීම සඳහා විදේශගත විය. එක් නිලධාරියෙක් ඉන්දියාවේ ජාත්‍යන්තර සංඛ්‍යාන අධ්‍යාපන මධ්‍යස්ථානයෙහි සංඛ්‍යාන විද්‍යා පාඨමාලාවක් හැදෑරීය.

1998 දෙසැම්බර් මස 31 දිනට විදේශ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා නිලධාරීන් 16 දෙනෙක් නියුක්ත වී සිටියහ. ඉන් 4 දෙනෙක් ආචාර්ය උපාධි සඳහා වූ අතර, 12 දෙනෙක් ශාස්ත්‍රපති උපාධි කටයුතු සඳහා නියැළුනි. වර්ෂය තුළදී නිලධාරීන් 9 දෙනෙක් පශ්චාත් උපාධි අධ්‍යයනය අවසන් කර පැමිණියහ.

දේශීය සහ විදේශීය කෙටිකාලීන පාඨමාලා සම්මන්ත්‍රණ සහ වැඩමුළු වලින් සමන්විත වූ අනධ්‍යයන පුහුණු කිරීම් බැංකුවේ වැඩ කටයුතුවලට අදළ විශේෂිත ක්ෂේත්‍ර හා සම්බන්ධ ඒවා විය. 1998 වර්ෂය තුළදී නිලධාරීන් 90 දෙනෙක් කෙටිකාලීන විවිධ පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා එතෙර ගියහ. එම වර්ෂය තුළදී නිලධාරීන් 322 දෙනෙක් මහ බැංකුවේ ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය මගින් පවත්වන ලද පාඨමාලා 42 වෙනුවෙන් සහභාගී වූ අතර, වෙනත් දේශීය ආයතන විසින් පැවැත්වූ සම්මන්ත්‍රණ සහ වැඩමුළු 33 සඳහා නිලධාරීන් 108 දෙනෙක් සහභාගී විය.

**II-24 සංඛ්‍යා සටහන**

| වර්ෂය | පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා පිටත්වූ සංඛ්‍යාව | පශ්චාත් උපාධි අධ්‍යයනයෙන් පසු පැමිණි සංඛ්‍යාව | 1998 දෙසැම්බර් 31 දිනට පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නියුක්ත සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | ආචාර්ය | විද්‍යාපති/ශාස්ත්‍රපති |
| 1997 | 06 | 07 | 05 | 12 |
| 1998 | 06 | 09 | 04 | 12 |

පුහුණු වැඩ කටයුතු දෙපාර්තමේන්තුව විසින් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වීමට අපේක්ෂිත නිලධාරීන් සඳහා ආර්ථික විද්‍යාව සහ ගණිතය විෂයයන් පිළිබඳ පුහුණු පංති පවත්වන ලදී. මෙම දෙපාර්තමේන්තුව විසින් සාමාන්‍යයෙන් පවත්වනු ලබන සමහර සේවක ඛණ්ඩයන් සඳහා උසස් කිරීම සඳහා පරීක්ෂණ ද, පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව පිරි නැමීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණ ද තවදුරටත් පවත්වන ලදී.

## කළමනාකාරිත්ව විගණන

කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව 1998 වර්ෂය තුළදී මහ බැංකුව සඳහා වූ සිය විගණන සැලැස්ම ක්‍රියාත්මක කරන ලද අතර කළමනාකාරිත්වයේ අවශ්‍යතාවය පරිදි විශේෂ අධ්‍යයනයන් කීපයක් ද කරන ලදී.

මහ බැංකුවේ නව ගොඩනැගිල්ල ඉදි කිරීමට සහ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීමට අදාළ සියළුම ගෙවීම්, සේවක අර්ථසාධක අරමුදල් ආපසු ගෙවීම් සහ විශ්‍රාම ගැනීමේ දී හෝ මහ බැංකු සේවය අවසන් කිරීමේදී සේවකයන්ට කරනු ලැබූ ගෙවීම් පෙර විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිෂ්කාශන මධ්‍යස්ථානයේ මාසික හා වාර්ෂික ගිණුම්ද, මහ බැංකුවේ මාතලේ ප්‍රාදේශීය කාර්යාලයේ ගිණුම් හා කාර්යයන්ද අනෙකුත් ප්‍රාදේශීය කාර්යාලයන්හි සහ ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයයේ වියදම්ද පසු විගණනයට ලක් කෙරිණි. තවද, සුභසාධන ගෙවීම් සහ සේවක සුභසාධන ක්‍රමවලට අදල මූල්‍යමය වාර්තාවන්ද පසු විගණනය කරන ලදී.

මහ බැංකුව සතු වත්කම්වල සුරක්ෂිත භාවය සහතික කිරීම් වස් අදාළ කාලච්ඡේදය තුළදී රත්රන් තොග, මුදල් දෙපාර්තමේන්තුවේ සුරක්ෂිතාගාරවල ඇති නෝට්ටු හා කාසි, මුදල් කෞතුකාගාරයේ තොග සහ මහ බැංකුවේ නිවාඩු නිකේතනවල ඇති ලී බඩු සහ උපකරණ පිළිබඳව භෞතික පරීක්ෂණ කරන ලදී. වරින්වර මුදල් කවුන්ටර් සහ දෙපාර්තමේන්තු භාරයේ ඇති සුළු මුදල් ශේෂයන් ද හදිසි පරීක්ෂාවන්ට ලක් කෙරිණි.

මහ බැංකුවේ ඉංග්‍රීසි ලඝු ලේඛකයන් සහ සුළු සේවකයන් විසින් ඉටු කරන කාර්යයන් පිළිබඳව අධ්‍යයන දෙකක් ද වර්ෂය තුළ දී සිදු කරන ලදී. එම කාණ්ඩවලට අයත් සේවක ඌණතා සහ අතිරික්තතා ඇති ස්ථාන හඳුනා ගෙන ඔවුන් කාර්යක්ෂමව ස්ථානගත කිරීම සහ අළුතින් සේවකයින් බඳවා ගැනීමට අවශ්‍යදැයි තීරණය කිරීම මෙම අධ්‍යයනයන්ගේ පරමාර්ථ විය. කළමනාකාරිත්ව කමිටුවේ අවශ්‍යතාවය පරිදි දුරකථන ක්‍රියාකරවන්නියන් සඳහා උසස් කිරීමේ ක්‍රමයක් ද සම්පාදනය කරන ලදී.

ඉහත සඳහන් කරුණුවලට අමතරව බැංකුවේ සම්පත් වල කාර්යක්ෂම උපයෝගීතාවය සහ එහි නීති, රෙගුලාසි සහ අභ්‍යන්තර පාලන ක්‍රමවල ඵලවත් බව සහතික කිරීම් වස්, විගණන සැලැස්මට අනුව, අනෙකුත් දෙපාර්තමේන්තුවල ගිණුම් සහ කාර්යයන් ද විගණනය කරන ලදී.

## පරිශ්‍ර

ශ්‍රී ලංකා මහ බැංකු නව ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු සහ පැරණි ගොඩනැගිල්ලේ පිළිසකර කටයුතු සම්පූර්ණ කරන තෙක්, බැංකුවේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම සඳහා බද්දට ගෙන ඇති පරිශ්‍රයන්හි එදිනෙද නඩත්තු වැඩ කටයුතු හා එහි මූලික අවශ්‍යතා උසස් මට්ටමකින් කරගෙන යාමට අදළ වැඩ කටයුතුවල 1998 වර්ෂය තුළදී පරිශ්‍ර දෙපාර්තමේන්තුව යෙදී සිටින ලදී. මීට අමතරව, කොළඹ මහ නගර සභාවේ එකඟත්වය ඇතිව මහ බැංකු ගොඩනැගිලි සංකීර්ණය ඉදිරිපිට පිහිටා ඇති ඔරලෝසු කණුව නඩත්තු කිරීම් වැඩ කටයුතු පරිශ්‍ර දෙපාර්තමේන්තුව විසින් පවරා ගන්නා ලදී.

## නව ගොඩනැගිලි

1997 නොවැම්බර් මස 18 වැනි දින පිහිටුවන ලද නව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත මහ බැංකු ව්‍යාප්ත ගොඩනැගිලි ව්‍යාපෘතිය සහ මූලස්ථාන ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියට අදළ වැඩ කටයුතු කිරීමේ විශේෂ කාර්ය භාරය පැවරී ඇත.

### මහ බැංකු මූලස්ථාන ගොඩනැගිල්ල සඳහා වූ ව්‍යාප්ත ගොඩනැගිල්ල

1994 අගෝස්තු මස ආරම්භ වූ මෙම ව්‍යාපෘතියට අදළ ඉදි කිරීම් කටයුතු 1998 වර්ෂයේදී තවදුරටත් සිදු වෙමින් පැවතිණ. එසේ වුවද, ඉදි කිරීම් කටයුතු සඳහා බිම කැනීමේදී මුහුණ දීමට සිදු වූ අනපේක්ෂිත තත්ත්වයන්, ආරක්ෂක හේතුන් නිසා සිදු වූ වැඩ කටයුතු අත්හිටවීම්, සැලසුම් වෙනස් කිරීම්, කොළඹ කොටුව ප්‍රදේශය තුළ බර වාහන ප්‍රවාහනය පාලනය කිරීම් සහ 1996 ජනවාරි මස 31 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයත් නිසා ඉදි කිරීම් කටයුතු තාවකාලිකව අත්හිටුවීම් ආදී කරුණු හේතුකොට ගෙන මෙම ව්‍යාපෘතියට අදළ වැඩ කටයුතුවල ප්‍රගතියෙහි සැහෙන අඩාල වීමක් ඇති විය. 1997 සහ 1998 වර්ෂ තුළදී ඉදි කිරීම් කටයුතු බාධාවකින් තොරව සිදු වූ අතර, 1998 වර්ෂය අවසානය වනවිට, ගොඩනැගිල්ලේ ව්‍යුහයේ ඉදි කිරීම් කටයුතු සම්පූර්ණයෙන්ද, ගෘහ නිර්මාණාත්මක නිම කිරීම් වලින් සියයට 60 ක් පමණ, යාන්ත්‍රික හා විදුලි කාර්යයන්ගෙන් සියයට 80 ක් පමණ සහ ව්‍යාපෘතියට අදළ සමස්ථ කාර්යයන්ගෙන් සියයට 80 ක් පමණද නිම වී පැවතිණ.

මෙම ව්‍යාපෘතියට අදළ සියළු වැඩ කටයුතු 1999 අප්‍රේල් මස අවසානය වනවිට නිම කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. එම ගොඩනැගිල්ල තනා නිම වූ පසු, දැනට කුලී පදනම මත ස්ථානගත කොට තිබෙන දෙපාර්තමේන්තු බොහොමයක් නව ගොඩනැගිල්ල වෙත ගෙන යාමට හැකි වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### ආපදවට පත් වූ මූලස්ථාන ගොඩනැගිල්ල

ආපදවට පත් වූ මහ බැංකු මූලස්ථාන ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීමේ කටයුතු 1997 දෙසැම්බර් මස ආරම්භ

වූ අතර, 1998 වර්ෂය මුළුල්ලේම එම කාර්යයන් බාධාවකින් තොරව සිදු විණි. එසේ වුවද, පහත දක්වෙන හේතූන් නිසා එම වැඩ කටයුතුවල ප්‍රගතියෙහි සැලකිය යුතු අඩාල වීමක් දක්නට ලැබිණ.

(අ) කොන්ත්‍රාත්තුව මත පැවරී ඇති කාර්යයන් අනුව, ගොඩනැගිල්ලේ තිබූ කපරාරුව සහ අනෙකුත් ආවරණ ඉවත් කිරීමේදී දක්නට ලැබුණු මළ බැඳීම් නිසා වූ හානි සහ ව්‍යුහාත්මක දුර්වලතාවයන් යථා තත්ත්වයට පත් කිරීම පිණිස අළුත්වැඩියා සහ වෙනස් කිරීම් කටයුතු දැඩි ලෙස කිරීමට සිදුවිය. මෙවැනි හානි සිදු වී ඇති බැව්, ටෙන්ඩරය භාර ගන්නා අවස්ථාවේදී දැන ගන්නට නොතිබුණි.

(ආ) ගොඩනැගිලි දෙක සඳහා සැලසිය යුතු ගිණි සහ ආරක්ෂක ක්‍රම සහ සේවා කටයුතු සම්බන්ධීකරණය හේතුකොටගෙන, පසුව ඇති කිරීමට සිදු වූ නිර්මාණාත්මක වෙනස් කිරීම් කටයුතු.

1998 අවසානය වනවිට ව්‍යාපෘතියට අදළ ප්‍රධාන ක්ෂේත්‍රයන්හි පහත දක්වෙන ප්‍රගතිය දක්නට ලැබිණ.

(අ) කඩා ඉවත් කිරීමේ කටයුතු - සියයට 100 ක් නිමවිය.

(ආ) අළුත්වැඩියා කටයුතු - සියයට 95 ක් නිමවිය.

(ඇ) නව කොන්ක්‍රීට් වැඩ - සියයට 85 ක් නිමවිය.

(ඈ) නිම කිරීමේ කාර්යයන් - සියයට 65 ක් නිමවිය.

(ඉ) සමස්ත කාර්යයන් - සියයට 30 ක් නිමවිය.

ඊට අමතරව, ජනෙල් සවිකිරීම්, අභ්‍යන්තර සහ බාහිර කපරාරු වැඩ සහ යාන්ත්‍රික, විදුලි වැඩ කටයුතුවලට අදළ කාර්යයන් ද සිදු වෙමින් පැවතිණ.

ගොඩනැගිල්ලෙහි ප්‍රතිසංස්කරණ වැඩ කටයුතු, 1999 අගෝස්තු මස අවසානය වනවිට නිම කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## සුභසාධන

1998 වසරේදීත් සුභසාධන දෙපාර්තමේන්තුව මහ බැංකු සේවකයන්ගේ සුභසාධනය සඳහා සුභසාධන ක්‍රම ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. මෙයට සහනදායී පොලියක් මත දෙනු ලබන නිවාස ණය, කාර්ය මණ්ඩල සුභසාධන ණය, වාහන ණය හා අර්ථසාධක අරමුදල් ණය අඩංගු වූ අතර, මීට අමතරව කාර්ය මණ්ඩලයේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම, බැංකුව තුළම වෛද්‍ය සායනයක් පවත්වාගෙන යාම, සහනදායී මිල ක්‍රමයක් මත ආපනශාලා පහසුකම් පවත්වාගෙන යාම, සහනදායී මිලකට දුම්රිය හා බස් වාර ප්‍රවේශ පත්‍ර ලබා දීමද අඩංගුය. මීට අමතරව 1996 දී මහ බැංකුව ඉදිරිපිට පිපිරවූ බෝම්බයෙන් තුවාල ලත් මහ බැංකු සේවකයන් වෙත සපයනලද සහන සැලසුම් එලෙසම ක්‍රියාත්මක විය. මහ බැංකුවේ දෙපාර්තමේන්තු, ස්ථාන ගණනාවක ක්‍රියාත්මක වන හෙයින් සැපයිය හැකිව තිබූ ආපනශාලා පහසුකම් සීමාසහිත විය.

පෙර වසරේදී හඳුන්වා දුන් සුභසාධන ණය ඒකාබද්ධ කිරීම හා ප්‍රතිව්‍යුහගත කිරීම මෙම වසරේදී ද ක්‍රියාත්මක වූ අතර, ඉඩම් සහ ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ඉහළ යාම සැළකිල්ලට ගනිමින් නිවසක් සාද ගැනීම සඳහා සේවා නියුක්තයන් වෙත සපයන ලද නිවාස ණය රුපියල් 7,50,000/- සිට රුපියල් 15,00,000/- දක්වා වැඩි කළ අතර, නිවාස ණය අංශයේ වැඩ පහසු කිරීම සඳහා නිවාස ණය සඳහා සියයට 3.8 ක සමාන තලයක් මත පොලිය අය කිරීම ආරම්භ කරන ලදී. මහ බැංකු වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ කරනු ලබන ගෙවීම් සියල්ලක්ම පරිගණකගත කරන ලද අතර, ගෙවීම් ඉක්මන් කිරීමටත්, පිරිවැය අඩු කිරීමටත් හේතු වන ආකාරයෙන් වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීම ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය හරහා සිදු කරන ලදී.

මෙසේ හඳුන්වා දෙන ලද පරිගණකගත කරන ලද ගිණුම් ක්‍රමයකට සහ සරලකරණී කරන ලද ගෙවීම් ක්‍රමය සේවක ඵලදයිතා මට්ටම විශාල ප්‍රමාණයකින් වැඩි කිරීමටත්, අතිකාල දීමනා ගෙවීම් අවම කර ගැනීමටත් ඉවහල් විය.

## ආරක්ෂක සේවා

### සේවයේ යෙදවීම්

ආරක්ෂක නිලධාරීන් පහත සඳහන් ස්ථානයන්හි සේවයේ යොදවන ලදී.

1. ලෝක වෙළෙඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ බටහිර කුළුණේ 26 - 35 දක්වා මහල්.
2. චාර්ටර්ඩ් බැංකුවේ මහා භාණ්ඩාගාර ගොඩනැගිල්ලේ සහ පැරණි ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ යටි මහලේ පිහිටි ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව.
3. රේණුකා ගොඩනැගිල්ල හා ඉක්විටි වූ ගොඩනැගිල්ල.
4. හේමචන්ද්‍ර ගොඩනැගිල්ලේ පිහිටි බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව.
5. ලෝටස් පාරෙහි පිහිටි මහජන බැංකු රථ ගාල.
6. මාතර සහ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල.
7. 50 වෙනි නිදහස් සමරු උත්සවය වෙනුවෙන් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවති ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රදර්ශන කුටි සඳහා නොකඩවා විශේෂ ආරක්ෂාව සැපයීම.

ආරක්ෂක නිලධාරීන් විසින් ප්‍රාදේශීය කාර්යාලවලට, බ්‍රිස්ටල් වීදියේ පිහිටි මුදල් කවුන්ටර් වලට සහ භාණ්ඩාගාර ගොඩනැගිල්ලේ පිහිටි මුදල් කවුන්ටර් වලට මුදල් ප්‍රවාහනය කිරීමේදී අවශ්‍ය ආරක්ෂක නිලධාරි සේවා සපයන ලදී.

### පුහුණු කිරීම්

ආරක්ෂක කාර්ය මණ්ඩලයට දැනුම ප්‍රතිපෝෂණය කිරීමේ පහත සඳහන් පුහුණුවීම් ලබා දෙන ලදී.

1. ආරක්ෂක නිලධාරීන්ගේ කාර්ය හා වගකීම්
2. ගිනි නිවන උපකරණ පරිහරණය කිරීම
3. ප්‍රථමාධාර
4. අවි ආයුධ පරිහරණය
5. වෙඩි තැබීම

මීට අමතරව රජයේ ආරක්ෂක සේවා සහ බුද්ධි අංශය සමග ඒකාබද්ධව ආරක්ෂක විධිවිධාන සපයන ලදී. නව මහ බැංකු ව්‍යාපෘත ගොඩනැගිල්ලට ආරක්ෂක තර්ජන පැවැති හෙයින් දැඩි ආරක්ෂක විධිවිධාන සහිතව මෙම වැඩබිමට ගොඩනැගිලි ද්‍රව්‍ය හා ජලය ප්‍රවාහනය කිරීම සඳහා නව වැඩපිළිවෙලක් යොදන ලදී.

## කාර්ය මණ්ඩල පුවත්

ආයතන දෙපාර්තමේන්තුව සිය දර්ශනය සාක්ෂාත් කර ගැනීම අරමුණු කොටගෙන තම කාර්යභාර වගකීම් පැහැදිලිව අවබෝධ කර ගනිමින් ඒවා කාර්යක්ෂමව හා ඵලදායී අන්දමින් ඉටු කිරීමටත්, මතු විය හැකි අවශ්‍යතාවයන්ට හා අභියෝගයන්ට නොපැකිලව මුහුණ දීමටත් හැකි, සිය හැකියාවන් නියමාකාරයෙන් වර්ධනය කර ගන්නා දක්ෂ හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් පවත්වා ගෙන යාම සඳහා 1998 වර්ෂය තුළදීත් සිය කාර්යයන් වන බඳවා ගැනීම්, පත් කිරීම්, උසස් කිරීම්, විශ්‍රාම යාම් ඇතුළු අනෙකුත් අදාල කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

1998 වර්ෂය තුළදී මාණ්ඩලික නිලධාරීන් 16 දෙනෙක් සහ උසාවි ලිපිකරුවකු ඇතුළුව ලිපිකරුවන් 23 දෙනෙකු බැංකු සේවාවට බඳවා ගන්නා ලදී. විනිමය පාලන රෙගුලාසි උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් වූ විශේෂ විමර්ශන කටයුතු සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුවට කොන්ත්‍රාත් පදනමක් මත විමර්ශණ නිලධාරියෙකු ද පත් කරන ලදී.

නීති, ගණකාධිකරණ, බැංකු හා මූල්‍ය සේවා යන අංශ සඳහා වූ උපදේශක මණ්ඩලයට කම්කරු, ආර්ථික හා රාජ්‍ය මූල්‍ය කටයුතු යන ක්ෂේත්‍ර සඳහා ද තවත් උපදේශකවරු 4 දෙනෙකු පත් කරමින් බැංකු උපදේශක මණ්ඩලය තවදුරටත් පුළුල් කර උපදේශක මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව 08 ක් දක්වා වැඩි කරන ලදී. මෙම උපදේශකයන් ඔවුන්ට අදල ක්ෂේත්‍රයන්හි පවරනු ලබන විශේෂ කාර්යයන්හි තවදුරටත් නිරත විය.

දත්ත සැකසුම් දෙපාර්තමේන්තුව, "තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව" (1998 අප්‍රේල් මස 07 දින සිට) වශයෙන් ද ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය, "බැංකු අධ්‍යයන කේන්ද්‍රය" (1998 දෙසැම්බර් මස 21 දින සිට) වශයෙන් ද 1998 වර්ෂයේ දී නැවත නම් කරන ලදී.

වර්ෂය තුළදී දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානීන් සඳහා ප්‍රථම වතාවට වැඩමුළු 2 ක් මෙම දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන ලදී. පළමු වැඩමුළුව 1998 අගෝස්තු මස 08 සහ 09 දින දෙක තුළ ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේදී පවත්වන ලද අතර, දෙවන වැඩමුළුව 1998 ඔක්තෝබර් මස 17 හා 18 යන දිනයන්හි වාද්දුව "බ්ලූ වෝටර්" හෝටලයේදී පවත්වන ලදී. මෙම වැඩමුළු මගින්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට හා අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඔවුන්ගේ දෙපාර්තමේන්තුවල කටයුතු හා කාර්ය වැඩපිළිවෙල පිළිබඳ සාකච්ඡා කිරීමට හා අනාගත ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ අවස්ථාව සැලසුනි.

1997 වර්ෂය අවසානය තෙක් පැවති රහස්‍ය වාර්තා ලකුණු කිරීමේ ක්‍රමය වෙනුවට නව කාර්ය සාධන ඇගයීම් ක්‍රමයක් මෙම වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව මගින් හඳුන්වා දෙන ලදී. පෙර පැවති ක්‍රමයේ මුල් බැස ගත් දුර්වලතාවයන් වන පෞද්ගලික අගතීන් හා පෞද්ගලික ගුණාංගවලට මුල් තැන දෙමින් සේවකයාගේ කාර්ය සාධනය දෙවන තැනෙහිලා ගැනුනු ක්‍රමයට හාත්පසින්ම වෙනස් වූ නව ක්‍රමය 1998 සිට ක්‍රියාත්මක විය. නව කාර්ය සාධන ඇගයීම් ක්‍රමය වර්ධනයට යොමු වූ ක්‍රමයක් වන අතර සේවකයා වෙත පවරනු ලබන වැඩ කටයුතු හා දෙනු ලබන ඉලක්කයන් සළකා බලමින් එම සේවකයා විසින් එම වැඩ කටයුතු හා ඉලක්කයන් සපුරාලනු ලබන ප්‍රමාණය මත සේවක ඇගයීම් අවධාරණය කරනු ලබන ක්‍රමයකි.

බැංකු සේවකයන් අතර ඵලදායීතාව වැඩි කිරීම අරමුණු කොටගෙන 1998 වර්ෂය තුළදී මෙම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලැබූ තවත් නව අදහසක් වූයේ "විශිෂ්ට මහ බැංකු සේවකයා" තෝරා ගැනීමය.

අධිපති ඒ.එස්.ජයවර්ධන මහතා 1998 වර්ෂය තුළදී පහත දැක්වෙන රැස්වීම් සඳහා සහභාගී විය:

1. 1998 පෙබරවාරි 7 සිට 9 දක්වා වෙනිසියුලාවේ කරකස් නගරයේ පැවැත්වුණු 24 කණ්ඩායමේ අති විශේෂ අමාත්‍ය රැස්වීම හා 1998 පෙබරවාරි 13 සිට 15 දක්වා ඉන්දුනීසියාවේ බාලි නගරයේ පැවැත්වුණු සියැසන් මහ බැංකු අධිපති වරුන්ගේ වාර්ෂික සම්මන්ත්‍රණය.
2. 1998 අප්‍රේල් 13 සිට 17 දක්වා ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී.සී. නගරයේ පැවැත්වුණු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකු 1998 වසන්ත රැස්වීම්, 1998 අප්‍රේල් 21 සිට 27 දක්වා එක්සත් රාජධානියේ ලන්ඩන්හි පැවැත්වුණු ශ්‍රී ලංකා සම්මන්ත්‍රණය හා අනෙකුත් රැස්වීම්, 1998 අප්‍රේල් 29 සිට මැයි 01 දක්වා ස්විට්සර්ලන්තයේ ජිනීවා නගරයේ පැවැත්වුණු ආසියානු සංවර්ධන බැංකුවේ අධිපති මණ්ඩලයේ වාර්ෂික රැස්වීම සහ 1998 මැයි 04 දින සිංගප්පූරුවේ පැවැත්වුණු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සිංගප්පූරු ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේ සම්මන්ත්‍රණය.
3. 1998 මැයි 21 සිට 22 දක්වා පාකිස්ථානයේ කරච්චි නගරයේ පැවැත්වුණු ආසියානු නිෂ්කාශන සංගමයේ 27 වන රැස්වීම හා 1998 මැයි 26 සිට 27 දක්වා ප්‍රංශයේ පැරිස් නගරයේ පැවැත්වුණු ශ්‍රී ලංකා ආධාර කණ්ඩායමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම.
4. 1998 ජුනි 03 දින එක්සත් රාජධානියේ ලන්ඩන් නගරයේ පැවැත්වුණු බැංකු කටයුතු හා මූල්‍යකරණ පිළිබඳ පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුව සහ 1998 ජුනි 04 සිට 05 දක්වා පැවැත්වුණු මහ බැංකු අධිපතිවරුන්ගේ සමුළුව, 1998 ජුනි 06 සිට 08 දක්වා

පැවැත්වුණු ජාත්‍යන්තර ගණුදෙනු පියවීමේ බැංකුවේ වාර්ෂික මහා සභාව සහ 1998 ජූනි 09 ස්විට්සර්ලන්තයේ සූරිච් නගරයේ පැවැත්වුණු බැංකුකරුවන් සමඟ රැස්වීම.

5. 1998 සැප්තැම්බර් 30 දින ඉන්දියාවේ හයිදරාබාද් නගරයේ පැවැත්වුණු දකුණු ආසියානු විදේශ විනිමය හුවමාරු කරුවන්ගේ සම්මන්ත්‍රණය සහ ඔක්තෝබර් 02 සිට 08 දක්වා ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී.සී. නගරයේ පැවැත්වුණු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකු වාර්ෂික රැස්වීම්.

6. 1998 නොවැම්බර් 19 සිට 22 දක්වා නවසීලන්තයේ වෙලින්ටන් නගරයේ පැවැත්වුණු සියන්සා මහ බැංකු අධිපතිවරුන්ගේ සමුළුව.

### පත්කිරීම්

1. අතිරේක ප්‍රධාන ගණකාධිකාරී ආචාර්ය යූ.විදනපතිරණ 1998 මැයි මස 21 වැනි දින සිට ව්‍යවහාර මුදල් අධිකාරී වශයෙන් පත් කරන ලද අතර, 1998 අගෝස්තු මස 20 වැනි දින සිට අතිරේක රාජ්‍ය ණය අධිකාරී වශයෙන් පත් කරන ලදී.

2. අතිරේක රාජ්‍ය ණය අධිකාරී ජේ.එම්.ටී.බී. ජයසුන්දර මහතා 1998 අගෝස්තු මස 20 වැනි දින සිට ව්‍යවහාර මුදල් අධිකාරී වශයෙන් පත් කරන ලදී.

3. නව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ එම්.අයි.එල්. හමීඩ් මහතා 1998 ඔක්තෝබර් මස 01 වැනි දින සිට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්‍ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ වශයෙන් පත් කරන ලදී.

4. පුහුණු වැඩ කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ සහ පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ටී.එච්.ඩී. පීරිස් මහතා 1998 ඔක්තෝබර් මස 01 වැනි දින සිට පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ සහ නව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ වශයෙන් පත් කරන ලදී.

5. විශේෂ නිලධාරී කේ.සී.එම්.ගුණසේකර මහතා 1998 ඔක්තෝබර් මස 01 වැනි දින සිට පුහුණු වැඩ කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ වශයෙන් පත් කරන ලදී.

6. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්‍ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්‍ෂ පී.ටී. පෙරේරා මහත්මිය 1998 ඔක්තෝබර් මස 09 වැනි දින සිට වැඩ බලන ලේකම් වශයෙන් පත් කරන ලදී.

### විශ්‍රාම ගැනීම්

1. ව්‍යවහාර මුදල් අධිකාරී, ආර්.ජී.ජයරත්න මහතා 1998 මැයි මස 21 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තා ලදී.

2. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්‍ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජේ.ඊ.ඩී. කරුණාරත්න මහතා 1998 ඔක්තෝබර් මස 01 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තා ලදී.

3. විධායක අධ්‍යක්‍ෂ එන්.ඒ.ධර්මබන්දු මහතා 1998 නොවැම්බර් මස 15 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගත්තා ලදී.

### මුද හරිනු ලැබ සිටි නිලධාරීන් (1998.12.31 වැනි දිනට)

1. ආචාර්ය ඩී.ජේ.ජී. ප්‍රනාන්දු මහජන බැංකුවේ සභාපති සහ අධ්‍යක්‍ෂ වශයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත

2. ආචාර්ය පී.බී. ජයසුන්දර භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වශයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත

3. ආචාර්ය ඒ.ජී. කරුණාසේන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විකල්ප විධායක අධ්‍යක්‍ෂ වශයෙන්

4. ආචාර්ය යූ. විදනපතිරණ අධ්‍යක්‍ෂ ජනරාල් (සංවර්ධන) වශයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත

5. එම්.ජේ.එස්. අබේසිංහ මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත

6. ඒ.අබයරත්න මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත

7. ආචාර්ය රාණි ජයමහ (මිය) ලන්ඩනයේ පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය වෙත